# අල්-අඛ්ලාකුල් ඉස්ලාමිය්යා
(ඉස්ලාමීය සාරධර්ම)

ඉස්ලාම් ආගමික (අහදිය්යා අල්කුර්ආන් පාසල්)
අවසන් සහතික පත්‍ර විභාගය සඳහා පෙළ පොත

# Al- Akhlaqul Islammiyya
# (Islamic Ethics)

## Text Book for
**Final Certificate Examination of Islamic Studies**
***(Ahadhiyyah, Al Quran Schools)***

# الأخلاق الإسلامية

**الكتاب المقرر لشهادة الإمتحانات النهائية**
**للمدارس القرآنية والأحدية الإسلامية**

**إصدار: إدارة الشؤون الإسلامية**
**كولومبو-سريلانكا**

**Published by:**
**Department of Muslim Religious and Cultural Affairs,**
**180, T. B. Jayah Mawatha,**
**Colombo 10,**
**Sri Lanka.**



2 * CM 20318

CM 20318 - 1,000 (2015/07)


بسم الله الرحمن الرحيم

| | | |
|---|---|---|
| උපදෙස් හා මගපෙන්වීම | : | **ආචාර්ය එම්. ඒ. එම්. ෂුක්රි,**<br>අධ්‍යක්ෂ,<br>ජාමිආ නළීමියා කලා පීඨය.<br><br>**අෂ්ෂෙයික් ඒ. සී. අගාර් මුහම්මද්**<br>සහකාර අධ්‍යක්ෂ,<br>ජාමිආ නළීමියා කලා පීඨය,<br>සමස්ත ලංකා ජම්ඉයතුල් උලමා සභාව.<br><br>**අෂ්ෂෙයික් වයි. එල්. එම්. නවවි (නළීමි),**<br>හිටපු අධ්‍යක්ෂ,<br>මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු<br>දෙපාර්තමේන්තුව.<br><br>**අෂ්ෂෙයික් එම්. එච්. එම්. සමීල් , (නළීමි),**<br>හිටපු අධ්‍යක්ෂ,<br>මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු<br>දෙපාර්තමේන්තුව<br><br>**අෂ්ෂෙයික් එම්. ආර්. එම්. මලික් (නළීමි)**<br>අධ්‍යක්ෂ,<br>මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු<br>දෙපාර්තමේන්තුව. |
| ලේඛක මණ්ඩලයේ සාමාජිකයන්<br>(දෙමළ මාධ්‍යය) | : | **ආචාර්ය මව්ලවි එම්. එස්. එම්. ජලාල්දීන් (ගෆූරි)**<br>හිටපු කුලපති/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>අග්නිදිග විශ්ව විද්‍යාලය<br><br>**අෂ්ෂෙයික් එෆ්. එම්. ඒ. අන්සාර් මවුලානා (නළීමි) (M.A.)**<br>කථිකාචාර්ය,<br>ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, අඩ්ඩලච්චේන.<br><br>**අෂ්ෂෙයික් යූ. කේ. අබ්දුල් රහීම් (නළීමි)(M.A.)**<br>ආචාර්ය අල්-හම්රා මහා විද්‍යාලය,<br>ඔලුවිල්. |
| පරිවර්තනය | : | **ඒ. ඩබ්ලිව්. ඒ. අසීස් (B.A.)**<br>දිවුරුම් දුන් භාෂා පරිවර්තක |
| සංස්කාරක කමිටුව | : | **ඒ. එච්. එම්. යාකුත් (M.Ed.)**<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

ඒ. එම්. උවයිස්,
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ.

එම්. එස්. සෙයින් ෆාසිල්, **B.A., M.A.**
ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු කථා පරිවර්තක,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.


| | | |
|---|---|---|
| මාතෘකාව | : | **අල් අඛ්ලාකුල් ඉස්ලාමිය්යා,**<br>**(ඉස්ලාමීය සාරධර්ම)**<br>**අවසන් සහතික පත්‍ර විභාගය** |
| සංස්කාරක | : | **අල්හාජ් මෞලවි එම්. එච්. නූරුල් අමීන්, (නද්වි)**<br>**B.A. (Cey)**<br>සහකාර අධ්‍යක්ෂ,<br>මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු<br>දෙපාර්තමේන්තුව |
| ප්‍රකාශනය | : | **මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු**<br>**දෙපාර්තමේන්තුව,**<br>180, ටී. බී. ජයා මාවත,<br>කොළඹ 10. |
| මුද්‍රණය | : | **රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**<br>අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,<br>කොළඹ 08. |
| පළමු ප්‍රකාශනය | : | 2017 |
| ප්‍රකාශන හිමිකම | : | **මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු**<br>**දෙපාර්තමේන්තුව.** |

## තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව ආගමික අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇති සහ විවිධ පියවර ගෙන ඇති රටවල් අතුරින් එකකි. බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් ළමුන්ට සිය ආගම් පිළිබඳ දැනුම ලබාදීම පිණිස ඉරු දින ආගමික අධ්‍යාපන පන්ති පැවැත්වීම එබඳු එක් පියවරකි. මෙම ආගමික පන්ති අදාළ ආගමික ස්ථානවල මෙන්ම රජයේ පාසල් හා පුද්ගලික අධ්‍යාපන ආයතනවල පැවැත්වීමට කටයුතු යොදා ඇත.

තවද, ගුරු පුහුණු පන්ති පැවැත්වීම, ගුරු අත්පොත්, විෂය නිර්දේශ, පෙළ පොත් හා ළමුන් සඳහා නිල ඇඳුම් සැපයීම සහ වාර්ෂිකව ගුරුවරුන් සඳහා පොත් දීමනාවක් ලබාදීම ආදී වැඩසටහන් මගින් රජය මෙම වැඩසටහන සඳහා නිරන්තර දායකත්වය ලබා දේ. අහදියා නමින් හඳුන්වන දිවයින පුරා පිහිටි මුස්ලිම් ආගමික පාසල්වල අවශ්‍යතා සොයා බලමින් ඉහතකී පහසුකම් එම පාසල් සඳහා ලබාදීමට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කටයුතු කිරීම පැසසිය යුත්තකි.

මෙම පාසල් සඳහා සුදුසු පෙළපොත් හා ගුරු අත්පොත් ලබාදීම අධ්‍යාපන පද්ධතියේ සෑම මට්ටමකම සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය වේ.

විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අහදියා පාසල් අවසාන විභාගය හා ධර්මාචාර්ය විභාගය වැනි උසස් විභාග සඳහා පෙළපොත් මුද්‍රණය කිරීමට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 2008 වසරේ සිට පියවර ගෙන තිබේ. මෙම විභාගවලට අදාළව සැළකිය යුතු පොත් ප්‍රමාණයක් මුද්‍රණය කොට පාසල් වෙත සැපයුව ද ඉදිරි වසර සඳහා අවශ්‍ය පොත් මුද්‍රණය කිරීමේ කටයුතු තවමත් සිදුවෙමින් පවතී.

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු සඳහා වගකිවයුතු අමාත්‍යවරයා ලෙස, දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් මම බෙහෙවින් සතුටු වෙමි. තමන්ට පැවරී ඇති වගකීම් සාර්ථකව ඉටුකිරීමට දායක වූ සැමට මගේ ස්තුතිය පිරිනමමි.

**අල්හාජ් එම්. එච්. අබ්දුල් හලීම්, (පා.ම.)**
තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම්
ආගමික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය.

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
අංක 310, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.



4 * CM 20318

## තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සුබපැතුම් පණිවුඩය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් හතරටම අයත් ජනතාව බහු ආගමික හා සංස්කෘතික සංකේත පිළිබඳ ප්‍රතිමූර්ති සමගින් සාරධර්ම සපිරි සමාජයක් ගොඩනැගීමට හැකි සියලු ප්‍රයත්න දරමින් සිටින අවස්ථාවක, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අහදියා පාසල් නමින් හඳුන්වන ඉස්ලාමීය දහම් පාසල්වල සිසුන් හට විෂය නිර්දේශ සහ විෂය නිර්දේශ පාදක පෙළපොත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් සුබපැතුම් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

දිගු කලක් මුළුල්ලේ පැවැති මෙම අවශ්‍යතාව සපුරාලමින් ගුරුවරුන්ට සහ සිසුන්ට තම අධ්‍යාපනික කටයුතු අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමට හැකියාව ලබාදෙමින් ඒ සඳහා අප අමාත්‍යාංශය හරහා දයකත්වය ලබාදීම අපගේ යුතුකමකි.

රටක සංවර්ධනය දීර්ඝ කාලයක් පවතින්නේ එම සංවර්ධනය සමාජයීය සංවර්ධනය මෙන්ම ආර්ථික හා දේශපාලනික සංවර්ධනය සමග ඒකාබද්ධ කිරීමෙන් පමණක්ම බව මම තරයේ විශ්වාස කරමි.

අප සමාජයේ සදාචාරාත්මක සම්මතයන් ආරක්ෂා කිරීමට නම්, ආගමික හා සංස්කෘතික යහසාධනය පිළිබඳ නිසි අවධානය යොමු කළ යුතු වේ. ආගමික හා සංස්කෘතික සම්ප්‍රදායයන් ආරක්ෂා කර ගැනීමේදී අහදියා වැනි ආගමික පාසල් අමිල සේවයක් ලබා දේ.

ආගමික ප්‍රතිපත්ති අනුව සිය ජීවිත හැඩගස්වා ගැනීමට දරුවන් කුඩා කළ සිට පුහුණු කිරීම මගින් අප රටේ සදාචාරාත්මක සම්ප්‍රදායන් ආරක්ෂා කරන්නා වූ නව පරම්පරාවක් බිහිවනු ඇතැයි අපට අපේක්ෂා කළ හැකිය.

බහු ආගමික හා සංස්කෘතික ජනතාවක් වාසය කරන අප වැනි රටක බෞද්ධ, හින්දු, මුස්ලිම් හා ක්‍රිස්තියානි ප්‍රජාවන්ට තම දරුවන්ට තම ආගමික දැනුම හා අත්දැකීම් ලබාදීමට හැකියාව ලබා දෙමින් මෙම ආගමික පාසල් සුවිශේෂී මෙහෙයක් ඉටු කරයි.

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවටත් මෙම සද් කාර්යයට සහභාගී වූ සියලු දෙනාටත් මගේ ස්තූතිය පිරිනමමි.

**දුලීප් විජේසේකර (පා.ම.),**
තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික
කටයුතු පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍ය.

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 310, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

## තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය

සදාචාර සම්පන්න, විනයගරුක හා සාධාරණ සමාජයක් බිහිකිරීමෙහිලා ආගමික අධ්‍යාපනය තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරයි. ළමා අවධියේ සිටම ළමුන්ගේ සිත් සතන් තුළට ආගමික සිතුවිලි ඇතුළු කිරීමට අපට හැකි නම්, සැමවිටම වඩා යහපත් සමාජයීය වටපිටාවක් නිර්මාණය කිරීම අසීරු කාර්යයක් නොවනු ඇත. ආගමික අධ්‍යාපනය යනු ප්‍රයෝජනවත් අත්දැකීම් ලබාදීමේ මාධ්‍යයකි. විභාග හා වාර පරීක්ෂණ කේන්ද්‍ර කොට ගත් විධිමත් අධ්‍යාපන පද්ධතිය තුළින් ආගමික අධ්‍යාපනය ලබාදීම දුෂ්කර කටයුත්තකි. විධිමත් අධ්‍යාපනයේ මෙම අඩුව සපුරාලීම පිණිස පවත්වනු ලබන ඉරු දින දහම් පාසල් මෙම ක්ෂෙත්‍රයෙහි සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වී තිබේ.

බෞද්ධ, හින්දු, ඉස්ලාම් හෝ ක්‍රිස්තියානි යන සෑම ආගමකම ළමුන් අතර ආගමික දැනුම හා ආගමික පරිසරයක් වර්ධනය කරනු පිණිස එක් එක් ආගමට අයත් දහම් පාසල් ශ්‍රී ලංකාවේ බොහෝ කලක සිට වෙන වෙනම ක්‍රියාත්මක වේ. සෑම ආගමකට ම අයත් ළමුන් සඳහා සමාන පහසුකම් සැපයීම සඳහා රජය කටයුතු කර ඇති අතර දිගු කලක සිට පැවැති අවශ්‍යතාවයක්වන විෂය නිර්දේශය හා විෂය නිර්දේශ පාදක පෙළපොත් රජය විසින් ප්‍රකාශයට පත්කොට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූලිකත්වය යටතේ මුස්ලිම් දහම් පාසල් සිසුන් අතර බෙදා හැර තිබේ.

බෞද්ධ ධර්මාචාර්ය විභාගයට සමාන ඉස්ලාම් ආගමික විභාගය වන දීනියාත් සහතික විභාගය සහ මුස්ලිම් දහම් පාසල්වල අහදියා අවසාන සහතික විභාගය සඳහා පෙළපොත් දහයක් සැපයීමේ කාර්යයට සක්‍රීයව උරදුන් සියලු දෙනාට මගේ අවංක කෘතවේදීත්වය පළකරමි.

**ඩී. ජී. එම්. වී. හපුආරච්චි,**
ලේකම්,
තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම්
ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
අංක 310, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

ආගමික, අධ්‍යාත්මික හ සංස්කෘතික පුනරුදයක් අප සමාජයට, රටට හා මුළු මහත් ලෝකයටම අවශ්‍යව පවතින මෙවන් මොහොතක, ඒ වෙනුවෙන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් අහදියා පාසල් දරු දැරියන් හා ගුරුවරු ගුරුවරියන්ගේ පරිශීලනය සඳහා සිංහල මාධ්‍යයෙන් සකස් කර ඇති මෙම පොත් මාලාව වෙනුවෙන් ශුභ පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

අහදියා පාසල් පද්ධතිය අප රටේ පසුගිය දශක පහකට වැඩි කාලයක් තිස්සේ ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. අහදියා පාසල්වල අධ්‍යයන කටයුතු ඉතා හොඳාකාරව ක්‍රියාත්මක කිරීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව මගින් අදාළ විෂයමාලා සම්පාදනයකර නිකුත් කර තිබීම සතුටට කරුණකි. රටේ සියලුම අහදියා පාසල්වල එකම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට එමගින් අවස්ථාව සලසා ඇත.

උක්ත විෂය මාලාව මගින් නිසි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ඉස්ලාමීය ආගමික පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා ඉස්ලාමීය දීනිය්‍යාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය සඳහා අවශ්‍ය පෙළපොත් දැනටමත් දෙමළ මාධ්‍යයෙන් සකස් කර ප්‍රකාශයට පත් කර තිබීම පිළිබඳවත් සතුට ප්‍රකාශ වන අතර එම පොත් සියල්ල සිංහල මාධ්‍යයෙන් ඉස්ලාම් දහම ඉගෙන ගන්නා සිසු, සිසුවියන්ටත් එය උගන්වන ආචාර්යවරුන්ටත් පිටුවහලක් වීම නොඅනුමානය.

මෙම පොත්පෙළ සම්පාදනය කර සංස්කරණය කර සිංහලට පරිවර්තනය කර ප්‍රකාශයට පත් කිරීම උදෙසා රජය මගින් රුපියල් මිලියන හතරක් පමණ වියදම් දරා ඇති බවද දූයේ දරුදැරියන්ගේ ආගමික අධ්‍යාපනය උදෙසා මෙම පොත් පෙළ සකස් කිරීමට දායකත්වය ලබා දුන් ලේඛක මණ්ඩලයට ද සංස්කරණය හා පරිවර්තනයේ දී සහය දුන් සම්පත් දායකයන්ටද වෙහෙස නොබලා මෙම කාර්යයෙහි සහයෝගය දුන් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තූතිය පුද කර සිටිමි.

මෙම පෙළපොත් මාලාවෙන් උපරිම ප්‍රායෝජන ලැබීමට අහදියා පාසල් දරුදැරියන්ටත් ආචාර්යවරුන්ටත් හැකියාව ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි!

**අෂ්ෂෙයික් එම්. ආර්. එම්. මලික්,**
අධ්‍යක්ෂ,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
අංක 180, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂතුමාගේ ශුභාශිංසන පණිවුඩය

අද ලෝකය දැඩි ආධ්‍යාත්මික දරිද්‍රතාවයෙනුත් ශූන්‍ය භාවයෙනුත් පෙළෙමින් පවතී. අද ලොව පවතින සියලුම ප්‍රශ්නවලට හේතුව වී ඇත්තේ ආධ්‍යාත්මක පිරිහීමත් එය මත බිහිවී ඇති සංස්කෘතික පිරිහීමත් වන බව පවසන්නේ නම් එය අතිශයෝක්තියක් නොවේ.

ආගම සම්බන්ධ සිතුවිලි, භෞතිකවාදය හා ලෞකිකවාදය වැනි ආගමික විරෝධී ප්‍රතිපත්තිවල බලපෑම නිසා ආධ්‍යාත්මික, ධාර්මික, විනය, හා සංස්කෘතික ක්ෂේත්‍රවල භයානක පසුබෑමක් අද අපි දකින්නෙමු. දැනුම් අගයන සමාජය ආධ්‍යාත්මිකත්වය බැහැර කරයි. සිරුර පෝෂණය කිරීම ගැන සැලකිලිමත්වන ප්‍රමාණයට සිත පෝෂණය කිරීමට සැලකිලිමත් නොවන්නේ ය. මෙලොව පතන සමාජය පරලොව ප්‍රතික්ෂේප කරයි.

සමකාලීන ලෝකයේ මෙවැනි සමාජ විරෝධී අභියෝගයන්ට මුහුණ දී මිනිස් සමාජය ආගමික පදනමින් ආධ්‍යාත්මක මාර්ගයෙහි යොමු කළහැකි දැනුමක් ද, නිපුණතාවයක් ද, පෞරුෂත්වයක් ද, ඇති කරන පුහුණු වැඩමුළු අරාබි විදුහල් සමග එක්ව අහදිය්‍යා පාසල් ක්‍රියාත්මක කරන බව කිව හැකි ය. ශ්‍රී ලංකාවේ වසර 50කට පෙර සිටම අහදිය්‍යා පාසල් ක්‍රියාත්මක වීම විශේෂයෙන් කිවයුත්තකි. අහදිය්‍යා පාසල්වලට ඉතා හොඳින් මගපෙන්වීම සඳහා දෙපාර්තමේන්තුව එයට අවශ්‍ය විෂය නිර්දේශය සකස්කර ඉදිරිපත් කළ බව සියල්ලන්ම දන්නා කරුණකි.

මෙම විෂය නිර්දේශවලින් පමණක් පූර්ණ ප්‍රයෝජනය ලැබිය නොහැකි බව දත් දෙපාර්තමේන්තුව පළමු අදියර වශයෙන් මෙම විෂය නිර්දේශවලට අදාළ පරිදි ඉස්ලාමීය (අහදිය්‍යා, අල්-කුර්ආන්) පාසල් (ධර්මාචාර්ය) සහතික පත්‍ර පාඨමාලාවට අවශ්‍ය පෙළපොත් සකස් කිරීම ඉතා හොඳින් ඉටුකළ, ලේඛක මණ්ඩලයටත් සංස්කාරක මණ්ඩලයටත් මෙම කාර්යයේ ඉතා උනන්දුවෙන් නියැළුනු දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ටත් විශේෂයෙන්ම සහකාර අධ්‍යක්ෂ අෂ්ෂෙයික් නූරුල් අමීන් මහතාටත් අපගේ සියලු කෘතඥතාවයන් පළ කෙරේ. ඒ අතර මේ කාර්යයට සහභාගි වූ සියල්ලන්ගේ වෑයම හා ඒ අයගේ කැපවීම අල්ලාහ් අනුමතකර යහපත් ආනිසංස ලබා දෙත්වා යි සර්වබලධාරි අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරමි.

**අෂ්ෂෙයික් එම්. එච්. එම්. සමීල්,**
හිටපු අධ්‍යක්ෂ,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂතුමාගේ ශුභාශිංසනය

ඉස්ලාම් යනු එක්තරා ජීවිත ක්‍රමයකි. මුස්ලිම්වරයකු සේ ජීවත් වන්නේ නම් අල් කුර්ආනය හා අල් හදීසය පිළිබඳ පැහැදිලි දැනුම ලබා තිබීම අවශ්‍ය ය. "දැනුම සෙවීම මුස්ලිම් වූ ගැහැනු පිරිමි දෙපාර්ශවයේ ම වගකීම වේ" යන අදහසින් එන නබි වදන හා "අල් - කුර්ආනය ඉගෙන එය අන් අයට උගන්වන්නා ඔබගෙන් වඩාත් හොඳ පුද්ගලයා ය" යන නබි වදනෙන් ද මෙය අවධාරණය කෙරෙන්නේය. ශ්‍රී ලංකාවේ පාසල් වයසේ ම ඉස්ලාම් ආගම ඉගෙන ගැනීමට ඇති හොඳම මාධ්‍යය වශයෙන් අහදිය්යා පාසල් පැවතීම සතුටුදායක තත්ත්වයකි. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අහදිය්යා පාසල්වලට වාර්ෂිකව ලබාදෙන සේවාවන් අහදිය්යාවල වර්ධනයට මහත් උදව්වක් වන්නේ ය.

ළදරු අධ්‍යාපනය පටන් විශ්වවිද්‍යාලය දක්වා වන වසර 14 ට අදාළ ජාතික අහදිය්යා විෂය නිර්දේශය සකස් කිරීම, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් අහදිය්යා අවසන් සහතික පත්‍ර විභාගය හා ඉස්ලාමීය දීනිය්යාත් (ධර්මාචාර්ය) විභාගය යන විභාග පැවැත්වීමට කටයුතු යෙදීම, දිස්ත්‍රික් මට්ටමින් අහදිය්යා ගුරුවරු සඳහා වැඩමුළු හා සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම, අහදිය්යා ගුරුවරු සඳහා වාර්ෂික පොත්පත් මිලදී ගැනීම සඳහා ආධාර මුදල් හා වාර්ෂිකව ඔවුන්ට නිල ඇඳුම් ලබාදීම එවැනි සේවාවන් සමහරකි.

මෙයින් අහදිය්යා සඳහා ජාතික විෂය නිර්දේශයට අනුව පෙළපොත් සකස් කිරීම වැදගත් පියවරකි. අහදිය්යා ප්‍රජාවගේ ඒකමතික ඉල්ලීමේ පළමු පියවර අද ඉටුවීම ගැන මම ඉතාමත් සතුටු වෙමි. පළමු පියවර වශයෙන් අහදිය්යා අවසන් සහතික පත්‍ර විභාගය සඳහා අකීද, මෂාදිරුස් ෂරීආ, ෆික්හුල් ඉස්ලාම්, අෂ්ෂීරා වත්තාරිහ්, අහ්ලාක් ආදී විෂයයන් හතර සඳහා දීනිය්යාත් විභාගයට අදාළව ඉහත විෂයයන් හයට අදාළ පෙළ පොත් ප්‍රකාශ වීම සුවිශේෂව කිවයුතු කරුණකි. නව අධ්‍යක්ෂතුමා යටතේ ඉහත කටයුත්ත අඛණ්ඩව සිදුවේ යන්න මගේ දැඩි විශ්වාසයයි.

මෙම කාර්යයේ ආරම්භයේ පටන් අද දක්වා වෙහෙස නොබලා කැප වී සේවය කරන සහකාර අධ්‍යක්ෂ අෂ්ෂෙයික් එම්. එච්. නූරුල් අමීන් සහ දෙපාර්තමේන්තු නිලධාරීන් හා ලේඛක කණ්ඩායම් සාමාජිකයන්, සංස්කාරවරු ආදීන් කෘතඥපූර්වකව මතක් කරමි. අල්ලාහ් ඔවුන්ගේ සේවාව අනුමත කරත්වා! මෙම කාර්යයේ ඔවුන් සමඟ එක්ව කටයුතු කිරීමට ලැබීම අල්ලාහ් මට ලබාදුන් මහත් භාග්‍යයක් ලෙස සලකමි.

මේ සම්බන්ධයෙන් මට කළ හැකි සෑම සහයෝගයක් ම දැක්වීමට මම කැමැත්තෙන් සිටිමි.

අල්ලාහ්ගේ දයාව කරුණාව සියල්ලන්ට ම හිමිවේවා!

ආමීන්!

**අෂ්ෂෙයික් වයි. එල්. එම්. නවවි,**
හිටපු අධ්‍යක්ෂ,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික
කටයුතු දෙපාර්තමේන්තුව.

" බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්"

අහදියා පෙළ පොත් අතරට අහදියා අවසන් විභාගය සහ අහදියා දීනියියාත් විභාගය සඳහා වූ දෙමළ භාෂාවෙන් සකස් වූ පොත්වල, සිංහල හා ඉංග්‍රීසි භාෂාවලට පරිවර්තිත පෙළ පොත් කාණ්ඩය එළිදැක්වීම වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සම්බන්ධව මා ඉමහත් සතුටට පත්වෙමි.

දැනටමත් අහදියා සිසුන්ට ලැබී තිබෙන්නාවූ පොත්පත් අතරට මෙම ප්‍රකාශන ද මහත්වූ ඌනපූර්ණයක් වනු නොඅනුමානය. මෙම ප්‍රකාශන සඳහා අවශ්‍ය මූල්‍යමය දයකත්වය හා අනෙකුත් අනුග්‍රහ ලබාදී ඇත්තේ මෑත කාලයක සිට සීමාසහිත ලංකා ඉස්ලාමීය උපදේශක සංගමයේ (ශ්‍රී ලංකා අහදියා පාසල් මධ්‍යම සම්මේලනයේ) සහයට පැමිණියේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවයි.

මෙයට අතිරේකව, අහදියා පාසල් පද්ධතියට අදාළව යම් යම් ගැටළු මතුවූ අවස්ථාවල දී ඒ හා සම්බන්ධව අප විසින් කරන ලද කරුණු ඉදිරිපත් කිරීම් සැලකිල්ලට ගෙන අප වෙනුවෙන් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ඉදිරිපත්වී එකී ගැටළු අදාළ පාර්ශව වෙත යොමුකර අවශ්‍ය විසඳුම් ලබාගැනීමට ගන්නා ලද අප්‍රතිහත උත්සාහය අපගේ ඉමහත් ඇගයීමට ලක්වන අතර ඒ සම්බන්ධව මේ අවස්ථාවේදී අප සිහිකරන්නේ මහත්වූ කෘතවේදීත්වයෙන් යුතුවය.

1951 දී ස්ථාපිත කරන ලද මෙම අහදියා පාසල් පද්ධතිය හා එකී ක්‍රියාකාරකම් අප සමාජයට අත්‍යවශ්‍යම අංගයක් ලෙස අප සමාජයේ පිළිගැනීමට පාත්‍රවී එහි ප්‍රශංසාවට ද ලක්ව ඇත. එමෙන්ම එහි ක්‍රියාකාරීන්ගේ ස්වෙච්ඡාවෙන් වූ හා අභිප්‍රේරණාත්මක ක්‍රියාකාරකම් මෙන්ම සිය අනුග්‍රහක භවතුන්ගේ නොමසුරු ආධාර උපකාරය හා දැඩි උනන්දුව හේතුවෙන් මෙම අහදියා පාසල් පද්ධතිය තවදුරටත් ශක්තිමත් වෙමින් වර්ධනය කරා පියනගමින් සිටී.

වස්සලාමු අලෛකුම් වරහ්මතුල්ලාහ්

**අල්හාජ් එම්. ෂිබ්ලි අසීස්,**
ජනාධිපති නීතිඥ,
සභාපති,
සීමාසහිත ලංකා ඉස්ලාමීය උපදේශක සංගමය
(ශ්‍රී ලංකා අහදියා පාසල් මධ්‍යම සම්මේලනය).

# කතු වැකිය

බිස්මිල්ලාහිර් රහ්මානිර්රහීම්

සියලු ප්‍රශංසා සර්ව බලධාරි අල්ලාහ් තආලාටය. අල්හම්දුලිල්ලාහ්

"(මට අවනතව මාව) වන්දනය කිරීම සඳහා ජින්වරු සහ මිනිසුන් මා විසින් මවන ලදී.(අල් කුර්ආන් -51:56)"

ලොව මනුෂ්‍ය වර්ගයා බිහි කිරීමේ අරමුණ අල්ලාහ් විසින් පනවන ලද අණ පිළිගෙන, නබි (සල්) තුමාගේ ජීවන මාර්ගය අනුගමනය කර මුස්ලිම්වරයෙකුව ජීවත්ව මරණයට පත්වීමයි. අල්ලාහ්ගේ අනුගාමිකයින් වශයෙන් සේම මුස්ලිම්වරයෙකුම පරලොව සිතුවිල්ලෙන් තම ජීවිතය ඉබාදතයන් සමඟ බැඳී කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

නබි (සල්) තුමාගේ වටිනා වදන් මෙහිදී පහත අයුරින් ගෙන හැර දක්වා ඇත." මේ ලෝකයේ අල්ලාහ් තආලා කෙනෙකුට යහපත පතන්නේ නම්, ඔහුට ආගම පිළිබඳව පැහැදිලි හැඳින්වීමක් ලබා දෙන්නේ ය." (අල් හදීස්)

ඉහත දේව වාක්‍යයට සහ නබි (සල්) තුමාගේ උපදේශනයට අනුව ආගම සමග ලැදිව වාසය කිරීම අත්‍යවශ්‍ය වගකීමකි. මෙලෙස මුස්ලිම්වරයෙකු දේව බිය, ඉවසීම, අවනත බව, යහපත් විනය යන යහගුණාංග ජීවිතය සඳහා ආගම අධ්‍යාපනය ලබා ගැනීම අතිශයින් වැදගත් වේ. ආගමික අධ්‍යාපනය ලැබීම සත්‍ය වශයෙන්ම විශ්වාසවන්තයෙක් ලෙස ජීවත්වීමට මග පාදයි. මෙවන් යහපත් විනයක් ඇති සමාජයක් නගා සිටුවීම සඳහා වර්තමානයේ රට පුරා විවිධ ඉස්ලාමීය ෂරීආවට අයත් අධ්‍යාපනික ආයතන, පෞද්ගලික ආයතන ඔවුන්ට ලබා දිය හැකි උපරිම සහාය ලබා දීම ඉදිරිපත් වීම සත්‍ය වශයෙන්ම අගය කළ යුත්තකි.

ඉහත අරමුණු පදනම් කර ගත් දශක හයකට වැඩි කාලයක් අහදියා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් සකස් කර ඒ අනුව ක්‍රියාකරමින් සිටින මධ්‍යම අහදියා සම්මේලනයේ ප්‍රධානි ඇතුළු පරිපාලන නිලධාරින්ගේ සේවය මිල කළ නොහැකිය. එමෙන්ම මෙම අරමුණු පදනම් කර ගෙන මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විවිධ ක්‍රියා මාර්ගයන් ඉටු කරමින් සිටින බවද මෙහිදි සඳහන් කළ යුතුය.

එසේ සඳහන් කිරීමේ දී අරාබි විදුහල්, අහදියා දහම් පාසල්, කුර්ආන් මද්රසා වැනි ඉස්ලාමිය අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යාපන මට්ටම වැඩි දියුණු කිරීම, භෞතික සම්පත්

සංවර්ධනය ආදී කටයුතු සම්බන්ධයෙන්ද මෙම දෙපාර්තමේන්තුව ඉතා උවමනාවෙන් කටයුතු මෙහෙයවන බව සඳහන් කළ යුතුය. ඒ අතරින් අහදියා පාසල් සිසුන්ගේ යහපත උදෙසා විවිධ සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කරමින් පවතින බවද තවදුරටත් සඳහන් කළ යුතුය. මෙසේ මෙහි මුල් පියවර වශයෙන් අහදියා පාසල් සහ කුර්ආන් මද්රසා සඳහා නව විෂය මාලාවක් 2003 වසරේදී ප්‍රකාශයට පත් කර මෙම විෂය මාලාවට අනුකූලව පරිදි 2005 වසරේ දී අහදියා අවසාන සහතික පත්‍ර විභාග පැවැත්වීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඒ සඳහා අවශ්‍ය සංවිධාන කටයුතු ද ඉටු කරන බව සඳහන් කළ යුතුය.

තව ද 2008 වර්ෂයේ දී අහදියා ළදරු පාසල් පටන් ඉස්ලාමීය දීනියාත් ධර්මාචාර්ය විභාගය දක්වා විෂය නිර්දේශය සකස් කර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන් ම මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීම ද සඳහන් කළ යුතුය. තවද, මෙම දෙපාර්තමේන්තුව වාර්ෂිකව අහදියා ගුරු භවතුන් සඳහා නිළ ඇඳුම් සහ පොත් පත් මිලදී ගැනීම සඳහා මුදල් ලබා දීම, සම්මන්ත්‍රණ පැවැත්වීම ආදී කටයුතු සිදුවෙමින් පවතී.

විශේෂයෙන්ම අහදියා අවසාන සහතික පත්‍ර විභාගය හා ඉස්ලාමීය දීනියියාත් (ධර්මාචාර්) විභාගයට පෙනී සිටින අය පෙළ පොත් නොමැතිවීම හේතුවෙන් විභාගයට ඉදිරිපත්වීමේදී විවිධ ගැටළුවලට මුහුණපාමින් සිටියි. මෙය අවබෝධ කර ගත් මෙම දෙපාර්තමේන්තුව විභාගය සඳහා සුදුසු වන පරිදි පෙළ පොත් සකස් කිරීම ද කරන ලදී.

මේ අන්දමින් පෙළ පොත් එළි දැක්වීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමට මූලිකව කටයුතු කරමින් උපදේශනය හා මඟ පෙන්වූ හිටපු අධ්‍යක්ෂවරුන් වන අෂ්-ෂෙයික් එම්. අයි. අමීර් මහතාටත්, අෂ්- ෂෙයික් වයි. එල්. එම්. නව්වි මහතාටත්, අෂ්ෂෙයික් එම්. එච්. එම්. සමීල් මහතාටත් මෙම කෘතීන් කිසි ප්‍රමාදයකින් තොරව නිසි වේලාවට එළිදැක්වීමට දයක වූ වත්මන් අධ්‍යක්ෂ අෂ්ෂෙයික් එම්. ආර්. එම්. මලික් මහතාටත් මාගේ අවංක ආදර ස්තූතිය පුද කරමි.

මෙම පෙළ පොත් සංස්කරණය කර ප්‍රසිද්ධ කිරීමට සෑම අයුරකින්ම උපදෙස් සහ මඟපෙන්වූ ජාමියා නලීමියා කලා පීඨයේ අධ්‍යක්ෂ ආචාර්ය එම්. ඒ. එම්. ෂුක්රි සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ අෂ්-ෂෙයික් ඒ. සී. අගාර් මුහම්මද් යන මහත්වරුන්ටද මාගේ හෘදයාංගම ස්තූතිය පල කරන අතර මෙය ප්‍රසිද්ධ කිරීම සඳහා ඇප කැප වූ සියලු දෙනාවම සිහිකර මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

මෙම පොතෙහි සිංහල පරිවර්තන කටයුතු සාර්ථකව නිම කර දුන් පරිවර්තක ඒ. ඩබ්ලිව්. ඒ. අසීස් මහතා සහ සංස්කාරක කමිටුවේ සාමාජිකයින් වන අෂ්-ෂෙයික් ඒ. එම්. උවෙයිස් මහතා, එම්. එච්. එම්. යාකූත් මහතා හා එම්. එස්. සෙයින් ෆාසිල් මහතා යන සියලු දෙනාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් සාර්ථකව මෙම පොත එළි දැක්වීමෙන් අනතුරුව, සිංහල මාධ්‍යය සිසු සිසුවියන්ගේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා පහත පරිදි සියළු පොත් සිංහල බසින් එළි දැක්වීමට ලැබීම ඉමහත් භාග්‍යයක් කොට සලකමි.



5 * CM 20318

**අහදියියා අවසන් සහතික පත්‍ර විභාග පෙළ පොත්**

1. අකීද සහ මසාදිරුස් ෂරීආ (ඉස්ලාමීය මූලධර්ම හා නීති මූලාශ්‍ර)
2. අල් ෆික්හුල් ඉස්ලාමි (ඉස්ලාමීය නීති පද්ධතිය - ඉ.ආ.අ.ස.ප.වි)
3. අල් අහ්ලාකුල් ඉස්ලාමියියා (ඉස්ලාමීය සාරධර්ම)
4. අස්සීරා වත්තාරීහ් (ඉස්ලාමීය ඉතිහාසය - ඉ.ආ.අ.ස.ප.වි)

**ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාග පෙළ පොත්**

1. අකීද සහ මසාදිරුස් ෂරීආ (ඉස්ලාමීය මූලධර්ම හා නීති මූලාශ්‍ර - ඉ.දී.ධ.ස.ප.වි)
2. අල් ෆික්හුල් ඉස්ලාමි (ඉස්ලාමීය නීති පද්ධතිය - ඉ.දී.ධ.ස.ප.වි)
3. අල්- අහ්ලාක් වස් සුලූක් (සමාජ විද්‍යාව සහ ආචාර ධර්ම)
4. අස්සීරා වත්තාරීහ් (ඉස්ලාමීය ඉතිහාසය - ඉ.දී.ධ.ස.ප.වි)
5. අල් අදබුල් ඉස්ලාමි (ඉස්ලාමීය සාහිත්‍යය)
6. අල් ලුකතුල් අරබියියා වඅහ්කාමුත් තජ්වීද් (ශුද්ධ වූ අල් කුර්ආන් කියවීම පිළිබඳ නීතිරීති)

තවද, මෙය පොතක් වශයෙන් සකස් කිරීමට ආරම්භයේ පටන් මේ දක්වා සහය වූ අප දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වන අෂ්-ෂෙයික් එම්. එම්. එම්. මුෆ්ති (නලීම්) මහතා (සංවර්ධන සහාකාර), එස්. එම්. තාජුඩීන් මහත්මිය (මූල්‍ය සහකාර), ජී. ෆහීමා ජුනයිඩීන් මහත්මිය (හිටපු කළමනාකරණ සහකාර) ඒ. ඒ. එම්. අස්රින් මහතා (ගබඩා භාරකරු), එම්. ජී. එෆ්. රුෂ්ඩා (කළමනාකරණ සහකාර), එම් එන්. එෆ්. ෆර්මිලා (කළමනාකරණ සහකාර) ඇතුළු සහය දුන් දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන්ටත් මාගේ අවංක ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

මෙම පොත සම්බන්ධයෙන් ඔබගේ යෝජනා සහ අදහස් ඇත්නම් ඊළඟ මුද්‍රණයේ දී සකස් කිරීම සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට එවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. අවසාන වශයෙන් මේ සඳහා ඇප කැප වූ සියළු දෙනාගේ ප්‍රාර්ථනා එලෙසින්ම ඉටු කර දීමට සර්ව බලධාරී අල්ලාහ් තආලාගේ පිහිට ලැබේ වා යැයි ප්‍රාර්ථනා කරමි.

**අල්හාජ් මව්ලවි එම්. එච්. නූරුල් අමීන්,**
සහකාර අධ්‍යක්ෂ.
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
අංක 180, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

# අල්-අහ්ලාකුල් ඉස්ලාමිය්යා
# (ඉස්ලාමීය සාරධර්ම)

**ඉස්ලාම් ආගමික (අහදිය්යා අල්කුර්ආන් පාසල්)**
**අවසන් සහතික පත්‍ර විභාගය සඳහා පෙළ පොත**

# පටුන


පිටුව

1. අහ්ලාක් හි වැදගත්කම 1

2. අහ්ලාක් - ඊමාන් සම්බන්ධතාව 4

3. අහ්ලාක් - ඉබාදත් අතර සම්බන්ධතාව 5

4. ඊමානීය ගුණාංග 8

5. මුස්ලිම්වරුන් වෙත තිබිය යුතු විශේෂ ගුණාංග 19

6. අධ්‍යාත්මික වර්ධනයට අදාළ මානසික ගුණාංග 46

7. අධ්‍යාත්මික වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් 55

8. අධ්‍යාත්මික වර්ධනයට අදාළ සමාජ බැඳීම් 60

## අල් අක්ලාකුල් ඉස්ලාමියියා

## ඉස්ලාමීය ශිෂ්ටාචාරයන්

## පෙරවදන

ඉස්ලාමීය අහදියියා අල්කුර්ආන් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට අදළ ශ්‍රේණිවල ඉගෙන ගන්නා මුස්ලිම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වන ඉස්ලාමීය දීනියා (අහදියියා අල්කුර්ආන්) පාසල් සඳහා ව අවසාන සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පළමු මුද්‍රණය ලෙස 2003 වසරේත් දෙවන මුද්‍රණය ලෙස 2008 වසරේත් ප්‍රකාශයට පත් විය. ඒ අනුව දැන් ශ්‍රී ලංකාව පුරා ඇති අහදියියා පාසල්වල මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කෙරෙන බව කෘතඥපූර්වකව මතක් කර දෙමි. විෂය නිර්දේශයේ අරමුණ, ඉලක්කය, ජයග්‍රහණය යනාදී ගුරු උපදෙස් සංග්‍රහයේ සැකැස්ම මත රැඳී පවතී. ඒ අනුව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටුතු පිළිබඳ දෙපාර්තමේන්තුව දැනට ගෙන ඇති නොමසුරු වෑයම නිසා අධ්‍යාපන විශේෂඥවරුන් සහ උලමා පිරිස් එක්ව සකස්කර ඇති මෙම මාර්ගෝපදේශ සංග්‍රහය අහදියියා ගුරුවරුන්ගේ සිහිනය සැබෑ කර තිබීම සැලකිය යුත්තකි.

අල් අක්ලාකුල් ඉස්ලාමියියා යන විෂය කොටසේ නිපුණතා මට්ටම් හයක් තිබෙන අතර ඒවා එකිනෙකෙහි ඇතුළත් උපප්කක මුල්කොට සාක්ෂි සහිතව ද ප්‍රායෝගික අංශ සහිතව ද විවෘත දෘෂ්ටියෙන් යුක්තව විවිධ පරිත්‍යාග මධ්‍යයේ අප මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත්තෙමු.

ආගමික අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩිපුර කතාකරන සාරධර්ම අධ්‍යාපන චින්තනය අපගේ නිර්මාණවල අඩංගු අතර අද තරුණ සමාජය මුහුණ දෙන චර්යාත්මක, ශිෂ්ටාචාරත්මක, ආධ්‍යාත්මික දුප්පත්කම, නිශ්ශලනය යනාදියට හොඳ විසඳුමක් ලෙස ඉස්ලාමීය රෝග නිවාරකයක් ලෙස ද මෙම මාර්ගෝපදේශ සංග්‍රහය පවතිනු ඇතැයි විශ්වාස කරමු.

මෙම මග පෙන්වීම භාවිත කරන සියලු ගුරුවරුන් හා උපදේශකයන් විෂය නිර්දේශ අන්තර්ගතය ඇතුළත් කරගත් පසු මගපෙන්වීම සසඳුවහොත් කාර්යක්ෂම ඉගැන්වීම්වලට සහ දේශනාවන්ට ඉතා මනාව දයකත්වය දක්විය හැකි බව බලාපොරොත්තු වෙමු. අප ලියූ එවා යැයි නොසලකා ඒවා පදනම් කරගෙන තවදුරටත් ගවේෂණයේ යෙදීමේ අයිතිය ගුරුවරයාට ඇතැයි දන්වා සිටින්නෙමු.

*ග්‍රන්ථ කතෘ මණ්ඩලය වෙනුවෙන්.*


1. **අෂ්ෂෙයික් එස්. එම්. එම්. මසාහිර්,**
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
   ගිණිකොනදිග විශ්ව විද්‍යාලය,
   ඔළුවිල්.

2. **අෂ්ෂෙයික් එෆ්. එම්. ඒ. අන්සාර් මව්ලානා,**
   කථිකාචාර්ය,
   ජාතික ශික්ෂණ විද්‍යාලය,
   අඩ්ඩාලච්චේනයි.

# 01. අඛ්ලාක්

## අඛ්ලාක් හි වැදගත්කම

ඉස්ලාම් දහමේ ඉතාමත් වැදගත් කරුණක් වශයෙන් " අඛ්ලාක් " සලකනු ලබයි. " කුලුක් හසන් " නැතහොත් " අඛ්ලාක් හසනා " යන පදයන් ඉස්ලාමීය මූලාශ්‍රවල " යහපත් ගුණාංග " " ශීලාචාරය " විනයානුකූලභාව, යන අර්ථයයන් සඳහා භාවිතා කර තිබේ. මෙම අර්ථයෙන්ම " මකාරිමුල් අඛ්ලාක් " යන පදය ද හදීස්වල භාවිතා කර ඇත.

"අදබ්" නැතහොත් "ආදාබ්" යන භාවිතය ජනතාව අතරෙහි "යහපත් ගුණාංගය" පිළිබිඹු කිරීමට යොදාගනු ලැබුන ද එම පදය ක්‍රියාවන්ගේ ක්‍රමවත් වූ රටාව ගෙන හැර පෙන්වීමට "ෂරීආවේ" දී උපයෝගී කරගෙන ඇත. උදාහරණයක් වශයෙන්

ආහාර ගැනීම, පානය කිරීම, සිසුන් අනුමගනය කළ යුතු ක්‍රමය විනය යනාදිය ප්‍රකාශ කළ හැකි ය.

ඉස්ලාමයේ "අකායිද් "යන විශ්වාස සංකල්පය, ඉබාදත් යන නැමදුම් සංකල්පය, "මුආමලාත්"යන ගනුදෙනු කිරීමේ ක්‍රියා මාර්ග, "මුනාකආත්"යන විවාහ කටයුතු සම්බන්ධ කරුණු, "ජිනායාත්"යන දඬුවම් පිළිබඳ සංකල්පය "අඛ්ලාකියයාත්" යන යහපත් ගුණාංග පිළිබඳ කරුණු යනාදී වශයෙන් ප්‍රධාන කොටස් පවතී. අඛ්ලාක් සම්බන්ධ කොටස අනෙක් සියලුම කොටස් සමග මිශ්‍ර වූ දෙයක් ලෙසත් ඒවායේ අවසාන ඉලක්කය ලෙසත් සලකනු ලැබේ. ඉස්ලාම් වූ කලි සම්පූර්ණ ජීවන ක්‍රමයක් නිසා ඉස්ලාම් පරිපූර්ණ වන්නේ අනෙක් කරුණු සමග අඛ්ලාකයන් සම්මිශ්‍රණය කිරීම තුළින් ය.

ඉස්ලාම් හැසිරීම උසස් ඉබාදතයක් ලෙස සලකයි. "කුසල" (යහපත) යනු යහපත් හැසිරීම (මුස්ලිම්) යනුවෙන් නබි (සල් ) තුමාණන් පවසා ඇති රුවන් වැකිය පැහැදිලි කරයි.

"ගැත්තා දුර්වල වූ නැමදුම්වල යෙදුන ද තම යහපත් ගුණාංගවලින් පරලොව දිනයේ දී උසස් තත්වයන් ද ගෞරවනීය තරාතිරම් ද ලඟා කර ගනියි. ඔහු තම අයහපත් ගුණාංග වලින් නිරයේ ඉතාමත් පහත් වූ තත්ත්වයක් ලබා ගනියි." (තබරානි) යන හදීසයද යහපත් ගුණාංගයන් ඉබාදත් වශයෙන් සලකුන ලබන බව පැහැදිලි කරයි.

අවසාන දූතයාණන් (සල්) මෙලොවට නබි කෙනෙකු ලෙස යවනු ලැබීමේ අරමුණ යහපත් ගුණාංග පරිපූර්ණ කිරීමටම බව පහත සඳහන් හදීසය පැහැදිලි කරයි.

"යහපත් ගුණධර්මවලින් පෝෂණය කිරීම සඳහාම මා නබි කෙනෙකු ලෙස යවනු ලැබුවෙමි." (මුවත්තා)



6 * CM 20318

“අල්ලාහ්ට ඉතාමත් සමීප පුද්ගලයා යහපත් ගතිගුණ ඇත්තායි ”යන අදහස පහත සඳහන් හදීසයෙන් මනාව පැහැදිලි කරයි.

උසාමා බින් ෂුරෙක් (රළි) තුමාණන් පවසයි. “අපි අපගේ හිස මත පක්ෂීන් වසා සිටිනවාක් මෙන් (නොසැලවී) නබි (සල් ) තුමාණන් සමග වාඩි වී සිටියෙමු. අප කිසිවෙකුත් කිසිවක් කථා කළේ නැත. එවිට සමහරුන් නබි(සල්) වෙත පැමිණ, අල්ලාහ්ගේ ගැත්තන්ගෙන් ඔහුට ඉතාමත් ආදරයට පාත්‍ර වූ පුද්ගලයා කවරෙක් දැ යි විමසූහ. එයට නබි (සල්) තුමාණන් ඔවුන්ගෙන් ඉතාමත් උසස් ගුණවන්තයාය” යනුවෙන් පිළිතුරු ලබා දුන්හ. (තබරානි)

ඊමානය පරිපූර්ණ වීමටත් යහපත් ගුණාංගයන් අවශ්‍ය බව කියන අදහස පහත සඳහන් හදීසය මගින් පැහැදිලි කරයි.

“නබි (සල්) තුමාණන්ගෙන් ඊමානයේ පරිපූර්ණ කරගත් මුඃමින් කවරෙක් ද?” යනුවෙන් ප්‍රශ්න කරනු ලැබීය. එයට “එතුමා ඔවුන්ගෙන් ඉතාමත් යහපත් ගුණාංග ඇත්තන් ය” යනුවෙන් පිළිතුරු දුන්හ. (ඉබ්නු මාජා)

“මිනිසුන් අතර ඉතාමත් උසස් ඉස්ලාමය ඇත්තා කවරෙක්ගෙන් ද යත් ඔවුන්ගෙන් ඉතාමත් උසස් විනය ඇත්තාය.” (අහ්මද්) යන හදීසය මෙම තවදුරටත් ප්‍රත්‍යක්ෂ කරයි.

යහපත් ගුණාංගයන් සමග ජීවත් වීම මෙලොව පමණක්ම නොව පරලොවේදීත් ප්‍රතිඵල ලබා දෙන එකක් බව “පරලොව දිනයේ දී මුඃමින්ගේ තරාදියේ යහපත් ගුණාංග තරම් බර වූ කිසිවක් නැත. ” (බෛහකී) යන හදීසය මගින් සනාථ කළ නබි (සල්) තුමාණන් එම හදීසය අවසානයේ දී යහපත් ගුණාංග ඇත්තවුන් එම යහපත් ගුණාංගය මගින් උපවාස කරන්නන් හා සලාත් ඉටුකරන්නන් (නැමදුම්කරුවන්) යන අයගේ තත්ත්වය ලබාගන්නා බව ද ප්‍රකාශ කර තිබේ (මුස්නද් අහ්මද්)

මේ අනුව මුහම්මද් (සල්) තුමාණන්ට ඉතාමත් සමීපවන්තයාත් පරලොව දිනයේ ස්වර්ගයේ ඉතාමත් සමීපව සිටිය හැකි පුද්ගලයාත් කවුරුන් ද යනුවෙන් විමසූ විට “ඔබලාගෙන් ඉතාමත් යහගුණාංග ඇත්තාවුන් ”(අහ්මද්) යනුවෙන් ස්ථිර කොට ප්‍රකාශ කළහ.

ඉහත සඳහන් හදීසයන්ට අනුව, “අල්ලාහ්ටත් ඔහුගේ දූතයාටත් ඉතාමත් සමීප පුද්ගලයා, මිනිසුන් අතරේ උසස්වන්තයා ඊමානයේ පරිපූර්ණ තැනැත්තා පරලොව දිනයේ දී නබි (සල්) තුමාණන්ට සමීපව සිටින්නා, පරලොවේ දී අධික කුසල් ලබාගන්නා කවුරුන් ද ?” යන ප්‍රශ්නයන්ට “ඉතාමත් උසස් ගතිගුණ ඇත්තා” යනුවෙන් පිළිතුරු ලබා දී තිබීම මෙහිදී අවධානයට යොමු කළ යුතු කරුණකි.

යහපත් විනයක් ඇතිව ශීල්වත්ව ජීවත්වීම නබි (සල්) තුමාණන්ගේ අලංකාර සුන්නාහ්වන් බවත් අපි අවබෝධ කර ගත යුතු වෙමු. ගෞරවනීය අප උත්තම නබි (සල්) තුමාණන්, නබිත්වය ලැබීමට පෙර සිටම යහපත් ආචාරධර්මවලින් යුතු පුද්ගලයෙක් ලෙස දක්නට ලැබුණහ.

එතුමාගේ ප්‍රතිවාදීන් ද එතුමාගේ මෙම කරුණ සම්බන්ධයෙන් ප්‍රශංසාත්මකව කථා කළහ. එතුමාගේ සාරධර්ම සහිත ශීලාචාර උත්තරීතර විය. යහපත් ගුණාංග එතුමා වෙත පිරී තිබුණු බවට එතුමාණන්ගේ භාර්යාවන් ද සගයන් ද එපමණක් නොව එතුමාගේ පස මිතුරන්ද සාක්ෂි දරයි. මෙවන් තත්වය අපට ඉතිහාසයේ තුළ පැහැදිලිව දක්නට හැකි ය.

සියලු මිනිස් වර්ගයාම අනුගමනය කළ හැකි උසස් ආදර්ශ එතුමා වෙත තිබෙන බව අල් කුර්ආනයේ ද පැහැදිලිව හඬ නගන්නේ මේ කරුණ නිසාය. " අල්ලාහ්වත් අවසාන දිනයත් දැඩිව විශ්වාස කරන්නන්ට අලංකාර ආදර්ශ නියත වශයෙන් ම අල්ලාහ්ගේ දූතයා වෙත ඔබට ඇත. " (33:21)

තනි මිනිසා, පවුල සමාජය යන ඒවායේ විධිමත් බව යන ඒවායේ පිබිදීමත් පිරිහීමත් කෙරෙහි යහපත් ගති පැවතුම්වලට විශාල දායකත්වයක් තිබේ. සාරධර්මයන් හි පිහිටන තනි පුද්ගලයා, පවුල, සමාජය අනෙක් අය විසින් ගෞරවයට පාත්‍රවීමත් ප්‍රශංසාවට ලක් වීමත් අපි දකිමු. එමෙන්ම ඉතාමත් අයහපත් ගති පැවතුම් ඇති තනි පුද්ගලයා, පවුල, සමාජය පිළිකුළට ලක්වීමත් පහත් තත්වයෙන් සළකනු ලැබීම ද අපට දැක ගත හැකිය.

ඉතිහාසයේ ඉස්ලාමයේ ව්‍යාප්තියටත්, එහි අඛණ්ඩ ජයග්‍රහණවලටත් යහපත් ගතිගුණ මහත් වූ පිටිවහලක් විය. මුස්ලිම්වරුන් දඃවාවලටත් (ධර්ම ප්‍රචාරය), වෙළෙඳාමටත්, අධ්‍යාපනය වෙනුවෙනුත්, වෙනත් බොහෝ කරුණු සඳහාත් අරාබියා අර්ධද්වීපයෙන් පිටවී විවිධ රටවල්වලට යන ගමනේ දී ඔවුන් සමග උසස් ගති ගුණ ද රැගෙන ගියහ.

මුස්ලිම්වරුන් පිබිදීමටත් ඉස්ලාමය ස්වදේශිකයන් අනුගමනය කිරීමටත් හේතු වූයේ මේ කරුණුමය. ලංකාව දකුණු ඉන්දියාව, මාල දිවයින යනාදී දකුණු ආසියා රටවල්වලත් මැලේසියාව, ඉන්දුනීසියාව, බුරුනෙ යනාදී අග්නිදිග ආසියානු රටවල්වලත් ඉස්ලාමය විජයග්‍රහණය කිරීමට මුස්ලිම්වරුන්ගේ ගතිගුණම මහත් වූ හේතුව විය.

එබැවින් ඉස්ලාම් යහපත් ගුණාංගවලට ලබා දී තිබෙන වැදගත්කම අවබෝධ කරගෙන, ඒවා අපගේ ජීවිතයේ සම්පූර්ණ වශයෙන් අනුගමනය කර පරිපූර්ණ මුඃමින් කෙනෙකු ලෙස ජීවත් වීමට උත්සාහ කරමු.

## අහ්ලාක් - ඊමාන් හා ඉබාදත් අතරේ වූ සමීප සම්බන්ධතාව

දේව ධර්මය වූ අල් කුර්ආනය සහ අවසාන දූතයන්ගේ හදීස් යහපත් ගතිගුණත්, ඊමානයත් ඉබාදතයත් (නැමදීම) අතර ඉතාමත් සමීප සම්බන්ධතාවයක් තිබෙන බව ගෙන හැර පායි. ඒවා පහත විස්තර කර ඇත.

## 02. අල්හාක් - ඊමාන් සම්බන්ධතාව

අල් කුර්ආනය සහ අල් හදීසය යහපත් ගුණාංග ඊමානයත් සමග සම්බන්ධ වූවක් ලෙස පෙන්වයි. මුඃමින් කෙනෙකු සදාචාරාත්මක නොවන පුද්ගලයෙකු ලෙස නොසිටිය යුතු බව මෙයින් අදහස් කරයි.

ඊමාන් යන පදනම (ශක්තිය) යහපත් ගුණාංග කරා මිනිසාට මඟ පෙන්වීමක් කරයි. " විශ්වාසවන්තයනි, නුඹලා අල්ලාහ්ට බියවී (වචනයෙන් හා ක්‍රියාවෙන්) සත්‍ය වන්තයන් සමග සිටින්න" (අත්තව්බා ; 9:119) ලෙස අල්කුර්ආන් විස්තර කරයි. "ලැජ්ජාශීලී බවත් ඊමානයත් එකිනෙක ඒකාබද්ධව පවතී. එකක් ඉවත් වූ විට අනෙකත් ඉවත්වී යයි." (හාකිම් - තබරානි) යන හදීසයන් යහපත් ගුණාංග හා ඊමානය අතර තිබෙන සමීප සම්බන්ධතාව විස්තර කරයි.

අල්ලාහ්වත් පරලොව දිනයත් විශ්වාස කිරීමත් සමග යහපත් ගුණාංග ද, ඒකාබද්ධ කරමින් බොහෝ හදීසයන් පවතී. "කවරෙක් අල්ලාහ්වත් පරලොව දිනයත් විශ්වාස කර තිබෙන්නේ ද ඔහු හොඳ දේ පමණක් කථා කරත්වා දූන් එසේ නැතහොත් නිශ්ශබ්දව සිටිත්වා (බුහාරි) යනාදී හදීසයන් මෙයට නිදසුන් වේ.

අශීලාචාර ලෙස හැසිරීම ඊමානය දුර්වල කරන අතර එය විනාශ කරන බව ද හදීස් මනාව පැහැදිලි කරයි. "අල්ලාහ් මත දිවුරා කියමි. (ඔහු ඊමාන් දාරියෙකු නොවේ.)" අල්ලාහ් මත දිවුරා කියමි. නියත වශයෙන්ම ඔහු ඊමාන්දරියෙකු නොවේ. (විශ්වාසවන්තයෙකු) යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූ විට ඔහු කවරෙක් ද? අල්ලාහ්ගේ දූතයාණෙනි! යනුවෙන් විමසූ සමයේ එයට පිළිතුරු දුන් එතුමාණන් කවරෙකුගේ හිංසාවලින් ඔහුගේ අසල්වැසියා ආරක්ෂා නොලැබුවේ ද ඔහුමය" යනුවෙන් පිළිතුරු ලබා දුන්හ. (බුහාරි) අසල්වැසියන්ට කරදර කිරීම කෙනෙකුගේ ඊමානය පළුදු කරන බව ඉහත සඳහන් හදීසය පැහැදිලිව පවසයි.

ඊමානයට බාධා කරන "නිෆාක් " යන කුහකකමේ ලක්ෂණ ගැන නබි(සල්) තුමාණන් සඳහන් කළ සියල්ල යහපත් ගුණාංගවලට පටහැනි දේවල් බව පෙන්වාදීම සුදුසුය.

"කවරෙක් වෙත ගුණාංග 3ක් තිබෙන්නේ ද ඔහු මූනාෆික් (කුහකයන්) වෙයි. ඔහු උපවාස රැක, සලාතය ඉටුකර, හජ් ඉටුකර, උම්රා ඉටුකර තමා මුස්ලිමෙකු ලෙස ප්‍රකාශ කළ ද, ඔහු කථා කළ විට බොරු පවසයි. පොරොන්දු කඩකරයි. විශ්වාස කළහොත් වංචා කරයි." (මුස්ලිම්)

"තවත් හදීසයක ලක්ෂණ 4ක් වශයෙන් පවසා ඉහත සඳහන් 3ත් සමග හතරවන ගුණාංගය වශයෙන් " තර්ක කළහොත් ඉච්ඡා බස් යොදාගනී" යනුවෙන් ප්‍රකාශ කර සිටියි. (බුහාරි)

එබැවින් "ඊමානයත් සදාචාරයත් එකිනෙකට සම්මිශ්‍රවූ දෙයක් බවත් එක් මුඃමිනු කෙනෙකු යහපත් ගුණාංග නැති ත්ත්වය මත මුස්ලිමෙකු ලෙස ජීවත් වීමට නොහැකි බව ඉහත සඳහන් කරුණුවලින් අවබෝධ කර ගනිමු.

## 03. අහ්ලාක් - ඉබාදත් අතර සම්බන්ධතාව

යහපත් ගුණාංග හා නැමදීම් අතරේත් ඉතාමත් සමීප සම්බන්ධතාවයක් තිබේ. ජනතාව මත අනිවාර්ය කර තිබෙන මූලික වගකීම් තුළින් යහපත් ගුණාංග ඇති මුස්ලිම්වරුන් බිහි කිරීමට ඉස්ලාම් නිතර උත්සාහ කරයි. අල් කුර්ආනයත් අල්හදීසයත් මෙය පැහැදිලිව පෙන්වා දෙයි.

### සලාතය - නැමදීම

එක් මුඃමින් කෙනෙකු සලාතය ක්‍රමවත් ද, නිසි වේලාවට ද, නියමාකාරවද ඉටු කිරීම මගින් පහත් ක්‍රියාවෙන් ද, පව්වලින් ද පාරිශුද්ධ විය යුතු බව පහත සඳහන් දේව වාක්‍යය පැහැදිලි කරයි.

“සලාතය ඉටු කිරීම, අනුමගනය කරන්න! මන්ද නියත වශයෙන්ම සලාතය, ලැජ්ජා සහගත ක්‍රියාවන්ගෙනුත් පව්වලිනුත් (මිනිසාව) ඉවත් කරයි.” (29:45)

සූරතුල් මාඌන් ද මෙම අදහස තවදුරටත් තහවුරු කරයි.

### සකාත් - දුගී බද්ධ

සකාත් ලබාදීමේ අරමුණ මිනිසාව ලෞකික වශයෙනුත්, අධ්‍යාත්මික වශයෙනුත් පාරිශුද්ධ කිරීමය. අල්කුර්ආන් එය පහත සඳහන් ආකාරයට ප්‍රකාශ කරයි.

“(නබිතුමණි, ඔවුන් තමන්ගේ වැරැද්දට ප්‍රතිකාරයක් වශයෙන් ගෙනවිත් තිබෙන) ඔවුන්ගේ වස්තුන් දනයක් ලෙස ඔබ පිළිගෙන, (බාහිරව හා අභ්‍යන්තරව) ඔවුන්ව පිරිසිදු කර එය මගින් ඔවුන්ව පාරිශුද්ධ කර (භාග්‍යවන්තයන් කරන ලෙස) ඔවුන්ට ආශිර්වාද කරන්න.” (9:103)

දේවදූතයාණන් “සදකා” යන වචනයේ අර්ථය ඉතාමත් පැහැදිලිව පෙන්වා දී ඇත. ඒ තුළ අධික යහගුණාංග අඩංගු වී තිබේ.

“නුඹ නුඹගේ සහෝදරයාගේ මුහුණ බලා සිනාසීම ද නුඹට සදකා වේ.”

“ඔබ යහපත පතුරවා අයහපත වැලැක්වීම ද යහපතක් වේ. ” “මග වැරදුණු කෙනෙකුට මාර්ගය පෙන්වා දීමද ඔබට සදකාවක් වේ.” “විනාශයන් ඇති කළ හැකි ගල්මුල් යනාදිය මාර්ගයෙන් ඉවත් කිරීම ද, සදකාවක් වේ.“යනුවෙන් ප්‍රකාශ කරන, පැහැදිලි කරන හදීසයන් සහීහුල් බුහාරියේ සඳහන් වී තිබීම මෙයට සාක්ෂියක් වශයෙන් පවතී. මේ යහපත් ගුණාංග සියල්ල සදකා සහ කුසල් ලබාදෙන ක්‍රියාවන් ලෙස ගෙන හැර දක්වයි.

### උපවාසය

“උපවාසයේ ප්‍රධාන අරමුණු දේව හැඟීමෙන් යුතු මුඃමින් කෙනක්ව සූදනම් කිරීමය” යන්න අල්කුර්ආනය විවරණය කරයි.

“විශ්වාසවන්තයිනි, ඔබට පෙර සිටියවුන්ට නියම කළ ආකාරයට ඔබ වෙතත් උපවාස රැකීම අනිවාර්ය කර ඇත. (එයින්) ඔබලා පාරිශුද්ධවන්තයින් විය හැක.” (2:183)

උපවාසය යහපත් ගුණධර්ම බිහි නොකලේ නම් එම උපවාසයේ කිසිදු ප්‍රතිඵලයක් නැති බව බොහෝ හදීසයන් තහවුරු කරයි.

"කවරෙක් බොරු කථා කිරීමත්, අයහපත් ක්‍රියාවත් අත් නොහැරියේද ඔහු තම ආහාරයත්, පානයත් අත්හැරීමෙන් අල්ලාහ්ට කිසිදු අවශ්‍යතාවයක් නැත." (බුහාරි)

"උපවාසය යනු කෑම ගැනීමෙනුත් පානය කිරීමෙනුත් වැලැකී සිටින කාර්යයක් නොවේ. ඇත්ත වශයෙන් ම උපවාසය යනු නාස්තිකාර දේවල් හා අයහපත් දේවල් අත්හරින දෙයකි. කවරෙක් හෝ උපවාසය රකින කෙනෙකුට බැන වැදුනහොත්, නැතහොත් කෝපයට පත් කළහොත් "මම උපවාසය රකින්නෙක්මි." යනුවෙන් ප්‍රකාශ කරන්න. "(ඉබ්නු කුසෙමා)

## හජ්

හජ් මගින් ද යහපත් ගුණාංග ද අධ්‍යාත්මික යහපත් භාවයක් ඇති විය යුතු බව ඉස්ලාම් බලාපොරොත්තු වේ. ඒ සඳහා එක්තරා පුහුණුවක් වශයෙන් හජ් වත්පිලිවෙත් අල්ලාහ් ඇති කර තිබේ.

"එබැවින්, ඒ අතරෙ කවරෙක් හෝ (ඉහ්රාම් ඇඳ) හජ් (තමා මත) අනිවාර්ය කර ගත්තේ ද හජ් (මාසයේ 10 වැනි දින) දක්වා සංසර්ගයේ යෙදීම, පරුෂ වචන පැවසීම, ගැටුම් ඇති කර ගැනීම, තහනම්ය." (2:197)

පොදු වශයෙන් මුස්ලිම් කෙනෙක් නැමදීම් වත් පිළිවෙත්වලට වැඩි අවධානයක් යොමු කරන්නාක් සේ තමාගේ ජීවිතයේ යහපත් ගුණාංග වර්ධනය කර ගැනීමටත් ප්‍රධානත්වයක් ලබාදිය යුතු බව ඉස්ලාමයේ මග පෙන්වීම වේ. යහපත් ගුණාංග නැති නැමදුම් කරුවන්ව ඉස්ලාම් පිළිගන්නේ නැත. මෙය පහත සඳහන් හදීසය තහවුරු කරයි.

එක් මිනිසෙකු "අල්ලාහ්ගේ දූතයාණෙනි ! එක් කාන්තාවක් සිටිනවා ඇය අධික ලෙස සලාත් උපවාසය, දන්දීම් කරන්නියක් වශයෙන් දකින්නට ලැබෙනවා. එනමුත් ඇය තම දිවෙන් අසල්වැසියන්ට කරදර කරන්නීය." යනුවෙන් පැවසුවේය. එයට නබි(සල්) තුමාණන් "ඇය අපායේ සිටී" යනුවෙන් ප්‍රකාශ කළහ. එම තැනැත්තා නැවතත් "අල්ලාහ්ගේ දූතයාණෙනි, තවත් කාන්තාවක් සලාතය උපවාසය අඩුවෙන් සිදු කරයි. ඇය ගිතෙල් ද, පරිත්‍යාග කරයි. එනමුත් ඇය තම අසල්වැසියන්ට කරදර කරන්නේ නැත" යනුවෙන් ප්‍රකාශ කළේය. එයට නබි (සල්) තුමාණන් "ඇය ස්වර්ගයේ සිටියි" යනුවෙන් ප්‍රකාශ කළහ" ( අහ්මද්)

"එක් දිනක් නබි (සල්) තුමාණන් තම සගයන් අමතමින්, "බංකොලොත්කරු කවරෙක් ද?" යනුවෙන් ඔබලා දන්නේ ද? යනුවෙන් ඇසූහ. එයට ඔවුන් කවරෙක් වෙත දිර්හම් හා ධනය නොතිබෙන්නේ ද, ඔහු අප වෙතින් බංකොලොත්කරුවෙකු ලෙස

හඳුන්වමු ” යනුවෙන් ප්‍රකාශ කළහ. එයට නබි (සල්) තුමාණන්, “මගේ සමාජයේ බංකොලොත් තත්ත්වය ලැබූ තැනැත්තා කවරෙක් ද, යත් පරලොව දිනයේ දී ඔහු සලාතය, සකාත් උපවාසය සමග පැමිණේ, එමෙන්ම ඔහු කෙනෙකුට බැණ වැදී තිබිය හැකිය. තවත් කෙනෙකුගේ ධනය පැහැරගෙන තිබිය හැකිය; තවත් කෙනෙකුගේ රුධිර හෙලා තිබිය හැකිය. තවත් කෙනෙකුට පහර දී තිබිය හැකිය. ඔහුගෙන් පීඩනයට ලක් වූ සැමෝටම ඔහුගේ කුසලෙන් දෙනු ලැබේ. ඔවුන්ට ලබාදිය යුතු දේ අවසන්වීමට ප්‍රථමයෙන් ඔහුගේ කුසලයන් අවසන් වූවහොත් පීඩනයට ලක් වූවන්ගේ අකුසල් ගෙන ඔහු මත පවරා පසුව නිරයට විසි කරනු ලැබේ.” යනුවෙන් විස්තර කළේය.” (මුස්ලිම්)

එබැවින් නැමදීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතර තුර අවසාන ඉලක්කය වූ යහපත් ගුණාංග අපි තුළ වර්ධනය කරගෙන අයහපත් ගුණාංගය අපෙන් ඈත් කර ගනිමු.

## 04. ඊමානීය ගුණාංග

මුඃමින්වරුන් යහපත් ගුණාංග ලබා තිබිය යුතු යි. ඊමාන්ධාරීන් (විශ්වාසවන්තයින්) ඉතා උසස් ගති ගුණ ඇත්තන් වශයෙන් සැලකිය යුතුයි., යනුවෙන් අල්කුර්ආනයත්, අල් හදීසයත් බලාපොරොත්තු වේ. ඒ සමග ඉස්ලාමයේ මූලික අංගයක් වූ ඊමාන් බොහෝ යහපත් ගුණාංගයන් වර්ධනය කරගැනීමට ඇරයුම් කරයි. ඒවායින් සමහර විශේෂ ගුණාංග කෙරෙහි අපි අවධානය යොමු කරමු.

### ඉඛ්ලාස් (පාරිශුද්ධත්වය - දේව බිය)

චිත්ත පාරිශුද්ධත්වය යනුවෙන් හැඳින්වෙන ඉඛ්ලාස් අල්ලාහ්ගේ සමීපත්වය ආදරය කරන්නෙකු වශයෙන් ඔහුට අවනත වී, ඔහු වෙනුවෙන්ම ක්‍රියාවන් කිරීම අදහස් කරයි. අනෙක් මිනිසුන්ගෙන් ප්‍රශංසාවට ලක්වීමට හෝ අනෙක් අයගේ පැහැදීමට පාත්‍රවීමට හෝ වෙනත් ලෞකික හේතු නිසා නොව අල්ලාහු තආලාවම පමණක් අරමුණු කිරීම ඉඛ්ලාස් යනුවෙන් හැඳින්වේ.

මිනිසා කුමන හෝ ක්‍රියාවක් සිදු කරන විටදීත් ඔහු කවරෙකු වෙනුවෙන් කුමක් සඳහා එය කරන්නේ ද යන හැඟීම ඔහු තුළ ස්ථාපිතවේ. එලෙස බිහිවන අභ්‍යන්තර සිතුවිල්ල අල්ලාහ් වෙනුවෙන් පැවතිය යුතු ය යන්න ඉස්ලාමයේ අරමුණවේ.

ඉඛ්ලාස් සෑම මුස්ලිම් කෙනෙකු වෙතින්ම බලාපොරොත්තු වන ප්‍රධාන ගුණාංගයක් බව අල් කුර්ආනයත් අල්හදීසයත් පැහැදිලිව ප්‍රකාශ කරයි.

තවද, ඔවුන් අල්ලාහ් කෙරෙහි ඇති හිතවත්කම හේතුවෙන් දුගියන්ටත්, අනාථයන්ටත්, සිරභාරයට ලක්වූවන්ටත් ආහාර ලබාදෙමින් සිටියහ. “අප ඔබලාට ආහාර ලබාදෙන්නේ අල්ලාහ් වෙනුවෙන් හැර ඔබලාගෙන් අප යම් කුළියක් හෝ (නුඹලා අපට) ස්තුතිවන්තවීම සැලකිල්ලට ගෙන නොවේ.” (යනුවෙන් ප්‍රකාශ කරත්.) (76:8,9)

දේව දූතයාණන් අල්ලාහ්ට අවනත වී කරන ක්‍රියාවන් සහ සාමාන්‍ය ක්‍රියාවන් යනුවෙන් ගෙන හැර දක්වා හැරවුම් ලක්ෂයක් වශයෙන් ඉහ්ලාසය දක්වා ඇත.

"ක්‍රියා සියල්ල චේතනා පරිදි සිදුවේ. (සැලසුම් කරනු ලැබේ.) සෑම මිනිසෙකුටම තම චේතනාවට අදාළ දේම හිමි වේ. කවරකුගේ හිජ්රතය අල්ලාහ්ටත් ඔහුගේ දූතයා වෙනුවෙන් පැවතිය යේ ද? ඔහුගේ හිජ්රතය අල්ලාහ්ටත් ඔහුගේ දූතයා වෙනුවෙනුත් ඉටුවේ. කවරකුගේ හිජ්රතය ලෞකික දේ ලබාගැනීමට හෝ එක් කාන්තාවක්ව විවාහ කරගැනීමට හෝ සිදුවූයේ ද ඔහුගේ හිජ්රතය එය වෙනුවෙන් සිදුවේ. " (බුහාරි මුස්ලිම්)

ඉස්ලාමීය ෂරිආවේ නැමදුමක් වුවද, ලෞකික කටයුත්තක් වුවද, අල්ලාහ්ගේ පිළිගැනීමට ලක්වීමට කොන්දේසි දෙකක් තිබේ.

පළමුවැන්න එම ක්‍රියාව ඉහ්ලාසයෙන් සිදු කළ යුතුයි. දෙවැන්න අදාළ ක්‍රියාව නබි (සල්) තුමාණන් මග පෙන්වූ ආකාරයට නැතහොත් ෂරිආවේ පිළිගැනීමට ලක්වූ ක්‍රියාවක් ලෙස තිබිය යුතුයි.

මෙම අදහසින් වත් පිළිවෙත් සිදු කරන්නේ නම් ඉහ්ලාසයත් නබි (සල්) තුමාණන් මඟ පෙන්වූ මාර්ගයත් අනුගමනය විය යුතු ය. සාමාන්‍ය ක්‍රියාවක් කරන විට ද ඉහ්ලාසය සහ ෂරිආවේ පිළිගැනීමක් තිබිය යුතු ය. නබි (සල්) තුමාණන් පහත සඳහන් ආකාරයට ප්‍රකාශ කළේ ඒ නිසාය.

"යම් කිසිවෙකු ගොඩනැගිල්ලක් අසාධාරණයක් සිදු කිරීමේ අරමුණ හෝ බලහත්කාර අරමුණෙන් තොරව ගොඩනගන්නේ ද, එසේ නැතහොත් අසාධාරණය හෝ බලහත් කිරීමේ අරමුණෙන් තොරව යම් බෝගයක්, සිටුවන්නේ ද, ඒවා මගින් රහ්මාන්ගේ (කරුණාවන්තයාගේ) මැවීම් ප්‍රතිඵල ලබාගන්නා කාලය පුරාම අඛණ්ඩව කුසල ලබාදෙන්නක් වශයෙන් එය වෙනස් වේ. "(අහ්මද්)

සමහර අවස්ථාවන්වලදී සත්‍ය ඉහ්ලාසීය චේතනාව නිසා පිරිසිදු වැඳුම් පිදුම් නොකිරීමෙන් වුවද යහපත ලබා දිය හැකි තත්ත්වයක් ඇති විය හැකි බව අල්කුර්ආනයත් අස්සුන්නාහ්වත් පිළිබිඹු කරයි.

"කවරෙක් හෝ තම නිවසෙන් පිටමං වී අල්ලාහ් වෙතත් ඔහුගේ දූතයා වෙතත් හිජ්රත් කරන මගෙහි මරණයට පත්වුවහොත් ඔහුගේ ත්‍යාගය ඇත්ත වශයෙන් අල්ලාහ් මත අනිවාර්ය වී අවසන්ය. අල්ලාහ් ක්ෂමා කරන්නාත්, ආදරය දක්වන්නාත් වේ. (4:100)

"තබූක්" යුද්දයට සහභාගි නොවී සිටි සමහරුන් ගැන නබි (සල්) තුමාණන් "අපට පිටුපස මදිනාවේ සමහරුන් සිටී, අප කඳු ශිඛරයක් හෝ කඳුවැටියක් හරහා ගමන් කරන සියලුම අවස්ථාවේ දී ඔවුන් ද අප සමග සිටී" යනුවෙන් ප්‍රකාශ කළහ. (බුහාරි)

ඉහ්ලාසයට පිටුපා ජීවත්වීම විශාල හානියක් ඇති කළ හැකිය. එයින් එකක් මුණිච්ඡාව වේ. මුනිච්ඡාව යනු අනෙක් අය වෙනුනේ සටන් කිරීම වේ. එය විශාල ඉබාදතය පවා විනාශ කර දමන බව අල්ලාහ් අල්කුර්ආනයේ සූරතුල් මාඌන් හි විස්තර කරයි.



7* CM 20318

"කුඩා ප්‍රමාණයේ මූනිච්ඡාවක් වුවද ෂිර්ක් වේ." (හාකිම්) යන අදහස් මගින් මූනිච්ඡාව අල්ලාහ්ට ආදේශ කිරීමේ විශාල පව කරා ගෙන යන බව නබි (සල්) තුමාණන් පැවසූහ.

එබැවින් "නිශ්චිත වශයෙන්ම අල්ලාහ් ඔබගේ ශරීරය හෝ පෙනුම හෝ බලන්නේ නැත. ඔහු බලන්නේ ඔබගේ සිතුවිල්ල සහ ක්‍රියාවය." (මුස්ලිම්) යන හදීසය මුල් කරගෙන අපගේ ජීවිත සැලසුම් කර ගනිමු.

## යුක්තිය, සාධාරණය

ඊමානීය ගුණාංග අතරින් සාධාරණව, යුක්ති සහගතව ජීවත් වීමත් ඉතාමත් වැදගත්ය. මධ්‍යස්ථව කටයුතු කිරීම පක්ෂග්‍රාහී නොවී කටයුතු කිරීම සෑම කෙනෙකුටම ඔවුන්ට අයිති දේවල් ලබාදීම සාධාරණත්වය යනුවෙන් සලකනු ලැබේ.

මෙම ගුණාංගය බොහෝ ස්ථානවල - අල්කුර්ආන් අවධාරණය කරයි.

"(විශ්වාසවන්තයිනි ! ඔබව විශ්වාස කර ලබා දුන්) ආරක්ෂා කළ යුතු වස්තූන් එහි අයිතිකරුවන්ට ලබාදෙන ලෙසත් මිනිසුන් අතරේ ඔබලා විසඳුම් ලබා දුනහොත් (පක්ෂග්‍රාහිත්වයෙන් තොරව) යුක්ති සහගතවම විසඳුම් ලබාදෙන ලෙසත් අල්ලාහ් ඔබට අණ කරයි." (4:58)

සාධාරණත්වය බොහෝ ක්‍රමවලින් ප්‍රකාශ වේ. පොදු වශයෙන් විසඳුම් ලබාදෙන විට සාධාරණය ඉටු කිරීම පදනමක් වශයෙන් ගනු ලැබේ. ඉහත සඳහන් අල්කුර්ආන් වාක්‍ය එයට හොඳ නිදසුනකි. යුතුකම් හා වගකීම් පැවරෙන විට සාධාරණය ඉටු කළ යුතුයි. සාක්කි දෙන විට ද සාධාරණය අනුගමනය විය යුතුයි.

"විශ්වාසවන්තයිණි! සාධාරණය ඉටු කිරීමෙහිලා අල්ලාහ් වෙනුවෙන් ඔබ ස්ථිර සාක්ෂිකරුවන් වශයෙන් සිටින්න." (5:8)

ඒ සමගම යහපත ප්‍රචලිත කර අයහපත වළක්වන විට ද සාධාරණත්වයෙන් සිදු කළ යුතු ය.

"ඔබලා කුමක් පැවසුවද (එයින් පීඩනයට පත්වන්නේ ඔබගේ ඥාතියෙකු වුවද) යුක්තියම පවසන්න." (6:152)

කිරුම් මිනුම් වලදීද සාධාරණය ඉටු විය යුතුය.

"මිනුම් (නිවැරදි ක්‍රමයට ) සම්පූර්ණයෙන් මනින්න. බර සාධාරණව පිහිටුවන්න." (6:152)

මක්සූම් ගෝත්‍රයට අයත් කාන්තාවක් සොරකම් කළාය. එම කාන්තාව වෙනුවෙන් උසාමා බින් සෛද් (රළි) තුමාණන් ආයාචනා කිරීමට පැමිණි අවස්ථාවේ නබි (සල්) තුමාණන් උසාමා (රළි) වෙත "අල්ලාහ් ලබාදුන් දඬුවම සම්බන්ධයෙන් ඔබ ආයාචනා

කරන්නේ ද? අල්ලාහ් මත දිවුරා කියන්නම් මුහම්මද්ගේ දුව ෆාතිමා සොරකම් කළ ද ඇයගේ අත සිඳිමි" යනුවෙන් ප්‍රකාශ කළහ (බුහාරි, මුස්ලිම්)

සත්‍ය විශ්වාසවන්තයෙක් (මුඃමින්) අසාධාරණ කරන්නේ නැත. "අසාධාරණය කිරීමට බය වෙන්න. ඇත්ත වශයෙන්ම අසාධාරණය කිරීම පරලොව දිනයේ දී අඳුරක් වේ. "(මුස්ලිම්) යනුවෙන් නබි (සල්) තුමාණන් පෙන්වා දුන්හ.

අල්ලාහු තආලා තම අනුගාමිකයන් අසාධාරණය කිරීම තහනම් කර ඇත. හදීස් කුද්සි එකක් පහත ආකාරය ප්‍රකාශ කරයි. "මාගේ ගැත්තනි, අසාධාරණය කිරීම මා මටම තහනම් කර ගත්තෙමි. එය ඔබලා අතරේ ද තහනම් කළෙමි. ඔබලා එකිනෙකා අතරේ අසාධාරණයක් සිදු නොකර ගන්න." (මුස්ලිම්) අසාධාරණ කිරීම මුස්ලිම් කෙනෙකුගේ ගුණාංගයක් නොවේ යන්න නබි (සල්) තුමාණන් පැහැදිලිව සඳහන් කරයි.

"එක් මුස්ලිම් කෙනෙකු තවත් මුස්ලිම් කෙනෙකුගේ සහෝදරයෙක් වෙයි. ඔහුට ඔහු අසාධාරණ සිදුකරන්නේ නැත." (බුහාරි)

මුස්ලිම් නොවන අය සම්බන්ධව ද අසාධාරණයක් සිදු නොවිය යුතු බවට අල්කුර්ආනය අවධාරණය කරයි.

"(විශ්වාසවන්තයිනි! ) ආගමික කටයුත්තෙහි ඔබලාට එරෙහිව යුධ නොවදින්නන්ටත් ඔබගේ නිවසෙන් ඔබලාව පිටමං නොකල අය සඳහාත් ඔබලා යහපත ඉටු කිරීමත්, ඔවුන් සමග ඔබලා සාධාරණයෙන් කටයුතු කිරීමත් අල්ලාහ් ඔබලාට තහනම් කළේ නැත. ඇත්ත වශයෙන් ම අල්ලාහ් සාධාරණය ඉටු කරන්නවුන්ව ප්‍රිය කරයි. " (60:80)

එබැවින් අප ද සියලුම අවස්ථාවන්වලදී සාධාරණය ඉටු කර අසාධාරණය පිටු දකිමු.

## ඉවසීම

ඉවසීම ඉතාමත් යහපත් ගුණාංගවලින් එකකි. උත්තරීතර නබිවරුන්ගේ උසස් ගුණාංගවලින් මෙයත් එකකි. අල්ලාහ්ගේ ශුද්ධ නාමයන්ගෙන් ඉතාමත් ඉවසිලිවන්තයා යන අදහස දෙන "අස්සබූර්" යන්නද එකකි. අල්කුර්ආනයේ සාමාන්‍යයෙන් ස්ථාන 70ක පමණ ඉවසීම ගැන සඳහන් කර තිබීම මෙහි වැදගත්කම සනාථ කරන විශේෂ සාධකයකි.

"ඉවසිලිවන්තයන් තමාගේ කුළිය අධික ලෙස ලබාගනියි." (39:10) එනමුදු ඔවුන් මෙලොව (දුෂ්කරතාව) ඉවසමින් සිටිය නිසා ස්වර්ගයත් (ඇඳීමට) සේද වස්ත්‍රයත් ඔවුන්ට කුළිය වශයෙන් ලබා දුනි. (76:12)

දේව දූත (සල්) තුමාණන් ද ඉවසීමේ වැදගත්කම ගැන බොහෝ හදීසයන්හි පෙන්වා දුන් අතර තම ජීවිතයේද එය අනුගමනය කර ඇත. "ඉවසීම යනු එක් ආලෝකයකි" (මුස්ලිම්).

ඉවසීමෙන් කටයුතු කරන්නාට අල්ලාහ් ඉවසීමේ ගුණාංගය ලබා දේ. තව ද ඉවසීමට වඩා කෙනෙක් ලබාගත් විශේෂ සම්මාන වෙන කිසිවක් නැත. (බුහාරි)

නබි (සල්) තුමාණන්ගේ මක්කා ජීවිතය පුරාම ඉවසීමේ ගුණාංගය ඉතාමත් පැහැදිලිව දක්නට ලැබේ. කුරෙෂිවරුන් ඉස්ලාම් ව්‍යාප්ත වීමට විරුද්ධව සිදුකළ ක්‍රියාවන් නිසා දුෂ්කරතාවන්ට හා දුක්ගැහැටවලට ලක්විය. නබි (සල්) තුමාණන් නැමදීමේ දී කදීජා තුමියගේ බාධාවන් ඇති කිරීමත් තායිබ් නගරයට ගිය මොහොතේ දී මුහුණ දුන් අභියෝගයන් කතීජාතුමියගේ හා අබූතාලිබ් යන අයගේ මරණය යනාදී අවස්ථාවන් සියල්ලේම නබි (සල්) තුමාණන් මානසිකව බිඳ නොවැටී ඉවසිලිමත් වූ අවස්ථාවන් වේ.

ඉවසීමේ ප්‍රභේද කීපයක් ඇත.; ඒවායින් සමහරක් නම් :

(අ) **අවනත වීමේ දී සිදුකරනු ලබන ඉවසීම**

මෙය ඉස්ලාම් අණ කර තිබෙන සලාතය වැනි වගකීම ඉටුකිරීමේදීත්, අඛණ්ඩව සිදු කිරීමේදීත් අනුගමනය කරනු ලබන ඉවසීමයි. එම යුතුකම ජීවිතය පුරා අනුගමනය කිරීමට ඉවසීම අවශ්‍ය වේ.

(නබිවරයාණෙනි!) සලාතය ඉටු කරන ලෙස ඔබ ඔබගේ පවුලේ අයට අණ කරන්න. ඔබ ද ඒ මත ස්ථිරව පිහිටනු." (20:132)

"(නබිවරයාණෙනි) කවරෙක් තම දෙවියන්ගේ කැමැත්ත අපේක්ෂා කොට ඔහුට දිවා-රාත්‍රී (ප්‍රාර්ථනා) කර කැඳවමින් සිටින්නේ ද, ඔවුන් සමග ඔබ (ඔබගේ) දුෂ්කරතාව ඉවසා දරා සිටින්න." (18:28)

(ආ) **පවෙන් වැළකීම හා ඉවසීම**

අකුසල් ක්‍රියාවන් හා කාමුක ආශා චිත්තාකර්ශනීය බැවින් ඒවායින් මිදී තමන් ආරක්ෂා කර ගැනීමට ඉවසීම අවශ්‍ය වේ.

"මාගේ දෙවියනි! අප වෙත ඉවසීම ලබා දෙන්න. (ඔබට) සම්පූර්ණයෙන් අවනත වූවෙකු ලෙස (අපව පත් කර ) අපව ඔබ අත්පත් කරගනිත්වා !" (7:126)

(ඉ) **ශෝක ජනක අවස්ථාවේ දී තිබෙන ඉවසීම**

ලෞකික ජීවිතයේ යථාර්ථවලින් එකක් වන ප්‍රාණය, දේපළ අහිමිවන අවස්ථාවන් වල දී විශ්වාසය පළුදු නොකර සියදිවි නසා නොගෙන සිටීමට ඉවසීම අවශ්‍ය වේ. දේපළ, පවුල, නිලය තත්ත්වය යනාදියෙන් ඇති වන අහිමිවීම් යන අවස්ථාවල මුඃමින් කෙනෙක් ඉවසිලිවත්ව සිටියි. එය ඔහුට යහපතක් ලෙසම පවතී.

"(විශ්වාසවන්තයිනි ! එක්තරා ප්‍රමාණයක, බියෙන් ද, කුසගින්නෙන් ද, දේපළ, ප්‍රාණය, අස්වනු ආදියේ අලාභයෙනුත් ඇත්ත වශයෙන්ම අප ඔබව පරීක්ෂා කරන්නෙමු. එනමුත් (නබිතුමණි ! මෙම පරීක්ෂණවලින් ඇතිවන අලාභය පිළිබඳ)

ඉවසීමෙන් සිටින්නවුන්ට ඔබ ශුභාශිංසනය ලබා දෙන්න. (පරීක්ෂණයට ලක්වන ඔවුන්) තමන් තුළ කෙතරම් දුෂ්කරතාව ඇති වුව ද ඇත්ත වශයෙන්ම අප අල්ලාහ් වෙනුවෙන්ම සිටින්නෙමු. “ඇත්ත වශයෙන්ම අප ඔහු වෙත යන්නෙමු ” යනුවෙන් පවසයි. අල්ලාහ්ගේ ආශිර්වාදය හා දයාව ලැබෙන්නේ මෙවන් අය වෙතය. තව ද, ඍජු මාර්ගය ලබා ගත්තවුන් මොවුන් ය. (2:155:157)

**යටහත් පහත්භාවය**

ආඩම්බරය, මමත්වය හා උඩඟුකමින් තොර, අනෙක් අය උස් පහත් නොකර සංවර ලෙස හැසිරීම මුඃමින්වරයෙකුගේ ලක්ෂණයයි. අල්ලාහ්ගේ අණ පිළිගෙන අවනත වීමෙන් මෙම ගුණාංගය ඔහු වෙත ලබා දේ. එලෙස ඔවුන් කටයුතු කරන නිසා අල්ලාහ්ගෙන් උසස් තත්ත්වයත් ගෞරවනීයත්වයත් ලබා ගනියි. නබි (සල්) තුමාණන් මෙහි විශේෂත්වය පිළිබඳ පවසන වාක්‍ය බලන්න.

“කවරෙකු හෝ අල්ලාහ් වෙනුවෙන් අවනත වුවහොත් ඔහුගේ ත්ත්වය අල්ලාහ් උසස් කරන්නේම ය.” (මුස්ලිම්)

“කීකරුව සිටින්න. ඔබලාගෙන් කෙනෙකු අනෙකා මත අහංකාර නොවන්න. අසාධාරණ නොකරන්න; අසාධාරණ නොකරන ලෙස අල්ලාහ් මට වහී පහළ කළේය.” (මුස්ලිම්)

ධනය, අධ්‍යාපනය, තනතුර, තත්වය, වරප්‍රසාද යනාදිය වැඩි වන සෑම විටකදීම සංවරභාවය ද වැඩිවිය යුතුයි යන්න ඉස්ලාමයේ සංකල්පය වේ. එය නබි (සල්) තුමාණන් තම ජීවිතයේ දී ක්‍රියාත්මක කර පෙන්වූහ.

සෙල්ලම් කරමින් සිටින කුඩා දරුවන් දුටුවොත්, ඔවුන්ට සලාම් පවසා සිනාහවීමට එතුමාගේ “නබි” තත්වය බාධාවක් වූවේ නැත. අනස් (රලි) තුමාණන් ළමුන්ව පසු කර ගියහොත් ඔවුන්ට සලාම් පවසයි. “නබි (සල්) තුමාණන් ද මෙලෙසම කරන” බව ද එතුමා ප්‍රකාශ කළේය. (බුහාරි මුස්ලිම්)

“මදීනාවේ වහල් කාන්තාවක් නබි (සල්) තුමාණන්ව දෑතින් අල්ලාගෙන තමා කැමති හැම ස්ථානයකටම කැඳවාගෙන යන්නීය. නබි (සල්) තුමාන් ඇයගේ අවශ්‍යතාව සම්පූර්ණ කර දුන්හ.” යනුවෙන් අනස් (රලි) තුමාණන් පවසයි. (බුහාරි)

එළුවෙකුගේ පාදයක් නැතහොත් එහි පහල කොටස භෝජන සංග්‍රහයක් සඳහා සූදනම් කරගෙන, එම සංග්‍රහයට මා කැඳවනු ලැබුව ද ඇත්ත වශයෙන්ම මම එය පිළිගනිමි. එක් පාදයක් හෝ එහි පහල කොටසක් මා හට තෑග්ගක් වශයෙන් ලබා දුන්න ද ඇත්ත වශයෙන් ම මම එය ලබාගන්නෙමි. (බුහාරි)

සංවරභාවය, සරලභාවය හා මහත්මා බව යනාදිය අයත් කෙනෙකු වශයෙන් ක්‍රියාකල අවසාන දූතයාණන් වන නබි (සල්) තුමාණන් තමාගේ ප්‍රතිවිරුද්ධ, කුරෙෂිවරුන්ව ජයග්‍රහණය කර සියලු බලතල ලබාගත්තද මක්කා නගරය තුළට සිරස නමාගෙන ඇතුල් වූ බවට ඉතිහාස සාක්ෂි දරයි.

මෙම යහපත් ගුණාංග අපගේ ජීවිතයට සම්බන්ධ කර අනුගමනය කිරීමට උත්සාහ කරමු.

**දානමාන**

ඉස්ලාම් අනුන්ට දාන මාන කිරීමටත්, වියදම් කිරීමටත් උනන්දු කරවන දහමකි. විශ්වයේ තිබෙන සියල්ලටම උරුමක්කරුවා අල්ලාහ් වන නිසා ඔහු අපට ලබාදුන් මුදල් ද, වස්තු ද අනෙක් අයටත් ලබාදෙන ලෙස අල්ලාහ් අණ කර තිබේ.

අනෙක් අයට රහසිගතවත් ප්‍රසිද්ධියේත් ලබාදෙන දානපතින්ට පරලොව දිනයේ දී උසස් ප්‍රතිඵල තිබෙන බව අල්කුර්ආනය අවධාරණය කරයි.

"කවරෙක් තමන්ගේ ධනය (දානයක් වශයෙන්) රාත්‍රියේත්, දහවලේත්, රහසිගතවත්, ප්‍රසිද්ධියේත් වියදම් කරන්නේ ද ඔවුන්ට ඔවුන්ගේ කුලිය ඔවුන්ගේ දෙවියන්වෙත ඇත. ඔවුන්ට (පරලොවේදී) කිසිදු බියක් නැත. ඔවුන් වේදනාවට පත් වෙන්නේ ද නැත." (2:274)

ධනය නාස්තිකාරී ලෙසත්, ආඩම්බරකාරී ලෙසත් වියදම් කිරීම වළක්වා අවශ්‍යතා තිබෙන අයට ලබාදිය යුතු බව අල්කුර්ආනය පැහැදිලි කරයි.

"ඥතීන්ටත්, දුගියන්ටත්, යාචකයන්ටත් ඔවුන්ට අදාළ කොටස් ලබා දෙන්න. (ධනය ) සීමාව ඉක්මවා නාස්ති නොකරන්න. මන්ද යත්, නාස්තිකාරී ලෙස වියදම් කරන්නන් ෂෛතාන්ගේ සහෝදරයන් ලෙස සිටින්නෝ ය. ෂෛතාන් ද තම දෙවියන්ට (ස්තුති නොකර) වෙනස්කම් කරන්නේ ය. (17:26,27)

නබි (සල්) තුමාණන් දන්දීමෙන් ඇතිවන යහපත් ප්‍රතිඵල පිළිබඳ පහත සඳහන් ආකාරයට ප්‍රකාශ කළහ.

"දාන පරිත්‍යාග කරන්නා අල්ලාහ්ට සමීප වන්නේ ය.; මිනිසාට ද සමීප වන්නේ ය; ස්වර්ගයටද සමීප වන්නේ ය; නිරයෙන් ඈත් වූ තැනැත්තාය. මසුරා, මසුරා අල්ලාහ්ගෙන් ඈත් වූවෙක් ය; ජනතාවගෙන් ඈත් වූවෙක් ය. ස්වර්ගයෙන් ඈත් වූවෙකි; අපායට සමීප වූවෙකි; දාන පරිත්‍යාග කරන්නා මසුරුකම් ඇති නැමදුම් කරන්නාට වඩා අල්ලාහ්ට ඉතාමත් සමීප වන්තයාය ." (තිර්මිදි)

දන්දීම මගින් එය අඩුවේ යැයි යන සංකල්පය ඉස්ලාම් බිඳ හෙළයි. දන් දීම මගින් ධනය වර්ධනය වන බව පැහැදිලිව ම ප්‍රකාශ කරයි. එමෙන්ම පරලොව දිනයට එය මහා ඉපැයීමක් වශයෙන් ද ඉස්ලාම් සලකයි.

“කරුණු 3ක් සම්බන්ධයෙන් මම දිවුරා ප්‍රකාශ කරමි. එක් ගැත්තෙකුගේ ධනය දාන පරිත්‍යාග කිරීම මගින් අඩුවන්නේ නැත. එක් ගැත්තෙකුට අත්වන අයුක්ති සහගත තත්වයේ දී ඔහු ඉවසිලිවන්තව කටයුතු කළහොත් ඔහුගේ ගරුත්වය අල්ලාහ් වැඩි කරයි. කවරෙක් සිඟා කෑමේ දොරටුව විවෘත කරන්නේ ද අල්ලාහ් දරිද්‍රතාවයේ දොරටුව ඔහු මත විවෘත කරයි .” (ඉබ්නු මාජා)

“මිනිසුන් උදෑසන අවදිවන දිනක් පාසාම මලාඉකාවරුන් දෙදෙනෙක් පහළ වේ. ඔවුන්ගෙන් එක් මලාඉකාවරයෙක් “අල්ලාහ්” වියදම් කරන්නාට පසුව ඔවුන් වියදම් කළ දේ ලබා දෙන්න; යනුවෙන් පවසයි. අනෙක් මලාඉකාවරයා අල්ලාහ්ට වියදම් නොකර වළක්වා ගත්තන්ට විනාශය ඇති කරන්න යනුවෙන් පවසයි ”(මුස්ලිම්)

අනෙක් අයට ලබාදුන් දාන පරිත්‍යාග නියත වශයෙන්ම ඉතිරියක් බව හදීසය ප්‍රකාශ කරයි.

“ගැත්තා, මාගේ වස්තුව” “මාගේ වස්තුව” ලෙස කියයි. ඇත්ත වශයෙන්ම ඔහුගේ වස්තුව වන්නේ 3ක් පමණි. ඔහු අනුභව කර නැති කළ දේ, ඇඳ පැළඳ අවසන් කළ දේ, දාන පරිත්‍යාග කර ඉතිරි කළ දේ. මේවා හැර අන් සියල්ල නැතිවී යයි. ඒවා අනෙක් මිනිසුන්ට අත්හැර යන දෑ වශයෙන් පවතී. (මුස්ලිම්)

“ආයිෂා (රලි) තුමිය පවසයි. එක් අවස්ථාවක එළුවෙකු කපන ලදී. එවිට නබි (සල්) තුමාණන් “එයින් කුමක් ඉතිරිවී තිබෙන්නේ ද?” ලෙස ප්‍රශ්න කළ විට, එහි සම පමණක් ඉතිරිව තිබෙන බව පවසනු ලැබීය. එයට නබි (සල්) තුමාණන් “සම හැර අනෙක් කොටස් පමණක් ඉතිරිවී තිබේ” යනුවෙන් ප්‍රකාශ කළහ. (තිර්මිදි)

අනෙක් අයට දනමාන ලබා දෙන විට, ඉතාමත් රහසිගතව ලබාදීම උසස් ය යන අදහස ඉස්ලාම් පැහැදිලි කරයි.

“(ඔබලා කරන) පරිත්‍යාගයන් ඔබලා හෙළි කළහොත් එයත් යහපත් ය. (මන්දයත් එය අනෙක් අයව ද දාන පරිත්‍යාග කිරීමට දිරිගන්වයි) එනමුත් ඔබලා රහසිගතව එය දුගියන්ට ලබාදීම ඔබලාට ඉතාමත් යහපත් ය.” (2:271)

“යහක්‍රියාව, අනිසි ප්‍රතිවිපාකයන් ආරක්ෂා කරයි. රහසිගත සදකාවක් අල්ලාහ්ගේ කෝපය නැති කරයි. ඥාති සම්බන්ධතාවය ආරක්ෂා කිරීම ආයුෂ වැඩි කරයි.” (තබරානි)

නබි (සල්) තුමාණන්ගේ ජීවිතයේ දී අධික ලෙස දන පරිත්‍යාග කිරීමේ ගුණාංගය දකින්නට තිබුණි. එතුමාණන් ඉතාමත් චාම් ජීවිතයක් ගත කළ ද ලැබෙන සියලු ධනය අසාධාරණයට ලක් වන්නන්ටත්, යහපත් මාර්ගයේ ද වියදම් කරන්නෙකු වශයෙන් පසුවිය. රමළාන් කාලයේ දී මෙම ක්‍රියා පිළිවෙත ඉතාමත් අධිකව පැවතුණි.

## පරිත්‍යාගශීලි බව

තනි මිනිසෙකුගේ දියුණුව, පවුල, සමාජය යනාදියේ උසස්වීමත්, වර්ධනයත්, කැපවීම මතම රඳා පවතියි. තමාගේ කාලයත්, ශ්‍රමයත්, ධනයත්, බලයත් කැප කිරීම මගින් පමණක් යහප්‍රතිඵලයන් ඇතිවන්නේ ය.

අල්-කුර්ආන් කැපවීමේ වැදගත්කමත් එහි ප්‍රතිඵලයත් අපට උගන්වයි.

"තමාගේ නිවසෙනුත්, තමාගේ සම්පත්වලිනුත් (අසාධාරණ ලෙස) පිටමං කර (මක්කාවෙන්) හිජ්රත් කළ (මුහාජිරීන්වරුන් අතරේ සිටින) දුගියන්ටත් (එහි උරුමයක් ඇත.) ඔවුන් අල්ලාහ්ගේ මනාපයත් දයාදයනුත් පතමින් අල්ලාහ්ටත් (ඔහුගේ) දූතයාණන්ටත් උදව් කරමින් සිටියි. විශ්වාසවන්තයින් මොවුන්ම ය." (59:08)

"අල්ලාහ් විශ්වාසවන්තයන්ගේ ප්‍රාණයත්, වස්තුවත් නියත වශයෙන්ම ස්වර්ගය ලබා දෙන බව ප්‍රකාශ කර, ඇත්ත වශයෙන්ම මිලට ගන්නා ලදී. ඔවුන් අල්ලාහ්ගේ මාර්ගයේ යුද්ධ කර ඔවුන් (විරෝධීන්) ඝාතනය කරති. (නැතහොත්) ඝාතනයට (මරණයට) ලක්වෙති." (9:111)

මානව සමාජ ඉතිහාසයේ ඉබ්රාහිම් (අලෛ) තුමාණන්ගේ කැපකිරීම් රන් අකුරින් සටහන් විය යුතු ය. අල්ලාහ් එතුමාගේ පූජාවන් හජ් හි පිළිවෙත් වශයෙන් සකසා ඇත්තේ ඒ නිසාය.

මුහම්මද් (සල්) තුමාණන් ඉස්ලාමය ආරක්ෂා කිරීමටත් ව්‍යාප්ත කිරීමටත් කළ කැපකිරීමේ අසීමිතය. මක්කා කාල පරිච්ඡේදයේ දී මුහුණ දුන් වද වේදනාවන්, තම වාස භූමියත් සියලු සම්පත් අත්හැර මදීනාවට යාම, සටන්, කුමන්ත්‍රණ යන සියල්ලට අධිෂ්ඨානශීලිව මුහුණ දුන්හ. සහාභාවරුන් ද එම ක්‍රමයට ම තම ජීවිතය සකස් කර ගත්හ. අද ඉස්ලාම් වර්ධනය වී ව්‍යාප්ත වීමට එය හේතු වූ බව පැවසිය හැකිය.

## සමාව

සමාව උසස් ගතිගුණ ඇත්තන්ට තිබෙන විශේෂ ගුණාංගයකි. මෙම ගුණාංගය අයත් අයට අල්කුර්ආන් විශේෂ ගතිගුණ ඇත්තන් ලෙසත් අල්ලාහ්ගේ ආදරය ලබාගත් තැනැත්තන් ලෙසත් වර්ණනා කරයි.

"ඔවුන් කෙබඳු අය ද යත්, ධනවත් තත්වයේදීත්, දුගී තත්වයේ දීත් දාන පරිත්‍යාග කරමින් සිටියි. කෝපය යටපත් කර ගනී. මිනිසුන්ට සමව ලබා දේ. අල්ලාහ් ප්‍රිය කරන්නේ මෙවන් යහපත් අයව ය. " (3:134)

ඉස්ලාමීය දණ්ඩනීති සංකල්පයේ "කිසාස් " වැරද්දට අදළ දඬුවම, පළියට පළි ගැනීම වශයෙන් තිබුණ ද වූදිතයන්ට සමාව දීම ඉතාමත් උසස් බව අල්කුර්ආන් පවසයි. (42:39-43)

සමාව දීමේ ගුණාංගය අල්ලාහ්ගේ ගුණාංගවලින් එකකි. එම අදහස ප්‍රකාශ කිරීමට අල්ලාහ් වචන 4ක් උපයෝගි කර ඇත. කෆූර්, කෆ්ෆාර්, තව්වාෆ්, අෆුව්වු යන මෙම භාවිතයන් මගින් සමාව දීමේ දී ඔහු උත්තරීතරබව පෙන්වයි. එම ගුණාංගය මිනිසුන් අතරේ ඇති විය යුතු බව අල්ලාහ් බලාපොරොත්තු වේ.

"ඔවුන් ඔබලා ඉවසිලිමත්ව ප්‍රතික්ෂේප කර සමා කරමින් පැමිණියහොත් ඇත්ත වශයෙන්ම අල්ලාහ් ද ඉතාමත් ක්ෂමා කරන්නෙකු වශයෙන් ද ආශිර්වාද කරන්නෙකු වශයෙන් ද පසු වේ." (64:14)

නබි (සල්) තුමාණන්ගේ ජීවිතයේ ද මෙම ගුණාංගය ඉතාමත් පැහැදිලිව දක්නට තිබුණි. තායිෆ් ප්‍රදේශයට දෑවා කිරීමට ගොස් කටුක වේදනාවලට ලක් වූ පසුවත් ඔවුන්ට දඬුවම් කිරීමට ජිබ්රීල් (අලෛ) තුමාණන් අවසර ඉල්ලූ සමයේ එය නබි (සල්) තුමන් ප්‍රතික්ෂේප කිරීම, තමාට වස පෙවූ යුදෙව් කාන්තාවට සමාව දීම, මක්කා ජයග්‍රහණයෙන් පසු විරුද්ධවාදීන් බහුතරයකට සමාව දීම යනාදිය උදහරණ වශයෙන් පැවසිය හැකිය.

## යහපත් ශ්‍රාවකයින්ගේ ගුණාංග

ඉස්ලාම් යහපත් ගුණාංගයන්, යහ ගති ලක්ෂණයන් මිනිසුන් අතරේ අවධාරණය කරයි. මේ අනුව ගුණවත් අය සතුවිය යුතු ලක්ෂණයන් ගැන අල්කුර්ආනය පහත සඳහන් ආකාරයට ප්‍රකාශ කරයි.

"අර්රහ්මාන්ගේ ශ්‍රාවකයන් කවුරුන් ද යත් ඔවුන් පොළෝ තලයේ චාම්ව ක්‍රියා කරයි. අඥාන අය අනිසි දේවල් කතා කිරීමට උත්සාහ දරුවොත් ඔබ මත ශාන්තිය උදා වෙත්වා ! ලෙස ප්‍රකාශ කර ඔවුන්ගෙන් ඈත් වේ. තව ද, ඔවුන් කවුරුන් ද! යන් තම දෙවියන්ට සිරස නැමූ අය ලෙසත්, සිටගත් අය වශයෙනුත් (නැමදුම්) අල්ලාහ් නැමදීමෙහි රාත්‍රිය ගත කරයි. තව ද "මාගේ දෙවියනි නිරයේ වේදනාවෙන් අපව වළක්වා ගන්න. මන්ද යත් ඇත්ත වශයෙන්ම එහි වේදනාව සදාකාලිකය. යනුවෙන් ප්‍රාර්ථනා කර මෙසේ පවසයි. ඇත්ත වශයෙන්ම එය සදාකාලිකව හෝ තාවකාලිකව රැඳී සිටීමට නුසුදුසු ඉතාමත් පහත් තැනකි. තව ද ඔවුන් කෙබඳු අය ද, යත් වියදම් කළහොත් නාස්ති නොකරයි. එමෙන්ම එක විටම හකුලා ගන්නේ ද නැත. එලෙස වියදම් කිරීම වනාහි මෙම ත්ත්වයන් දෙක අතරෙහි පවතී." තව ද, ඔවුන් අල්ලාහ් සමග වෙන කෙනෙකුට කැඳවන්නේ නැත. අල්ලාහ් වළක්වා තිබෙන කිසිදු ප්‍රාණයක් ඔහුගේ අනුදැනුම නැතිව ඝාතනය කරන්නේ ද නැත.



8* CM 20318

ඔවුන් අනාචාරයේ යෙදෙන්නේ ද නැත. කවරෙක් හෝ මේවා කිරීමට වෙර දරන්නේ ද ඔවුන් කටුක වේදනාවන්ට (දඬුවම්වලට) මුහුණ දෙයි. ” (29:63-75)

## අල්කුර්ආනය යහපත් අය පිළිබඳ තවදුරටත් ප්‍රකාශ කරමින්

විශ්වාසවන්තයන් නියත වශයෙන්ම ජය ලැබූවෝ ය. ඔවුන් කෙබඳු අය ද යත් ඔවුන් සලාතයේ ඉතාමත් දේව භිය ඇත්තන්ය. තව ද, අනිසි දේවල් ප්‍රතික්ෂේප කරන්නන්ය. තව ද, ඔවුන් සකාතය ක්‍රමවත්ව ඉටු කරන්නේ ය. තව ද ඔවුන් තමන්ගේ මර්මස්ථානය අනාචාරයෙන් ආරක්ෂා කර ගනියි. එනමුත් (තම භාර්යාව වෙත හෝ වහල් කාන්තාවන් සමඟ හැර) මොවුන් සමඟ තිබෙන සම්බන්ධතාවය ඔවුන් නින්දා කොට සලකන්නේ නැත. එබැවින් කවරෙක් මෙය හැර වෙනත් වැරදි මාර්ගයන් සොයා ගන්නේද සීමාව ඉක්මවූවත් ඔවුන්ම ය. තව ද ඔවුන් කෙබඳු අයද යත් තමන්ගේ විශ්වාසයත් පොරොන්දුවත් ආරක්ෂා කරයි. තව ද තම සලාතය ද ක්‍රමවත්ව ඉටු කරයි. ස්වර්ගයේ රැඳෙන්නේ ඔවුන්ම ය. ෆිර්දව්ස් නම් උසස් ස්වර්ගයේ රැඳෙන්නේ ඔවුන්ම ය. (23:01-11)

# 05. මුස්ලිම්වරුන් වෙත තිබිය යුතු විශේෂ ගුණාංග

## ආදරය පෙන්වීම සම්බන්ධව ගුණාංග

ආදරයත් කරුණාවත් අල්ලාහ්ගේ ගුණාංග සම්බන්ධ එක් ලක්ෂණයකි. ආදරයට සම්බන්ධ වූ සීමාරහිත දායාදවන්තයා (අර්රහ්මාන්), ඉතාමත් ආදරවන්තයා (අර්-රහීම්) යන ගුණාංග දෙක ඔහුට අයත් ය.

ආදරය යන මෙම යහගුණාංගයේ විවිධ අංග පිළිබඳ අපි මෙම පරිච්ඡේදයේ දී අවධානය යොමු කරමු.

## අල්ලාහ් කෙරෙහි ආදරය දැක්වීම

එක් ගැත්තෙකු තමාට ආදරය දැක්වීමට ඉතාමත් සුදුස්සෙකු වශයෙන් තමාව නිර්මාණය කර සියලු පහසුකම් සලසා දුන් අල්ලාහ්ව පිළිගත යුතු ය.

අල්ලාහ් මිනිසාව අනෙක් සත්ව වර්ගයට වඩා උසස් පුද්ගලයෙකු ලෙස මවා ඔහුගේ නියෝජිතයෙකු වශයෙන් ද පත් කර විචාර බුද්ධියත් ලබාදී ඇත. ලෝකයේ තිබෙන සියල්ල ඔහුට අවනතර කර දී තිබෙන අතර ඔහුට ඍජු මාර්ගය පෙන්වීමට රසූල්වරුන් හා නබිවරුන් යවනු ලැබූහ. එයට සහාය වශයෙන් දහමද ලබා දී ඇත. මේ අනුව මෙම විශාල වරප්‍රසාදවලටත් වෙනත් උදව් උපකාරවලටත් කෙළෙහි ගුණ ඇත්තෙකු වශයෙනුත් සීමාරහිත ආදරවන්තයෙකු ලෙසත් ඔහු වෙනස් විය යුතු ය.

අල්ලාහ් කෙරෙහි ඇති කරගන්නා ආදරය ඊමානයේ රසාස්වාදය ලබා දෙන අංගයක් ලෙස හදීසය විස්තර කරයි. “කරුණු තුනක් කවරෙකු ළඟ තිබෙන්නේ ද ඔහු ඊමානයේ රස විඳ ගනී, ඒවා අල්ලාහ් සහ  ඔහුගේ දූතයාණන් ඔවුන් නොවන අනෙකුත් සියලු දෙනාට වඩා ඉතාමත් සමීප වන්ත ලෙස සිටීම.” (බුහාරි, මුස්ලිම්)

මවක් තම දරුවන් වෙත දක්වන ආදරයට වඩා අල්ලාහ් තම ගැත්තන් කෙරෙහි ආදරය දක්වන්නෙකු වශයෙන් සිටියි. එවන් ආකාරයට සීමා රහිතව දක්වන අල්ලාහ්ගේ ආදරයට අප කෙලෙහි ගුණ දක්වන්නන් වශයෙන් සිටිය යුතු ය. අප ඉටු කරන වත් පිළිවෙත් නැමදුම් සියල්ල ඔහු වෙනුවෙන්ම කළ යුතු අතර, එය ඔහු කෙරෙහි දක්වන ලද උසස් ආදරයේ ප්‍රතිඵලයන් විය යුතු ය. නබි (සල්) තුමාණන් රාත්‍රි කාලයේ දී තම පාද ඉදිමෙන තරමට නැමදුම් කර තිබීමත්, අධික ලෙස උපවාස රැක තිබීමත් බොහෝ පරිත්‍යාග සිදුකිරීමත් මෙම ආදරය හේතුවෙන්ම සිදු විය.

නබි (සල්) තුමාණන් අල්ලාහ් කෙරෙහි දක්වන ආදරය ඊමානයේ පිබිදීමක් වශයෙන් ගෙන හැර දක්වයි. “ඔබලාගෙන් කෙනෙකුට අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් අනෙක් අයට වඩා ආදරවන්තයන් වන තාක්කල් ඔහු ඊමාන් දාරියෙකු නොවේ.” (බුහාරි මුස්ලිම්)

කෙනෙකුට අල්ලාහ් කෙරෙහි තමා තුළ තිබෙන ආදරය බොහෝ ආකාරයට ප්‍රදර්ශනය කළ හැකිය. අල්ලාහ්ගේ දහම්, රසූල්වරුන් මලාඉකාවරුන්, මස්ජිදය යනාදියට ගෞරව කිරීම අල්ලාහ්ගේ වරප්‍රසාදයන් ස්තුති පූර්වකව සිහිගැන්වීම, සැම අවස්ථාවකදීම දේව චින්තනයෙන් සිටීම, අල්කුර්ආනය සමග සමීප සම්බන්ධතා පැවැත්වීම යනාදිය ඒවායින් සමහරකි. නබි(සල්) තුමාණන්ව මුළුමනින්ම අනුගමනය කිරීම ද මෙයට අයත් වේ. “නබිතුමණි මිනිසුන් වෙත ඔබ පවසන්න “ඔබලා ඇත්ත වශයෙන් ම අල්ලාහ්ව ප්‍රිය කරන්නේ නම් ඔබලා මාව අනුගමනය කරන්න. ඔබලාව අල්ලාහ් ප්‍රිය කරයි. ඔබලාගේ පව්ද අල්ලාහ් සමා කරයි. අල්ලාහ් අධික සමා දෙන්නෙකු ලෙස ද අධික ආදරවන්තයෙකු ලෙස ද සිටියි.” (3:31)

එබැවින් අල්ලාහ්ට ප්‍රිය කිරීම මගින්, මුහම්මද් නබි (සල්) තුමාණන්ව අනුගමනය කර ජීවත්වීම තුළින් අල්ලාහ්ගේ ආදරය ලබා ගනිමින් අපගේ අකුසල් ද ඉවත් කර ගනිමු.

## මුහම්මද් (සල්) කෙරෙහි ආදරය දැක්වීම

අවසාන දූතයාණන් මුහම්මද් නබි (සල්) කෙරෙහි ආදරය දැක්වීමත් මුස්ලිම් කෙනෙකුගේ ප්‍රධාන ගුණාංගවලින් එකකි. අනෙක් මිනිසුන්ට ප්‍රිය කරනවාට වඩා අපි නබි (සල්) තුමාණන්ව සීමාව ඉක්මවා ප්‍රිය කළ යුතුයි.

නබිවරුන්ගේ ලැයිස්තුවේ අවසාන වශයෙන් පැමිණි මුහුම්මද් (සල්) තුමාණන් තම සමාජයේ උසස්වීම වෙනුවෙනුත්, අභිවෘද්ධිය වෙනුවෙනුත් බොහෝ කැපකිරීම් සිදු කර ඇත. එතුමාගේ මුළු ජීවිතයම අල්ලාහ්ගේ තෘප්තිය පතා තම සමාජයේ පිබිදීම අරමුණ කොටගෙන තිබුණි. අවසාන දහම වන අල්කුර්ආනය අපට ලැබුණේ එතුමා මගිනි. අල්කුර්ආනය කෙසේ අනුගමනය කළ යුතු ද යන්න පෙන්වා දුන්නේ එතුමාය. එතුමාණන්ගේ මුළු ජීවිතයම පරිත්‍යාග කළේ ඒ වෙනුවෙන්ම ය. සියල්ලටම වඩා උසස් පොදු ගෞරවාන්විත ජීවන ක්‍රමයක් එතුමාණන් අපට පෙන්වා දී තිබේ. මෙවන් හේතූන් නිසා අප එතුමාණන් කෙරහි ප්‍රිය කරන්නන් බවට පත්විය යුතු ය.

මුහම්මද් (සල්) තුමාණන් මුළුමහත් මිනිස් සංහතියේම ආදරයට පාත්‍රවිය යුතුය යන්න පහත වැකි මගින් අවබෝධ කර ගත හැක.

1. මුහම්මද් (සල්) තුමාණන් අනුගමනය කිරීමට සුදුසු පුද්ගලයෙකු බව අල්ලාහ් තම ශුද්ධ ග්‍රන්ථයේ පැහැදිලි කරයි. “විශ්වාසවන්තයිනි ඔබලා (ඇත්ත වශයෙන්ම) අල්ලාහ්ටත් අවනත වන්න. (ඔහුගේ දූතයාට ද අවනත වන්න. (ඔවුන්ට වෙනස්කම් කර) ඔබලාගේ (කුසලයන්) ක්‍රියාවත් ඔබලා විනාශ නොකරන්න. ”(47:33)
2. “එබැවින් (අපගේ) දූතයාණන් ඔබලාට ලබා දුන් දෙය ඔබලා (කැමැත්තෙන්ම) ලබා ගන්න. ඔහු කවරක් ඔබලාට තහනම් කළේ ද එයින් ඔබ වැළකී සිටින්න.” (59:07)

3. අල්ලාහ්ව ප්‍රිය කිරීමට අදාළ සංකේතයක් වශයෙන් අල්කුර්ආනය නබිව අනුගමනය කළ යුතු බව පැහැදිලි කරයි. “නබිතුමණි (මිනිසුන් වෙත) ඔබ පවසන්න. “ඔබලා ඇත්ත වශයෙන්ම අල්ලාහුව ප්‍රිය කරන්නන් ලෙස සිටින්නේ නම් ඔබලා මාව අනුගමනය කරන්න. ඔබලාට අල්ලාහ් ප්‍රිය කරයි. ඔබලාගේ අකුසලය ද ඔබලා වෙනුවෙන් ඔහු සමා කරයි. ”(3:21)

4. මිනිසුන් නබි (සල්) තුමාණන් කෙරෙහි ආදරය දක්වීමට අදාළ සුදුසුකම් නබි (සල්) තුමා වෙත තිබේ. මිනිසුන්ගේ පුද්ගලික පවුල්, සමාජ, ආර්ථික, දේශපාලන, ආධ්‍යාත්මික ලෞකික ජීවිතය යන සියල්ලන්ටම එතුමාගේ ජීවිතයේ ආදර්ශ තිබේ.

   “අල්ලාහ්වාත් අවසාන දිනයක් ස්ථිර වශයෙන්ම විශ්වාස කරන්නන්ට අලංකාර ආදර්ශ ඇත්ත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයා ළඟම ඔබට තිබෙන්නේ ය. ඔවුන් (ඔහුව අනුගමනය කර) අල්ලාහ් අධික ලෙස සිහිගන්වා නැමදුම් කරමින් සිටියි.” (33:21)

   සියල්ලටම වඩා නබි (සල්) කෙරෙහි ආදරය දක්වීම ඊමානයේ වෙන් කළ නොහැකි එක් අංගයක් ලෙස අල්කුර්ආනය හා අල්හදීසය ගෙන හැර දක්වයි.

5. “මාගේ ආත්මය කවරෙකු යටතේ තිබෙන්නේ ද ඔහු මත දිවුරා පවසමි. ඔබලාගෙන් කෙනෙකුට තම දරුවා, දෙමව්පියන් සහ අනෙක් සියලු ජනයන්ට වඩා මා ඉතාමත් ප්‍රියවන්තයෙකු ලෙස වෙනස් වන තාක්කල් එහු ඊමාන්දාරියෙකු නොවේ.” (බුහාරි, මුස්ලිම්)

6. “එක් ගම්බද අරාබි ජාතිකයෙකු දේව දූතයාණන්ගෙන් “පරලොව දිනය කවදා පැමිණේ දැයි ඇසුවේ ය. එයට රසූල් (සල්) තුමාණන් “ඔබ එය වෙනුවෙන් කුමක් සූදනම් කර තිබෙන්නේ යනුවෙන් ඇසූ අවස්ථාවේ “අල්ලාහ් මතත් ඔහුගේ දූතයා මතත් ඇති කරගෙන තිබෙන ආදරය” යනුවෙන් ඔහු පිළිතුරු දුන්නේ ය. එවිට නබි (සල්) තුමාණන් “නුඹ කවරෙකුට ප්‍රියකරන්නේ ද” ඔහුත් සමඟ පරලොව දිනයේ දී සිටි යනුවෙන් ප්‍රකාශ කළහ.” (මෙම හදීසය ප්‍රකාශ කරන ) අනස් (රලි) තුමාණන් පවසයි. “ මම අල්ලාහ්වත් ඔහුගේ දූතයාණන්වත්, අබූබක්කර්වත්, උමර්වත් ප්‍රිය කරමි. ඔවුන් මෙන් යහපත් ක්‍රියාවන් නොකළ ද ඔවුන් සමග (පරලොව දිනයේ දී සිටීමට ආශා කරමි. යනුවෙන් ප්‍රකාශය කළේ ය. (මුස්ලිම්)

7. නබි (සල්) තුමාණන්ගේ සගයන් සහ භාර්යාවරුන් ද එතුමා කෙරහි සීමා රහිතව ආදරය කළහ. තමාගේ ප්‍රාණය වෙන්වූවද කමක් නැත. නබි (සල්) තුමාගේ පාදයක කටුවක් වුවද ඇණීම ඔවුන්ට දරාගත නොහැකි වූවක් විය. එතුමාණන්ට අධික ලෙස ප්‍රිය කළ හේතුවෙන් නබි (සල්) තුමාණන්ගේ සුන්නාහ්ව සහමුලින්ම අනුගමනය කරන ගුණාංගයත්, එය ආරක්ෂා කිරීමේ මානසික්තවයක් ලබා ගෙන තිබුණි.

8. නබි (සල්) තුමාණන් කෙරෙහි ආදරය දැක්වීම වූ කලි බොහෝ ක්‍රියාකාරකම් පදනම් කරගෙන සිදුවිය හැකිය.

9. නබි (සල්) තුමාණන්ගේ ජීවිත ඉතිහාසය ඉතාමත් පාරිශුද්ධ ලෙස විවිධ ආකාරයෙන් සටහන් වී ඇත. එබැවින් එය කියවීමට උනන්දුවක් තිබිය යුතු ය.

10. ජීවිතයේ සෑම කරුණු සම්බන්ධයෙන්ම නබි (සල්) තුමාණන්ගේ ජීවිතය අනුගමනය කළ යුතු ය.

11. නබි (සල්) තුමාණන් කෙරෙහි අධික ලෙස සලවාත් කීම කළ යුතු ය. "ඇත්ත වශයෙන්ම අල්ලාහ්ත් ඔහුගේ මලාඉකාවරුනුත් නබි මත සලවාත් පවසයි. එබැවින් විශ්වාසවන්තයිනි! ඔබලා ද ඔහු මත සලවාත් කියා සලාම් ද පවසමින් සිටින්න." (33:56)

12. එතුමාණන් ජීවත් වූ ස්ථානයන් එතුමාණන් සැරිසැරූ ප්‍රදේශයන් වන්දනා කල යුතුයි. මෙය තවදුරටත් ආදරය වැඩි දියුණු කරයි. අල්ලාහ්ගේ දූතයා කෙරෙහි ආදරය දක්වන අතර එතුමාගේ ජීවිතය සම්පූර්ණයෙන්ම පිළිපදිමු.

## නබි (සල්) තුමාණන්ගේ පවුලේ හිතවතුන් සගයන් කෙරෙහි ආදරය දැක්වීම

මුහම්මද් නබි (සල්) තුමාණන් සමග එකතු වී සිටි අය නබි සගයන් වේ. ඔවුන් මුස්ලිම් සමාජයේ උසස් මාර්ගෝපදේශකයන් වේ. නබි (සල්) තුමාණන් ඉස්ලාමය ප්‍රචාරය කළ සමයේ එතුමාට දැඩි ලෙස සහයෝගය දැක්වූයේ සහභාවරුන්ය. නබි (සල්) තුමාණන්ව ආරක්ෂා කිරීමේදීත්, එතුමාගේ පණිවිඩය ව්‍යාප්ත කිරීමේදීත්, අනෙක් පරම්පරාවට කියා දීමේදීත්, නබි සගයන් දැක් වූ සහයෝගය සීමා රහිතය. ඔවුන් ඒ වෙනුවෙන් සිදුකළ කැපකිරීම් ගණන් කළ නොහැකි තරම්ය. මේ හේතුවෙන් අප ඔවුනට දැඩිව ආදරය දැක්විය යුතු ය.

නබි (සල්) තුමාණන් තම සගයන්ට ප්‍රිය කිරීම අල්ලාහ්ගේ ආදරය ලබාදෙන බව පවසන අදහසක් පහත සඳහන් හදීසය මගින් ප්‍රකාශ කර ඇත. "ඔවුන්ව (නබි සගයන්ව) කවරෙක් මා කෙරෙහි තිබෙන සෙනෙහස හේතුවෙන් ප්‍රිය කරන්නේ ද (අල්ලාහ් ද) ඔවුන් ප්‍රිය කරයි." (තිර්මිදි)

අල්කුර්ආනය සහභාවරුන්ගේ විශේෂ ගුණාංගය බොහෝ ස්ථානවල දී තහවුරු කරයි. "මුහම්මද් (සල්) අල්ලාහ්ගේ දූතයාණන් වේ. එතුමා සමග සිටින්නන් ප්‍රතික්ෂේප කරන්නන් කෙරෙහි දැඩි මතධාරීවද තමන් අතරේ සෙනෙහවන්තව ද සිටියි. නැමී සිරස නවන්නන් ලෙස ද, ඔවුන්ව ඔබ දකිනු ඇත. අල්ලාහ්ගේ වරප්‍රසාද හා ආශිර්වාදයන්ට (හැම මොහොතකදීම) කැමති වන්නන් ලෙස සිටිති. (48:29)

"මුහාජිරීවරුන් හා අන්සාරිවරුන් අතරේ (ඉස්ලාමයේ) කවරෙක් ප්‍රථමයෙන් ප්‍රමුඛත්වයක් ගත්තේ ද ඔවුන්වද යහක්‍රියාවන්හි ඔවුන්ව අනුගමනය කරන්නන් පිලිබඳ අල්ලාහ් තෘප්තිමත් වේ. ඔවුහු ද අල්ලාහ් මුල් කරගෙන තෘප්තිමත් වෙති. "(9:100)

ඔවුන් කෙරෙහි ආදරය දැක්වීම යනු ඔවුන්ගේ විශේෂත්වය විශ්වාස කිරීමත්, ගෞරව කිරීමත් වේ. එමෙන්ම නබි (සල්) තුමාණන් සමග එකතු වී සිටි අය යන හේතුවෙන් ඔවුන්ගෙන් ලැබුණු අල්කුර්ආනයටත් අස්සුන්නාහ්වටත් අනුමත කරුණු පිළිගෙන කටයුතු කිරීමත් වේ.

තව ද, ඔවුන්ව දෝෂාරෝපණය නොකර සිටීමත් ඔවුන් අතරෙහි ඇති වූ මතභේද සහ මත ගැටුම් සම්බන්ධයෙන් තර්ක නොකිරීමත් උම්මහාතුල් මුඃමින්වරුන් වන නබි තුමාණන්ගේ භාර්යාවන් සියල්ලන්ගේම ගෞරවය පිළිගැනීමත් ඔවුන් පාරිශුද්ධ ලෙස පිළිගැනීමත් වේ. එබැවින් අපි සහාවරුන්ට හිමි තත්ත්වය හා ගරුත්වය ලබාදී ගෞරව කරමු.

## ඉම්මාවරුන් හා යහ ගැත්තන් කෙරෙහි ආදරය දැක්වීම

අපට පෙර ජීවත් වූ සාලිහීන්වරුන් වන ඉමාම්වරුන් විද්වතුන් හා යහ ගැත්තන් කෙරෙහි ද සෙනෙහස දැක්විය යුතුයි. අල්ලාහ් තආලා බුද්ධිය මුල් කරගෙන මිනිසුන්ට උසස් තත්ත්වයක් ලබා දී ඇත.

ආදම් (අලෛ) තුමාණන් මලාඉකාවරුන්ට හා අනෙක් නිර්මාණයන්ට වඩා උසස් වීමට බුද්ධිය හේතු වූ බව අල්කුර්ආනය ගෙන හැර දක්වයි.

"ඔබලා අතරෙහි සිටින විශ්වාසවන්තයන්ටත් අධ්‍යාපනික ඥානය තිබෙන අයටත් අල්ලාහ් තනතුරු උසස් කරයි." (58:11)

(නබිතුමණි ඔබ අසන්න) උගත් අයත් නූගත් අයත් සමාන වේ ද?" (39:9)

ඉහත සඳහන් අදහස් අනුව දැනුම ලබාගත් ඉමාම්වරුන් හා ඒ අනුව කටයුතු කළ යහපත් අය ද පිළිගැනීමටත් ගෞරව කිරීමටත් පාත්‍ර වූ අය වෙති. ඒ හේතුවෙන් අප ඔවුන් කෙරෙහි ආදරය දැක්විය යුතු ය. එමෙන්ම ඔවුන්ට ගෞරව කර ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා ද කළ යුතු ය. ඔවුන්ගේ උසස් ආදර්ශයන් අනුගමනය කරන අතර, අඩුපාඩුකම් ප්‍රසිද්ධ කිරීම ද නොකළ යුතුයි.

එබැවින් ඉමාම්වරුන් හා යහපත් අයට ගෞරවය දක්වමු.

## අනාථයන් වැන්දඹුවන් ආබාධිතයන් කෙරෙහි ආදරය දැක්වීම

"කවරෙක් අනාථයන්ගේ සම්පත අසාධාරණ ලෙස ගිල දමන්නේ ද, ඔවුන් තම උදරය තුළ නියත වශයෙන්ම ගින්දරම හලා ගනී."((4:10)

"නබිතුමණි අනාථයින්ව (රැකබලා ගැනීම) සම්බන්ධයෙන් ද ඔබගෙන් අසයි. (එයට) ඔබ පවසන්න. ඔවුන්ව පුනරුත්ථාපනය කිරීම ඉතාමත් හොඳය, තව ද ඔබ ඔවුන් සමග එකතු වී ජීවත් වීමට සිදුවුවහොත් (ඔවුන්) ඔබලාගේ සහෝදරයන් වේ. (එබැවින්) ඔවුන්ගේ ධනයෙන් අවශ්‍ය ප්‍රමාණයෙන් ඔබලා වෙනුවෙන් ද වියදම් කළ හැකිය. එනමුත් යහපත කරන බව පවසා අයහපත කරන්නවුන් අල්ලාහ් හොඳින් දනියි. (2:220)

“මාත් අනාථයන්ව බලාගන්නා අයත්, පරලොව දිනයේ දී මෙලෙස ස්වර්ගයේ ඉතාමත් සමීපව සිටිමු.” යනුවෙන් නබි (සල්) තුමාණන් තමාගේ ඇඟිලි දෙකක් එකතු කර පෙන්වා පැවසූ බවට අබූ හුරෛරා (රලි) තුමාණන් ප්‍රකාශ කරයි. (මුස්ලිම්)

අබූ හුරෛරා (රලි) ප්‍රකාශ කරයි. “මිනිසුන්ව විනාශ කරන කරුණු හතෙන් මිදෙන්න” යනුවෙන් නබි (සල්) පවසන අතරේ, යාරසූලුල්ලාහ් ඒවා කුමක් ද ? යනුවෙන් ප්‍රශ්න කළ අවස්ථාවේ දී, නබි (සල්) තුමාණන් “අල්ලාහ්ට ආදේශ තැබීම, හූනියම් කිරීම, ආගමෙන් ලබාදුන් අයිතියෙන් තොරව අල්ලාහ් වැළැක්වූ ප්‍රාණයක් ඝාතනය කිරීම, පොලී ගැනීම, අනාථයන්ගේ දේපළ සූරා ගැනීම, යුධ පිටියෙන් පලායෑම, පතිවත දරන කාන්තාවන්ට අවලාද කිරීම යනුවෙන් ප්‍රකාශ කළහ. (බුහාරිල මුස්ලිම්)

උසාමා ඉබ්නු සෙද් (රලි) ප්‍රකාශ කරයි. “ස්වර්ගයේ දොරටුව අසල මා සිටගෙන සිටියෙමි. ඒ තුළට පිවිසෙන්නන් අතරේ බහුතරයන් දුගියන්ම වූහ. ධනවතුන් දොරටුව අසල නවත්වනු ලැබීය. එනමුත් ඔවුන් අතරේ සිටින නිරයට අයත් අය නිරයට ගෙන යාමට අණ කරනු ලැබ තිබුණි.” යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූහ. බුහාරි, මුස්ලිම්)

ඉහත සඳහන් කළ නබි වදන් අනාථයන්, දුගියන් අතරේ සිටින වැන්දඹුවන්, ආබාධිතයන් යනාදී වශයෙන් ජීවිතයේ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නන් කෙරෙහි අල්ලාහ් වෙනුවෙන් සෙනෙහස දැක්වීම ඉස්ලාමයේ සදාචාරයක් බව පෙන්වා දෙන රුවන් වැකි වේ.

මානව සමාජය නිර්මාණ කළ අල්ලාහ් ඔවුන් අතුරින් බලවත් අයවත් දුර්වලතාවයන්වත් මවා තිබීමත් මානව සමාජ වෙනස්කම් හි දේව සාක්ෂි තිබෙන බවත් අල්කුර්ආනයේ බොහෝ ස්ථානල සඳහන් වී තිබේ. ඔහු කැමැත්ත පරිදි නිර්මාණ කරයි. යන කුර්ආනීය අදහසට අනුව ආබාධිතයින් අල්ලාහ්ගේ ශක්තියටත්, ඔහුගේ බලපරාක්‍රමය අදාළ වූ ලක්ෂණයක් ලෙස පවතින බව ඉස්ලාමයේ මූලධර්මය ලෙස පවතියි.

ආබාධිතයන් ලෙස ඔවුන්ව ආමන්ත්‍රණය කිරීම උපහාසාත්මක බව සමාජ විද්‍යාඥයන් පවසන නිසා මෑතකාලයේ දී ඔවුන්ව සුරත දුර්වලයන් ලෙසත් වත්මනේ දී “වෙනස් දක්ෂතා ඇත්තන් ” වශයෙනුත් ආමන්ත්‍රණය කිරීම සඳහන් කළ යුතු ය.

දැනට ලෝකය පුරා පිළිගෙන ඇති වෙනස් දක්ෂතා ඇති කොටස් 13ක් හඳුනාගෙන ඇත. එම කණ්ඩායම් පහත සඳහන් වේ.

* සුහග හා විශේෂ කුසලතා
* ඉගෙනීමේ දුෂ්කරතා
* භාෂණය සහ භාෂණ දුර්වලතා
* සෙමින් මනස වර්ධනය සිදුවීම
* උග්‍ර ආවේදන ගැටළු
* විවිධ දුර්වලතා
* ශාරීරික දුර්වලතා
* වෙනත් සෞඛ්‍යමය දුර්වලතා

* ශ්‍රවණ දුර්වලතා
* දෘෂ්‍ය ආබාධ
* බිහිරි අන්ධභාවය
* ඕටිසම් /මනෝ වික්ෂිප්තභාවය
* මොළයේ ඇතිවන ආබාධ

## සෙසු මුස්ලිම්වරුන් කෙරෙහි ආදරය දැක්වීම

ඉස්ලාම් යනු ජීවන දර්ශනයකි. එම දර්ශනය පිළිගත් අය සමාන ලෙස පිළිගන්නා අතර, සහෝදරයන් ලෙස ද පිළිගනු ලබයි. මෙය අල්කුර්ආනය "විශ්වාසවන්තයින් (සියල්ල) ඇත්ත වශයෙන්ම සහෝදරයන් වේ." (49:10) යනුවෙන් පවසයි.

එක් මුස්ලිමෙකු තවත් මුස්ලිමෙකුගේ කරුණු සම්බන්ධයෙන් කොතෙක් දුරට අවධානය යොමු කළ යුතු ද ? එයටත් ඊමානයත් අතර තිබෙන සම්බන්ධතාවය කුමක් ද? යනාදිය සම්බන්ධයෙන් නබි (සල්) තුමාණන් පහත සඳහන් හදීසයක් මගින් පෙන්වා දී තිබේ. "ඔබලාගෙන් කෙනෙක් තමාට කැමති දේ තමාගේ සහෝදරයාට ද කැමැති වෙන තාක්කල් සත්‍ය ඊමාන්ධාරියෙකු නොවේ." (බුහාරි, මුස්ලිම්) "කවරෙක් අල්ලාහ් වෙනුවෙන්ම ආදරය පෙන්වා, ප්‍රතික්ෂේප කර ඔහු වෙන්වෙන්ම ලබා දී, වළක්වා ගන්නේ ද, ඔහුගේ ඊමානය පරිපූර්ණ විය." (අබූදාවූද්)

"මගේ ආත්මය කවරෙකුගේ ග්‍රහණයේ තිබෙන්නේ ද ඔහු මත දිවුරා කියමි, ඔබලා විශ්වාස කරන තාක්කල් ස්වර්ගයට පිවිසෙන්නේ නැත. ඔබලා එකිනෙකා ආදරය කර ගන්නා තාක්කල් විශ්වාස කරන්නේ නැත." (මුස්ලිම්)

අනෙක් මුස්ලිම්වරුන්ව හමුවන විට සලාම් පැවසීම, අතට අත දීම, රෝගීන් බැලීමට යාම, දුකේ දී, සියල්ලන්ම සමානව සැලකීම, උදව් උපකාර කිරීම යනාදිය ඔවුන් කෙරෙහි දක්වන ආදරය ප්‍රදර්ශනය කිරීමකි.

අනෙක් මුස්ලිම් සමග ආදරය දැක්වීම හා සහෝදරත්වයෙන් කටයුතු කිරීමට බාධා කරන සියලු කරුණු ඉස්ලාම් තහනම් කරයි. ආඩම්බරය කුහකකම, උඩඟුකම, විතර්ක, අසාධාරණ කිරීම, අසමානව සැලකීම යන සියල්ලම අනෙක් මුස්ලිම් කෙරෙහි දක්වන ආදරයට බාධා පමුණුවන කරුණුය. ඒ නිසා ඒවා තහනමට ලක් වී තිබේ. නබි (සල්) තුමාණන් මුස්ලිම්වරුන්ව එකම ශරීරයට ආදේශ කරන්නේ මේ හේතුව නිසාය. "මුස්ලිම්වරුන් තමා අතරේ පවත්වන ආදරය, සෙනෙහස, දයාව යනාදියට නිදසුන එක් ශරීරයක් බඳුය. එහි එක් අංගයක් වේදනාවට පත්වන විට අනෙක් අංගයන් ද නිදිවරයි. රශ්නය ද අවබෝධ කර ගනී." (බුහාරි)

එබැවින් මුස්ලිම්වරුන් සියල්ල සහෝදරයන් ලෙස තේරුම් ගෙන ඔවුන් කෙරෙහි සෙනෙහස දක්වමින් ජීවත් වෙමු.

## මුස්ලිම් නොවන අය  කෙරෙහි ආදරය දක්වීම

අල්ලාහ් මෙම විශ්වයෙහි, මිනිසා ඇතුළු සියලු ජීවින්ගේ දෙවියන් වේ. සියල්ලම නිර්මාණය කර පෝෂණය කර පරිපාලනය කර පහසුකම් සලසා ඇත්තේ ඔහුය. එම නිසා අල්ලාහ්ගේ නිර්මාණයන් යන පදනමින් සියලු නිර්මාණයන්ට ගෞරව කළ යුතු ය. විශේෂයෙන් සියලු මානව වර්ගයා කෙරෙහි ගෞරවයක් තිබීම අත්‍යවශ්‍ය වේ.

“නබි (සල්) තුමාණන් කවරෙක් පොළොවේ සිටිනවුන්ට ආදරය නොදක් වූයේ ද? අල්ලාහ් ඔහු කෙරෙහි ආදරය පෙන්වන්නේ නැත.” (බුහාරි) යනුවෙන් ප්‍රකාශ කර තිබෙන්නේ මේ නිසාය.

කාෆිර්වරුවන් වශයෙන් සිටීම හේතුවෙන් ඔවුන් සමග අසාධාරණ ලෙස කටයුතු කිරීම අල්ලාහ් ප්‍රිය කරන්නේ නැත.” (විශ්වාසවන්තයිනි) ආගමික කරුණු සම්බන්ධයෙන් ඔබලාට විරුද්ධ වී යුද නොවදින අයටත්, ඔබලාගේ නිවසින් ඔබලාව නොනෙරපු අයටත් ඔබලා ස්තුති නොකරන ලෙසත් ඔවුන් සමග (ඔබලා) සාධාරණව කටයුතු නොකිරීමටත්, අල්ලාහ් වැළැක්වූයේ නැත. ඇත්ත වශයෙන්ම අල්ලාහ් යුක්ති සහගත අයට ප්‍රිය කරයි.” 60:9)

මුස්ලිම් නොවන අයට අසාධාරණ  කිරීමත් බලහත්කාරකම් කිරීමත් ඉස්ලාම් දැඩිව හෙළා දකියි.

“මාගේ ගැත්තණි! මට මා කෙරෙහි අසාධාරණය හරාම් කර ගත්තෙමි. එය ඔබලා අතරේ ද හරාම් කළෙමි. එබැවින් ඔබලා අසාධාරණ නොකරන්න.” (මුස්ලිම්) “කවරෙක් එක් “දිම්මිට” අසාධාරණ කරන්නේ ද, පරලොව දිනයේ දී ඔහුට විරුද්ධව මම සිටිමි. ”(මුස්ලිම්) “අසාධාරණයට ලක් වූ අයගේ ප්‍රාර්ථනාව ඔහු කාෆිර් වූව ද එයට තිරයක් නැත.” (අහ්මද්) යන හදීසයන් මෙයට නිදසුන් ලෙස දක්විය හැක.

“අනෙක් මුස්ලිම්වරුන් කෙරෙහි සෙනෙහස දක්වීම” යනුවෙන් ප්‍රකාශ කරන අවස්ථාවේ දී ඔවුන්ට උදව් කිරීම, සුවදුක් විමසීම,සිත නොරිදෙන සේ කටයුතු කිරීම, ඔවුන්ට යහපත ප්‍රචාරය කර අයහපත වැළැක්වීම, ඍජු මාර්ගය වෙනුවෙන් ඔවුන්ට හිදායතය ප්‍රාර්ථනා කිරීම, යහපත් කටයුතු වලදී ඔවුන්ට සහයෝගය දක්වීම යනාදී කරුණු පිළිබිඹු වේ.

මේ අනුව අනෙක් අයවද මිනිසුන් ලෙස සිතා ඔවුන්ට ද  ගෞරව දක්වමින් ජීවත් වෙමු.

## වෙනත් ජීවින් කෙරෙහි ආදරය දක්වීම

මෙම ලෝකයේ නිර්මාණය කරනු ලැබූ ජීවින් සියල්ලම අල්ලාහ්ගේ නිර්මාණ වේ. ඒ අනුව සියලු ජීවින් එනම්  සිව්පා සතුන්, පක්ෂීන්, උරගයන්, කෘමින්, ගස්වැල් යන ඕනෑම දෙයක් කෙරෙහි ආදරය පෙන්වීම අනිවාර්ය වේ. මෙය නබි (සල්) තුමාණන් පහත සඳහන් හදීසයන්හි ඉතාමත් පැහැදිලිව සඳහන් කර තිබේ.

“එක් මිනිසෙකු අධික පිපාසිතව ගමන් කර ළිඳකට බැස ජලය පානය කර පිටවිය. එවිට එහි  සුනඛයෙකු පිපාසය හේතුවෙන් දිව එල්ලමින් දූවිල්ල ලෙවකමින් සිටියේය. ඒ

මිනිසා තමා තුළම "මට ඇති වූ තත්ත්වයම ඇති වී තිබේ." යනුවෙන් සිතා නැවත පහලට ගොස් පාවහන ජලයෙන් පුරවා ඉහලට නැග සුනඛයාට ජලය ලබාදුන්නේ ය. ඒ නිසා අල්ලාහ් ඔහුට ස්තුතිය ප්‍රකාශ කළ අතර, ඔහුගේ වැරදි ක්ෂමා කළේය. (බුහාරි, මුස්ලිම්)

"එක් ගණිකාවක වූ කාන්තාවක් දැඩි උණුසුම් දිනයක එක් බල්ලෙකු ළිඳක් වටා කැරකෙනවා දුටුවාය. ඌ පිපාසය හේතුවෙන් තම දිව එල්ලමින් සිටින බව අවබෝධ කරගෙන, ඇය තම පාවහන් ගලවා ජලය ලබා ගෙන ඌට ජලය ලබා දුන්නාය. ඒ හේතුවෙන් අල්ලාහ් ඇයගේ පව් ක්ෂමා කළේය." (මුස්ලිම්)

ඉස්ලාම් සතුන්ට හිංසා කිරීම දැඩිව හෙළා දකින අතර එය "කවරෙක් එක් පක්ෂියෙක්ව කිසිදු අවශ්‍යතාවයක් නැතිව කැපුවේ ද නැතහොත් ඝාතනය කළේ ද ඒ ගැන අල්ලාහ් කියාමත් දිනයේ දී ප්‍රශ්න කරයි. (අහ්මද්)

"ප්‍රාණය ඇති කිසිවක් ඉලක්කයක් වශයෙන් කර ගත්තන්ට අල්ලාහ් ශාප කරයි."(බුහාරි, මුස්ලිම්) යනුවෙන් නබි(සල්) තුමාණන් පැවසූ අතර එලෙස කිරීමත් තහනම් කර තිබේ. එක් අවස්ථාවක එක් සහාබිවරයෙකු කුරුළු පැටවුන් ගත් විට ලත වූ මව් කිරිල්ලි ළඟ උන් නැවත තබා එන ලෙස අණ කරනු ලැබිණි. තවත් විටක දී ගිනිබත් කෙරුණු ලැබූ කුඹි ගුලක් පසු කරමින් ගිය නබි (සල්) තුමාණන් " දෙවියන් හැර වෙන කිසිවෙක් ගින්නෙන් වේදනාවට පත් නොකළ යුතුයි." (අබූදාවූද්) යනුවෙන් පැවසූහ.

එක් බළලෙකුට හිංසා කිරීම හේතුවෙන් අපාය ගත වූ කාන්තාවකගේ කථාවක් නබි (සල්) තුමාණන් විස්තර කළේය. "එක් ස්ත්‍රීයෙකු එක් බළලෙකුගේ කරුණු සම්බන්ධයෙන් නිරයට ඇතුල් විය. ඇය එයට ආහාර නොදී බැඳ තබන ලදී. පොළොවේ තිබෙන කෘමීන් කෑමට ද ඌට ඉඩ දුන්නේ නැත." (බුහාරි)

ඉස්ලාම් සමහර සතුන් හා පක්ෂීන්ව අනුභවයට අනුමැතිය ලබාදී ඇත. එම ජීවීන්ව නිර්මාණ කරනු ලැබූ අල්ලාහ් ඒ සඳහා අවසරය ලබාදී ඇත. මිනිස් ජීවිතයේ පැවැත්ම සඳහා මෙවන් ආකාරයේ ආහාර ගැනීමේ ක්‍රමය අවශ්‍ය වේ. නමුත් සීමාව ඉක්මවා නාස්තිකාරි ලෙස සතුන් අනවශ්‍ය ලෙස කැපීම ඉස්ලාම් තරයේම හෙළා දකියි. අවශ්‍යතා අනුව පමණක් සතුන්ව කපා අනුභව කිරීමට ඉස්ලාම් අනුබල දී ඇත. එම අවස්ථාවේ දී වුව ද, වද හිංසාවලින් තොරව සතුන්ව කැපීමේ ක්‍රම වේදයක් ඉස්ලාම් හඳුන්වා දී ඇත. එය අවසාන දූතයාණන් වන නබි (සල්) තුමාණන් ඉතාමත් කෙටියෙන් පවසා ඇත.

"ඔබලා කපන්නේ නම් යහපත් ලෙස කපන්න. කපනු ලැබූ සතාව හොඳින් දඟලන්න ඉඩහරින්න. පිහිය හොඳින් මුවහත් කර ගන්න." (මුස්ලිම්)

## සෙසු මුස්ලිම්වරුන්ට කළ යුතු යුතුකම්

එක් මුස්ලිමෙකු අනෙක් මුස්ලිමෙකුට කළ යුතු යුතුකම් බොහෝ තිබේ. ස්තුතිය ප්‍රකාශ කිරීම, අඩුපාඩුකම් වසන් කිරීම, දවස් තුනකට වඩා කථා නොකර සිටීමෙන් වැළකී සිටීම, ඊර්ෂ්‍යාව, වැරදි චේතනාවෙන් තොරවීම, වංචාව, නොරවටා සිටීම, යනාදිය ඒවායින්

සමහරකි. නබි (සල්) තුමාණන්ගේ හදීස්හි අනෙක් මුස්ලිම්වරුන්ට කළ යුතු යුතුකම් ලෙස මෙසේ ද ප්‍රකාශ කර ඇත. ඒවා පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

## සලාම් පැවසීම

සැම ආගමිකයින්ටම, ආවේණික වූ ආචාර සමාචාර ක්‍රම ඇත. එම සමාජ සාමාජිකයන් එකිනෙකා හමුවන මොහොතේ දී, එය ප්‍රකාශ කර, කථා කිරීමට පටන් ගනී. ඉස්ලාම් ඉතාමත් පරිපූර්ණ වූ, සැම විටම ප්‍රකාශ කළ හැකි, හැමෝටම අත්‍යවශ්‍ය අදහස් ඇතුළත් හඳුන්වා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇත. එය "අස්සලාමු අලෙක්කුම් (ඔබ කෙරෙහි ශාන්තියත් සමාදානයත් ලැබෙත්වා) වන සලාමය වේ. "අස්සලාම්" යන්න අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමයන්ගෙන් එකක් ලෙසත් මෙහි දී අවධානය යොමු විය යුතු කරුණක්.

කුර්ආනය ආචාර සමාචාර කිරීම පිළිබඳව සඳහන් කරයි. "ඔබලාට සලාම් කියනු ලැබුවහොත්, , (එයට පිළිතුර වශයෙන්) ඊටත් වඩා අලංකාර ලෙස පවසන්න. එසේ නැතහොත් එයම නැවත ප්‍රකාශ කරන්න. " (4:86)

"අල්ලාහ් ප්‍රථම මිනිසා ආදම් (අලෙ) තුමාණන්ව නිර්මාණය කර එහි ගොස් සමහරුන්ට (සමහර මලාඉකාවරුන්) සලාම් පවසන්න. ඔහු කුමක් නැවත ප්‍රකාශ කරන්නේ ද යන්නත් සාවධානව ශ්‍රවණය කරන්න. එය ඔබගේත්, ඔබගේ පරම්පරාවේත් ආචාර ක්‍රමයයි." ලෙස ප්‍රකාශ කළේය. එවිට ඔවුන් "අස්සලාමු අලෙක්කුම්" ලෙස ප්‍රකාශ කළ අතර ඔවුන් "අස්සලාමු අලෙකුම් වරහ්මතුල්ලාහ් " යනුවෙන් "වරහ්මතුල්ලාහ්" යන වාක්‍ය වැඩිකර පැවසුවෝය. (බුහාරි, මුස්ලිම්)

නබි (සල්) තුමාණන් වෙත මිනිසෙකු පැමිණ "ඉස්ලාමයේ උසස් දේ කුමක් ද?" යනුවෙන් ප්‍රශ්න කළ අවස්ථාවේ දී, "ඔබ ආහාර ලබාදීමත්, දන්නා අයටත්, නොදන්නා අයටත් සලාම් පැවසීමත් වේ." යනුවෙන් පිළිතුරු ලබා දුන්හ. (බුහාරි, මුස්ලිම්)

කාරුණික නබි (සල්) තුමාණන් සලාම් පැවසීම ස්වර්ගයට ළඟා කරවන එක් යහපත් ක්‍රියාවක් ලෙස විස්තර කළේය. "ඔබලා ඊමාන් කරන තාක්කල් ස්වර්ගයට පිවිසෙන්නේ නැත. ඔබලා එකිනෙකා ආදරය කරන තාක්කල් ඊමාන්ධාරියෙකු නොවේ. ඔබලාට එක් කරුණක් පෙන්වා දෙන්න? එය කළහොත් එකිනෙකා ආදරය කර ගනී. ඔබලා අතරේ සලාමය පතුරුවන්න." (මුස්ලිම්)

සලාම් පැවසීමට අදාළ ක්‍රමවේදය දේවදූතයාණන් (සල්) තුමාණන් බොහෝ හදීස්වල විස්තර කර තිබේ.

සම්පූර්ණයෙන් සලාම් පැවසිය යුතුයි. "අස්සලාමු අලෙකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු" යනුවෙන් ප්‍රකාශ කිරීම කුසල් 30ක් ලබා දේ. යනුවෙන් (අබූදවූද්, තිර්මිදි) හදීස්වල සඳහන් වේ.

වාහනයේ ගමන් කරන්නන් පයින් ගමන් කරන්නාට ද, ගමන් කරන්නා වාඩි වී සිටින්නන්ට ද, කුඩා කණ්ඩායමක් විශාල කණ්ඩායමට ද සලාම් පැවසිය යුතු ය. (බුහාරි, මුස්ලිම්)

සලාම් පැවසීමට ප්‍රමුඛ විය යුතුයි. පිළිතුරු කීම ප්‍රමාද කිරීම හෝ වැළක්වා ගැනීම හෝ නොකළ යුතුයි.

එබැවින් සලාමය පතුරුවා ස්වර්ගයට පිවිසෙමු.

## සුවදුක් විමසීම

එක් මුස්ලිමෙකු තවත් මුස්ලිමෙකුගේ ජයග්‍රහණයේ දී පමණක් ම නොව දුකේ දී ද සහභාගි විය යුතු යි, යන ගුණාංගය තහවුරු කිරීමට, මෙම ගුණාංගය ඉස්ලාම් දිරි ගන්වයි.

“එක් මුස්ලිමෙකු මත අනෙක් මුස්ලිම් කෙරෙහි යුතුකම් පහක් තිබේ. සලාමයට පිළිතුරු දීම, සැපදුක් විමසීම, ජනසාව පසුපස ගමන් කිරීම, කැඳවීමට පිළිතුරු දීම, කිවිසුම් හැරිය අයට පිළිතුරු දීම (බුහාරි, මුස්ලිම්)

“රෝගීන්ව සැප දුක් විමසීමට යන්න, කුසගින්නේ සිටිනවුන්ට ආහාර ලබාදෙන්න. සිරකරුවන්ව නිදහස් කරන්න (බුහාරි, මුස්ලිම්)

ලෙඩ දුක් විමසීමට යෑම මගින් ලැබෙන කුසලයන් පිළිබඳව නබි (සල්) තුමාණන් පහත සඳහන් ආකාරයට පැවසූහ. “ඇත්ත වශයෙන්ම එක් මුස්ලිමෙකු තම මුස්ලිම් සහෝදරයාව ලෙඩරෝග විමසීමට ගොස් නැවත පැමිණෙන තෙක් ස්වර්ගයේ පලතුරු නෙළමින් සිටී.”(මුස්ලිම්)

“එක් මුස්ලිමෙකු, සහෝදර මුස්ලිමෙකුගෙන් සැප දුක් විමසීමට උදේ වරුවේ ගමන් කරන්නේ නම් හැත්තෑදහක මලාඉකාවරුන් ඔහු වෙනුවෙන් සවස්වරුව දක්වා ප්‍රාර්ථනා කරති. ඔහු සවස්වරුවේ සුවදුක් විමසීමට ගියේ නම් පහන්වනතුරු මලාඉකාවරුන් හැත්තෑ දහසක් ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරති. ඔහු වෙනුවෙන් ස්වර්ගයේ පලතුරු සූදනම් කරනු ලබයි.” (තිර්මිදි)

නබි (සල්) තුමාණන් මුස්ලිමෙකු වුව ද මුස්ලිම් නොවන්නෙකු වුව ද ඔවුන්ගෙන් සැපදුක් විමසන පුරුදු ඇත්තෙකු වශයෙන් සිටියහ. මුස්ලිම් නොවන අය නම් ඔහු වෙත ඉස්ලාමය, පැවසීමට එතුමාණන් අමතක කරන්නේ නැත. මුස්ලිමෙකු වෙත ගියහොත් ඔහුගේ (හිස අසල වාඩිවී ස්පර්ශ කර සැනසුම් බස් පවසා ප්‍රාර්ථනා කරන්නෙකු වශයෙන් සිටියහ. මෙම කරුණ පිළිබඳව බොහෝ හදීසයන් සාක්ෂි දරයි.

“රෝග විමසීමට යෑම” යන පිරිහෙමින් පවතින යහපත් ගුණාංගය අපගේ ජීවිතයේ දී අනුගමනය කරමු.

## ජනාසාව (මෘත දේහය) පසුපස යෑම

එක් මුස්ලිම් කෙනෙකු මරණයට පත් වූ විට ඔහු වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමට ඉදිරිපත් වන අතරතුර ඔහුගේ ජනාසාව පසුපස ගමන් කිරීම ද සිදු කළ යුතුයි. ආයිෂා (රලි) තුමිය පවසයි. “දේවදූතයාණන් (සල්) රෝගීන්ගේ සැප දුක් විමසීම ජනාසාව පසුපස ගමන් කිරීම, කිවිසුම් හැරිය අයට පිළිතුරු ලබාදීම, දුර්වලයන්ට උදව් කිරීම, අසාධාරණයන්ට ලක්වූවන්ට උදව් කිරීම, සලාමය ව්‍යාප්ත කිරීම, දිළිඳු අයට උදව් කිරීම යන කරුණු හත අපට අණ කර සිටියහ.” (බුහාරි,මුස්ලිම්)

ජනාසාව පසුපස ගමන් කිරීම යනු, එය භූමදානය කිරීම දක්වා රැඳී සිටීම අදහස් කරයි. “කවරෙක් ජනාසා සලාතය ඉටු කිරීම දක්වා ජනාසාවට සහභාගි වන්නේද ඔහුට එක “කීරාත්”කුසලක් ලැබේ. “කවරෙක් භූමදනය කිරීම දක්වා සහභාගි වන්නේ ද ඔහුට “කීරාත් දෙකක කුසල ලැබේ.” යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූ අතර “කීරාත්” දෙකක් යනු කුමක් ද? යනුවෙන් නබි සගයන් විමසූහ. නබි (සල්) තුමාණන් එය විශාල කඳු දෙකකට සමාන වේ.” යනුවෙන් ප්‍රකාශ කළහ.” (බුහාරි, මුස්ලිම්)

මරණයට පත් වූ අයගේ නිවසට ගොස් සැනසිලි බස් පවසන විට පවුලේ හිතවතුන්ට සැනසුම ලැබීමටත්, ඉවසීමටත් අවස්ථාවක් ලැබෙන අතර සහෝදරත්වය වර්ධනය කිරීමටත් අවස්ථාවක් උදා වේ. ජනාසාව පසුපස යෑම මගින් මරණය සිහි ගැන්වීමත්, පරලොව දිනය පිළිබඳව අදහසක් ද ඇතිවිය හැකිය. එබැවින් මෙම ගුණාංගයන් අපගේ ජීවිතයට ද අදළ කරගමු.

## කිවිසුම් පිට කළ අයට පිළිතුරු දීම

කිවිසුමට පිළිතුරු දීමත් ඉස්ලාමීය ලක්ෂණ ක්‍රමයකි. මෙය ද සහෝදරත්වයේ එක් ගුණාංගයක් බව ඉස්ලාම් අදහස් කරයි.

“ඔබලාගෙන් කෙනෙකු කිවිස “අල්හම්දුලිල්ලාහ්” ලෙස ප්‍රකාශ කළහොත්, ඔහුගේ සහෝදරයන් එයට, ඔහුට “යර්හමුකල්ලාහ්” යනුවෙන් ප්‍රකාශ කළ යුතුයි. එලෙස පැවසුවහොත් ඔහුට ඔහු (කිවිසුම් හැරිය පුද්ගලයා “යහ්දීකල්ලාහු වයුස්ලිහුබාලක” යනුවෙන් ප්‍රකාශ කළ යුතුයි. (බුහාරි)

කිවිසුම් පිටකරන විට අනුගමනය කළ යුතු ක්‍රම වේදයත් නබි (සල්) තුමාණන් කර පෙන්වා ඇත. නබි (සල්) “කිවිසුම් හරින විට තම අත හෝ වස්ත්‍රය කටේ තබා ශබ්දය අවම කර ගනියි.” (බුහාරි, මුස්ලිම්)

අනෙක් අයගේ හිත නොරිදෙන ආකාරයට කිවිසිය යුත්තේ කෙසේ ද යන්න නබි (සල්) තුමාණන් පැවසූ හදීසය මාර්ගෝපදේශයන් ලෙස පිළිගෙන කටයුතු කරමු.

## අවශ්‍යතා ඉටු කිරීම

එක් මුස්ලිමෙකු අනෙක් මුස්ලිමුන්ට කළ යුතු යුතුකම් වලින් ඔහුගේ අවශ්‍යතා ඉටුකර උදව් උපකාර කිරීමත් එකකි. “සෑම මුඃමින් කෙනෙකුම එකිනෙක ඒකාබද්ධ වූ ගොඩනැගිල්ල බඳුය. ඔවුන් එකිනෙකා අතර ශක්තිය ලබා දේ.” (බුහාරි මුස්ලිම්) යන නබි (සල්) තුමාණන්ගේ අදහසට අදාළව අනෙක් මුස්ලිම් කෙනෙකුගේ දුර්වලතා, දුක, ශෝකය යනාදී කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර පුළුවන් තරමින් ඒවා තුනී කරගැනීමට උත්සාහ දැරිය යුතුයි.

අනෙක් අයගේ අවශ්‍යතා ඉටු කිරීම මගින් තමාගේ අවශ්‍යතා අල්ලාහ් විසින් ඉටු කරනු ලබන බව දේවදූතයාණන් (සල්) තුමාණන් විස්තර කළහ. “එක් ගැත්තකු තමාගේ සහෝදරයාගේ අවශ්‍යතාවය ඉටුකරන තාක්කල් අල්ලාහ් ඔහුගේ අවශ්‍යතාවද ඉටු කරයි. ” (තබරානි)

“එක් මුස්ලිමෙකු තවත් මුස්ලිමෙකුගේ සහෝදරයන් වේ. ඔහුට අසාධාරණ නොකරයි. ඔහුව සතුරන්ට භාර දෙන්නේ ද නැත. කවරෙක් තම සහෝදරයාගේ අවශ්‍යතාවය ඉටු කිරීමට කටයුතු කරන්නේ ද අල්ලාහ් ඔහුගේ අවශ්‍යතා ඉටු කිරීමට කටයුතු කරයි. කවරෙක් මුස්ලිමෙකුගේ එක් දුකක් ඉවත් කරන්නේ ද (එයට කුලියක් වශයෙන්) අල්ලාහ් ඔහුගේ පරලොව දිනයේ දුකක් ඉවත් කරයි. කවරෙක් එක් මුස්ලිමෙකුගේ දුර්වලකම් වසන් කරන්නේ ද, අල්ලාහ් පරලොව දිනයේ දී ඔහුගේ දුර්වලතා වසන් කරයි. (බුහාරි, මුස්ලිම්)

“එක් මූඃමින් කෙනෙකු එක් දුකක් ඉවත් කළහොත්, එයට කුලියක් වශයෙන් අල්ලාහ් ඔහුගේ පරලොව දිනයේ දුක්වලින් එක් දුකක් ඉවත් කරයි. එක් දුගියෙකුගේ අපහසුව ලිහිල් කළහොත් අල්ලාහ් ඔහුට මෙලොව, පරලොව ක්‍රියාවන්ද පහසු කරයි.” (මුස්ලිම්)

සමාජයේ තිබෙන අවශ්‍යතාවයන් දුෂ්කරතා මග හරවා ගැනීමට උදව් කළ යුතුය, යන මානසිකත්වය වර්ධනය කරන ඉස්ලාම් “ඉඃතිකාෆ් ” (අල්ලාහ් වෙනුවෙන් මස්ජිදයේ රැඳී සිටීම ට) සිටීමට වඩා තමාගේ සහෝදරයාගේ අවශ්‍යතා ඉටුකිරීමට පියවර කිහිපයක් ගමන් කිරීම උසස් කොට ඇත. “කවරෙක් තම සහෝදරයාගේ අවශ්‍යතාව ඉටුකිරීමට ගමන් කරන්නේ ද, එය ඔහු වසර දහයක් “ඉත්තිකාෆ් සිටීමට වඩා උසස් වේ.” (තබරානි)

එලෙසම ජනතාවට උදව් කිරීමට පහසුකම් තිබියදිත් ඒ සම්බන්ධයෙන් අලසකමින් සිටින්නවුන්ට අල්ලාහ් එම ආශිර්වාද ඉවත්කර ගන්නා බව නබි (සල්) තුමාණන් අනතුරු අඟවා ඇත. “අල්ලාහ් එක් ගැත්තෙකුට අධික ලෙස ආශිර්වාද කරයි.” පසුව ජනතාවගේ අවශ්‍යතාවලින් සමහරක් ඔහු වෙත පවරයි. එවිට ඒ මිනිසා අලස වුවහොත් එවිට ඔහු (අල්ලාහ්ගේ) ඒ ආශිර්වාද ඉවත් කර ගනියි.” (තබරානි)

එබැවින් අනෙක් අයගේ අවශ්‍යතා අවබෝධ කරගෙන අනුන්නට උදව් කිරීමෙන් ජීවත් වෙමු.

## මධ්‍යස්ථ බව (වසතිය්‍යා) රැකීම (මධ්‍යම ප්‍රතිපදාව)

මුස්ලිම් සමාජයේත් එහි ජීවත් වන සෑම තනි මිනිසෙකුගේම, විශේෂ ගුණාංගවලින්, මධ්‍යස්ථ බව අනුගමනය කිරීමද, එකකි. “(විශ්වාසවන්තයිනි), එලෙසම (උස්පහත් නොවූ), මධ්‍යස්ථ සමාජයක් වශයෙන් අප ඔබව පත් කළෙමු. ” (2:143)

මධ්‍යස්ථ බව අනුගමනය කිරීම යනු ඉස්ලාමීය ෂරීආව විස්තර කරන්නාවූ එක් මූලික අංගයකි. කුමන හෝ කරුණක් සම්බන්ධව ද සීමාව ඉක්මවා නොගොස්, කිසිසේත් සම්බන්ධ නොවී සිටීමේ තත්ත්වය අතර වූ යහපත් තත්ත්වය මධ්‍යස්ථ බව නම් වේ.

ලෞකික ජීවිතය පරලෝ ජීවිතය යනාදියේ දී ඉස්ලාම් මධ්‍යස්ථ බව අනුගමනය කරන ලෙසට අපට අණ කරයි. පරලොව දිනය අමතක කර ලෞකික ජීවිතයේ සම්පූර්ණයෙන්ම ගිලිහි ජීවත්වීම වැරදි බව අඟවන ඉස්ලාම් පරලොව ජීවිතය වෙනුවෙන් ලෞකික

ජීවිතයෙන් ඈත් වී ජීවත් වීමද පිළිගන්නේ නැත. පරළොව දිනයේ ජයග්‍රහණය ලැබීමට ලෞකික ජීවිතයට සාධකයක් බව අඟවන ඉස්ලාම් ලෞකික ජීවිතයක් අවශ්‍ය බව පෙන්වා දෙයි. පරලොව දිනය සමග සංසන්දනය කිරීමේදී ලෞකික ජීවිතය අල්ප වූ දෙයක්. වටිනාකමින් තොර දෙයක්. මෙවන් ආකාරයේ වූ මධ්‍යස්ථ තත්වයේම මුස්ලිම් කෙනෙකුගේ කටයුතු පවතියි. “අල්ලාහ් ඔබට ලබාදී තිබෙන දෙයින් (දන් දී) පරලොව නිවහන සොයා ගන්න. මෙලොවේ ඔබගේ කොටසත් අමතක නොකරන්න.” (28:77) යනුවෙන් පවසන අල්කුර්ආනය මෙලොව පරලොව යන දෙකටම ප්‍රාර්ථනා කරන ලෙස ඉල්ලා සිටියි. එනමුත් “අපගේ හිමියනි, අපට ඔබ මෙලොවදීත් යහපත සිදු කරත්වා, පරලොව දිනයේදීත් යහපත සිදු කරත්වා, (අපායේ) ගින්නේ වේදනාවෙන් අපව මුදවා ගනිත්වා!” යනුවෙන් ප්‍රකාශ කරන්නන්ද මිනිසුන් අතරෙහි සිටියි. (2:201)

මෙම ගුණාංගය, සදචාරාත්මක අංග සියල්ලෙහිම ගැබ්වී පැවතීම අපට නිරීක්ෂණය කළ හැකිය. වියදම් කිරීම යන ගුණාංගය ගත් විට සීමාව ඉක්මවා නාස්තිකාර ලෙස වියදම් කළහොත් එය උඩඟු බව, නාස්තිය යනුවෙන් ප්‍රකාශ කර තහනම් කරන ඉස්ලාම් අවශ්‍ය අවස්ථාවන්හිදී වියදම් නොකර සිටීම මසුරුකම යනුවෙන් හෙළා දකී.

කෑම බීමේදී වුවද මෙම මධ්‍යස්ථ තත්වය අවධාරණය වී තිබේ. එක් මුස්ලිමෙකු ආහාරයට තන්හාවෙන් ලංවන්නේ නැත. එමෙන්ම නාස්ති කරන්නේ ද නැත. සීමා ඉක්මවා අනුභවය කිරීමත් හෝ පානය කිරීමත් සිදුකරන්නේ නැත. ඒවා සම්පූර්ණයෙන්ම අඩුකර ගන්නේ ද නැත. ඔහු සිටගෙන අල්ලාහ්ව නැමදීමට ඔහුගේ ශරීරය ශක්තිමත්ව සෞඛ්‍යවත්ව, පිබිදී තිබිය යුතුය. එයට අදාළ ලෙස ඔහුගේ ආහාර පුරුද්ද පවතියි.

කෝපාවිෂ්ඨවීම යන ගුණාංගය ගත් කළ ද, මෙම ත්ත්වයම පවතියි. සෑම දේකටම තරහ වීමත්, කඩා පැනීමත් මුස්ලිම් කෙනෙකුගේ චර්යාවක් නොවේ. සත්‍යය යුක්තිය ප්‍රතික්ෂේප කිරීමට ලක්වන අවස්ථාවල වැරැදි සිදුවන අවස්ථාවලදී, ආත්ම ගෞරවය උදුරා ගන්නා අවස්ථාවලදී සටන්වල යෙදෙන අවස්ථාවලදී කෝපාවේශය දකින්නට තිබිය යුතුය.

මෙම මධ්‍යස්ථ ගුණාංගවලට, යහපත් ආදර්ශයක් වශයෙන් නබි (සල්) තුමාණන්ගේ ජීවිතය පැවතුණි. එතුමාගේ ජීවිතයේ සෑම කොටසක්ම, මධයස්ථ ගුණාංගවලින් යුක්ත විය. එතුමාගේ අධ්‍යාත්මික ජීවිතය පරිපූර්ණ විය. පාදයන් ඉදිමෙන තෙක් රාත්‍රි නැමදුම්වල යෙදුනහ. අධික ලෙස උපවාස රැක්කහ. දික්ර් කළහ, මෙවන් ආකාරයට දෙවියන් සමග තිබුණු සම්බන්ධතාවය ඉතාමත් දැඩි එකක් විය. එමෙන්ම ලෞකික ජීවිතයේ තනි පුද්ගල, පවුල්, ආර්ථික, දේශපාලන ක්ෂේත්‍රවල ඉතාමත් උසස් ලෙස ක්‍රියා කළහ. එතුමාණන්ගේ පවුල් ජීවිතයත්, සමාජ ජීවිතයත්, මධ්‍යස්ථ ගුණාංග ලින් යුක්ත විය. සමාජ ක්‍රියාකාරකම් සඳහා පවුලෙන් ඈත්වීමෙන් හෝ පවුල් ක්‍රියාකාරකම සඳහා සමාජයෙන් ඈත් වී යුතුකම් ඉටු කිරීමෙන් තොරව එතුමාණන් ජීවත් වූයේ නැත. එකම කාලයේ දී දෙපැත්තටම සමබර දායකත්වයක් ලබා දුන්හ.

එබැවින් දරදඬු ප්‍රතිපත්තිය අනුගමනය නොකර නබි (සල්) තුමානන්ව අනුගමනය කර හැම විටකදීම මධ්‍යස්ථව කටයුතු කරමු.

## දෛනික ජීවිතයේ දී අනුගමනය කළයුතු යහ ගුණාංග

මුස්ලිමෙකු දෛනික ජීවිතයේ දී කළ යුතු  යහ ගුණාංග රාශියක් ඇත. ඒවායෙන් ඉතා වැදගත් කරුණු කිහිපයක් දෙස අවධානය යොමු කරමු.

### සත්‍ය කථා කිරීම

සත්‍ය කථා කිරීම හැර සමාජයේ ස්ථිරත්වයත් ශක්තිමත් බවත් ඇති කළ හැකි වෙනත් කිසිදු ගුණාංගයක් නැත. සත්‍ය කථා කිරීම යන ගුණාංගය සමාජයක් ස්ථාපිත කිරීමේ යහ ගුණාංගවලින් ප්‍රධාන ගුණාංගයක් ලෙස පවතින්නේ මේ නිසාය.

එක් මුස්ලිම්වරයෙකු සෑම විටකදීම සත්‍ය වන්තයෙකු වේ. ඉස්ලාම් සත්‍ය කථා කිරීම, යහපත් ගුණාංගවලින් එකක් බව උගන්වයි. සත්‍ය එහි අයිතිකරුවාව ස්වර්ගය කරා ගමන් කරවීමේ කුසලයන් කිරීමට උනන්දු කරයි. එලෙසම බොරුව අපාය කරා යොමු කරන අකුසලයන් සිදු කිරීමට දිරි ගන්වයි.

මෙය නබි (සල්) තුමාණන් ඉතාමත් පැහැදිලිව පැවසුහ. “ඇත්ත වශයෙන්ම සත්‍ය යහපත් ක්‍රියාව සඳහා මග පෙන්වයි. යහපත් ක්‍රියාවන් ස්වර්ගයට සමීප කරයි. ඇත්ත වශයෙන්ම සත්‍ය කථා කරන්නා අල්ලාහ් ඉදිරියේ ඔහු සත්‍යවන්තයෙකු ලෙස ලියනු ලබයි. බොරුව පව් කරා මග පෙන්වයි. එක් මිනිසෙකු බොරු කී විට අවසානයේ දී අල්ලාහ් ඉදිරියේ ඔහු බොරුකාරයෙකු ලෙස ලියනු ලැබේ.” (බුහාරි) අල්ලාහ්ගේ සමාජයේ “සත්‍යවන්තයා” ලෙස ලියනු ලැබීම ඉතා උසස් තත්වයක් වේ. “බොරුකාරයෙකු” ලෙස ලියනු ලැබීම ඉතාමත් පහත් තත්වයකි.

අල්කුර්ආනයත්, සුන්නාවත් සත්‍ය කථා කිරීමේ සුවිශේෂත්වයත්, වැදගත්කමත් බොහෝ ස්ථානවල විස්තර කර තිබේ. ඒවායෙන් සමහරක් දෙස අවධානය යොමු කරමු.

සත්‍ය කථා කිරීම, නබිවරුන්ගේ විශේෂ ගුණාංග ලෙස අල් කුර්ආන් විස්තර කරයි. “නබිතුමණි, මේ ආගමේ ඉබ්රාහිම් ගැනත් මදක් පවසන්න. ඇත්ත වශයෙන්ම ඔහු සත්‍යවන්තයෙකු ලෙසත් නබි කෙනෙකු ලෙසත් සිටියෙහිය. (19:41) මෙලෙසම ඉද්රීස් (අලෛ), ඉස්මායිල් (අලෛ) ගැනත් මෙවන් අදහසම අල් කුර්ආන් ඉදිරිපත් කරයි.

අවසාන දූතයාණන් (සල්) තුමාණන්ට, නබිත්වය ලැබීමට පෙරම එතුමාණන් ලබා තිබුණු විශේෂ නම්වලින් අස්සාදික්-සත්‍යවන්තයා යන්නත් එකක් වේ. නබිත්වය ලැබීමට පසුව සතුරන්ගේ කිසිවෙකුත් එතුමාණන්ට “මුසාවාදියෙකු” ලෙස පැවසුවේ නැත. සියල්ලන්ටම වඩා සත්‍ය කථා කිරීම යනු අල්ලාහ්ගේ ගුණාංගයකි. අල්කුර්ආන් පවසයි.

“කවරෙක් විශ්වාස කර යහපත් ක්‍රියාවන්හි යෙදෙන්නේ ද ඔවුන්ව පරලොව දිනයේ දී අප ස්වර්ගයට ඇතුල් කරන්නෙමු. එහි දිය ඇලි සදා ගලමින් තිබේ. ඔවුන් සදාකාලිකවම රැදේ. අල්ලාහ්ගේ මෙම පොරොන්දුව සම්පූර්ණයෙන් සත්‍ය වේ. අල්ලාහ් හැර සත්‍ය කථා කරන්නා කවරෙක් ද ?” (4:122)

ස්වර්ගය ලබා ගැනීම ස්ථිර කරන දෙයක් ලෙස නබි (සල්) තුමාණන් සත්‍ය කථා කිරීම ගෙන හැර පෙන්වා ඇත. “ඔබලා කරුණු දෙක අනුගමනය කරන ලෙස මට පොරොන්දු වෙන්න. මා ඔබට ස්වර්ගය ලැබේ යන පොරොන්දුව ලබා දෙමි. ඔබලා කථා කළහොත් සත්‍යම කථා කරන්න, පොරොන්දු ලබා දුන්නහොත් ඉෂ්ඨ කරන්න, විශ්වාස කළහොත් එය නිවැරදි ලෙස ඉටු කරන්න. ” ඔබලාගේ රහසඟ ආරක්ෂා කරගන්න. බැල්ම පහත් කරගන්න. දෑත පාලනය කරගන්න. “(අහ්මද්)”

“කවරෙක් තම හකු දෙක අතර තිබෙන දෙයත් (දිවත්) තම කළවා දෙක අතරේ තිබෙන දෙයත් (ලිංගේන්ද්‍රිය) ආරක්ෂා කරගන්නා බව පොරොන්දු වන්නේ ද ඔහුට මම ස්වර්ගය පොරොන්දු වෙමි. (බුහාරි)

ප්‍රායෝගිකව සෑම විටම සත්‍යය කථා කිරීම මානසික නිදහසත් ලබා දෙන බවත්, බොරු කථා කිරීම, අවුල් බවත්, අවිශ්වාසයත් ගොඩ නගන බවත් නබි (සල්) තුමාණන් ඉතාමත් කෙටියෙන් පහත සඳහන් හදීස හි සඳහන් කර ඇත. “ඇත්ත වශයෙන්ම සත්‍ය කථා කිරීම සැනසීම වේ. බොරු කථා කිරීම අවිශ්වාසයයි. ” (තිර්මිදි, අහ්මද්)

සත්‍ය කථා කළයුතු අත්‍යවශ්‍ය අවස්ථාවලින් එකක් ලෙස වෙළඳාම් කරන ස්ථානය සැලකිය හැකිය. එය නබි (සල්) තුමාණන් පහත සඳහන් ආකාරයට විස්තර කළෝය. “සත්‍ය කථා කරන, යුක්ති සහගතව කටයුතු කරන ව්‍යාපාරිකයා පරලොව දිනයේ දී නබිවරුන් සමඟත්, සත්‍ය වන්තයන් සමඟත් ජීවිත පරිත්‍යාගීන් සමඟත් පසුවෙයි. “(ඉබ්නු මාජා) “තඃවා සමඟත්, සත් ක්‍රියාව සමඟත්, සත්‍ය සමඟත් සිටියවුන් හැර අනෙක් ව්‍යාපාරිකයන් පරලොව දිනයේ දී පව් කාරයන් ලෙසට නැගිට්ටවනු ලබන්නෝය. “(තිර්මිදි, ඉබ්නු මාජා)” වෙළෙඳුන් දෙදෙනෙක් (විකුණන්නා සහ මිලදී ගන්නා) ස්ථානයෙන් ඉවත් වන තාක්කල් තෝරා ගැනීමේ නිදහස ඇත්තන්ය. ඔවුන් සත්‍ය කථා කර පැහැදිලිව සිටියහොත් ඔවුන්ගේ වෙළඳාමෙහි අභිවෘද්ධියක් ඇති කරනු ලැබේ. (බරකත්) ඔවුන් බොරු පවසා (අඩුපාඩු) සඟවා තිබුණහොත් ඔවුන්ට සමහර විට ලාභය ලැබිය හැකිය. එනමුත් ඔවුන්ගේ වෙළඳාමෙහි අභිවෘද්ධිය (බරකත්) නොතිබේ.” (මිෂ්කාත්)

සත්‍ය කථා කිරීමෙහි බොහෝ ආකාරයන් තිබේ. ඒවායෙන් ප්‍රධාන වර්ග 3ක් මෙහි සලකා බලමු.

1. චේතනාව

සිතෙහි පරිශුද්ධ චේතනාව දැරීම මේ කොටසට අයත්වේ. කිසියම් කරුණක් යහපත් චේතනාවෙනුත් අල්ලාහ් වෙනුවෙනුත් ඉටුකරන අතර, තමන් ළඟ (නැති වුවද) තිබුණහොත් සත් කරන බවට ඉටා ගැනීම මෙම වර්ගයටම අයත් වේ. (ඉඛ්ලාස් යන පාඩමේ මේ ගැන පැහැදිලිව විස්තර කර ඇත්තෙමු. එහි තිබෙන කරුණු සමග තවත් සමහර කරුණු මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමු.)

මෙවන් ආකාරයේ වූ චේතනාව සාමාන්‍ය ක්‍රියාවද ඉබාදතයක් කරන බලය දරයි. එක් මුස්ලිමෙකු හලාල් ලෙස උපයා ගත යුතුය. තමාගේ භාර්යාව, දෙමව්පියන්, දරුවන්ටද හලාල් ලෙස ආහාර ලබාදිය යුතුය.සත් ක්‍රියාවන්ට වියදම් කළ යුතුය. යන චේතනාවෙන් මුදල් ඉපැයීමේ කටයුත්තෙහි නියැලුනහොත් එය ඉබාදතයක් ලෙස වෙනස් වේ.

තමාට ඉටු කළ නොහැකි කරුණු සම්බන්ධව උසස් කුලිය හුදෙක් චේතනාවෙන් පමණක් ලබාගත හැකි ලෙස බොහෝ හදීසයන් විස්තර කරයි. "කවරෙක් තමාට ජීවිත පරිත්‍යාගය (ෂහාදත්) ලැබිය යුතු බවට ඇත්ත වශයෙන්ම ප්‍රාර්ථනා කරන්නේ ද, ඔහුට අල්ලාහ් ජීවිත පරිත්‍යාගශීලීන්ගේ තත්ත්වය තම ඇතිරිල්ල මත මරණයට පත්වූවද ලබා දෙන්නේය." (මුස්ලිම්, අබූදාවූද්, ඉබ්නු මාජා)

"එක් මිනිසෙකුට අල්ලාහ් බුද්ධිය ලබා දී ඇත. මුදල ද ඔහුට ලබා දී නැත. ඔහු සත්‍ය චේතනාවෙන් "මට මුදල් තිබුණහොත් මම ඒ පුද්ගලයා මෙන් පින්දහම් අමල් කරමි " ලෙස පවසයි. ඔහු සත්‍ය චේතනාවෙන් ඇති කරගත් හෙයින් ඒ දෙදෙනාගේ කුළිය සමානව ලැබේ." (තිර්මිදි, අහ්මද්)

**2. වචන**

අපගේ සියලු සංවාද, කථාව සත්‍ය ලෙස පැවතීම මෙයට අයත් වේ. මේ සම්බන්ධයෙන් පෙර පරිච්ඡේදවලදී විස්තර කර ඇත්තෙමු.

**3. ක්‍රියා**

ක්‍රියාව තුළින් සත්‍ය පිළිබිඹු කිරීම, මෙම වර්ගයට අයත් වේ. භාරකාරත්වය ඉටු කිරීමත්, පොරොන්දු ඉටු කිරීමත්, ඉස්ලාමීය ජීවිත ක්‍රමය සියලු ස්ථානවල නිවැරදි ලෙස අනුගමනය කිරීමත් ක්‍රියාව පදනම් කරගත් සත්‍යය පැවසීම වේ.

සත්‍යය කථා කිරීමට පටහැනිව මුසාව ගැනත් එහි අනිසිවිපාක ගැනත් බොහෝ නබි වදන්වල දකින්නට ලැබේ. ඒවායින් වැදගත් සමහරක් වෙත අවධානය යොමු කරමු.

ආයිෂා (රලි) තුමිය පවසයි. "අල්ලාහ්ගේ දූතයාට බොරු කථා කිරීම මෙන් පිළිකුලට භාජනය වූ වෙනත් ක්‍රියාවක් තිබුණේ නැත. කවරෙක් වෙත එතුමාණන් එය දුටුවේ ද, ඔහු පාපොච්චාරණය කර ඇත්හැරිය බවට දැනගන්නා තෙක් එතුමාණන් සිතෙන් ඔහු ඉවත් වේ." (අහ්මද්) මෙවන් ආකාරයේ වූ එක් හදීසයක් ඉබ්නු හිබ්බානයේ ද සඳහන් වී තිබේ.

"මුඃමින්ට කිසිවිටකත් අසත්‍ය කථා කරන්නෙකු වශයෙන් සිටීමට නොහැකි බව නබි (සල්) තුමාණන් පැවසූහ. " "මුඃමින් නිවටයෙකු ලෙස සිටී ද? යනුවෙන් අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රශ්න කරනු ලැබිණ. එයට ඔව් ලෙස පිළිතුරු දුන්හ. මුඃමින් මසුරෙකු ලෙස සිටී ද? යි ඇසූ සමයේ "ඔව්" ලෙස පැවසූහ. මුඃමින් අසත්‍ය කථා කරන්නෙකු ලෙස සිටිය හැකි ද? යනුවෙන් ඇසූ සමයේ "නැත" යනුවෙන් ප්‍රකාශ කළහ. " (මාලික්)

අසත්‍ය පැවසීම ඊමානයම පළුදු කරන දෙයක් බවත් කුහකයන්ගේ ගුණාංගය බවත් දේවදූතයාණන් (සල්) විස්තර කරයි. "කුහකයන්ගේ ලක්ෂණ තුනකි. ඔහු කථා කළහොත් අසත්‍ය කථා කරයි. පොරොන්දු දුන් විට කඩ කරයි. විශ්වාස කළහොත් වංචා කරයි." (බුහාරි,මුස්ලිම්)

බොරු කීම, මලාඉකාවරුන්ව පිළිකුල් කරන ගුණාංගය ලෙස හදීසය පවසයි. "එක් ගැත්තෙකු බොරු කීවහොත් ඔහුට නියම කරන ලද මලාඉකාවරුන් ඔහුගෙන් පිටවන දුර්ගන්ධයෙන් සැතපුමක් ඈත් වන්නෝය. " (තිර්මිදි)

"බොරුව වැඩිවීම පරලොව දිනයට අදළ ලක්ෂණයක්" පරලොව දිනය ඇති වීමට අදළ කුඩා නිමිති බොරුව වැඩි වීමත් එකක්" (අහ්මද්)

"අඛණ්ඩව බොරු කීම විශාල පාපයකි"යනුවෙන් ඉස්ලාමීය නීති විද්වතුන් පවසයි. එවන් ආකාරයේ වූ ගැඹුරු විනාශකාර භයානක දුර්ගුණාංගයක් ලෙස බොරු කථා කිරීම සැලකිය හැකිය.

කුඩා ළමුන් රැවටීමට කියන බොරුව, බොරුවක් ලෙසම පිළිගනු ලැබේ. අබ්දුල්ලාහ් බින් ආමිර් (රලි) පවසයි. "එක් දිනක් දේව දූතයාණන් අපගේ නිවසේ වැඩවී සිටින විට මාගේ මෑණියන් මාව කැඳවූවා. "මෙහේ. එන්න ඔබට දෙන්නම්" යනුවෙන් ප්‍රකාශ කළා. ඇය වෙතට හැරී නබි (සල්) තුමාණන් "ඔහුට කෑමක් දීමට ඔබ සිතන්නේ ද" යනුවෙන් ඇසූ විට රට ඉඳි ටිකක් දීමට සිතමි." යනුවෙන් පිළිතුරු දුන්නාය. "ඔබ එය ලබා නොදුන්නහොත් ඔබ මත බොරුවක් කී බවට ලියනු ලැබේ." යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූවා (අබූදවූද්) "වරෙක් එක් දරුවෙකුට" මෙහි එන්න මෙය දෙන්නම්" යනුවෙන් පවසා පසුව ලබා නොදුන්නහොත් එය එක් බොරුවකි." (අහ්මද්)

සෙල්ලමට වුවද විහිළුවට වුවද බොරු කීම පාප ක්‍රියාවකි. "ජනතාව විනෝද කරවීමට යම් දෙයක් පවසා බොරු කථා කරන්නා විනාශ විය යුතුයි; ඔහුට විනාශ ඇති විය යුතුය; ඔහුට විනාශයක් ඇති විය යුතුයි; (තිර්මිදි) "විහිළුවට වූවද බොරු නොකියා එය අත්හැරිය කෙනාට ස්වර්ගයේ නිවසක් ලැබීම ස්ථිර කරමි. " (බෛහකි)

විහිළු කිරීමේදී බොරු කීම අත්හරින තාක්කල්, සත්‍යවන්තයෙකු වුවද තර්ක කිරීම අත් හරින තාක්කල්, එක් ගැත්තෙකු සම්පූර්ණ විශ්වාසවන්තයෙකු ලෙස පිළිගැනීමට ලක්වන්නේ නැත. (අහ්මද්)

නබි (සල්) තුමාණන් සම්බන්ධව බොරු කීම, බොරුවලින් ඉතාම පහත් වූත්, විනාශකාරී වූත් බොරුව වේ. එතුමාණන් නොපැවසූ දෙයක් එතුමාණන් පැවසූ බවට පැවසීම ඉතාමත් භයංකාර වූ බොරුවක් වේ.

"මා මත බොරුකීම, ඔබලාගෙන් කෙනෙක් මත බොරු කීමට සමාන නොවේ. "කවරෙක් මා මත උවමනාවෙන්ම බොරු කියන්නේ ද? ඔහු තම නවාතැන නිරයෙහිම ලබා ගනිත්වා! "(බුහාරි)

"කවරෙක් මා සම්බන්ධ එක් හදීසයක් එය බොරුවක් බව දැනගෙනම ප්‍රකාශ කරන්නේ ද ඔහු බොරු කාරයෙකි." (ඉබ්නු මාජා, අහ්මද්)

බොරුව පොදු ප්‍රශ්නවලින් තමාව ආරක්ෂා කර ගැනීමටත්, තමාට වාසියක් ලබා ගැනීමටත්, අනෙක් අයට හිංසා කිරීමටත්, (බොරු කියා) සතුටුවීමටත් පවසනු ලැබේ.

එබැවින් ඇත්ත කථා කර බොරුවෙන් සම්පූර්ණයෙන්ම වැළකී යහපත් මූඃමින්වරුවන් වශයෙන් ජීවත්වීමට උත්සාහ දරමු.

**පොරොන්දු ඉෂ්ට කිරීම**

මුස්ලිමෙකු සෑම විටකදීම තම පොරොන්දු ඉටු කරයි. පොරොන්දු ඉටු කිරීම යුතුකම පමණක්ම නොව ඉස්ලාමීය යහ ගුණාංගවලින් ප්‍රධාන එකකි. කෙනෙකුගේ ඊමානය ක්‍රමවත් බව පිළිගැනීමට මෙය හොඳම නිදසුනකි. පොරොන්දු කඩ කිරීම කුහකකම් වලින් එකකි.

අල්ලාහ් තම ශුද්ධ ග්‍රන්ථයේ පොරොන්දු ඉටු කිරීම සම්බන්ධවත් ගිවිසුම් ඉටු කිරීම සම්බන්ධවත් මුස්ලිම්වරුන්ව දැනුවත් කරයි.

"විශ්වාසවන්තයිනි ! ඔබලා (ඔබගේ) ගිවිසුම් සම්පූර්ණයෙන් ඉටු කරන්න" (5:1)

ඔබලා පොරොන්දු සම්පූර්ණයෙන්ම ඉටු කරන්න, මන්ද යත් (පරලොව දිනයේදී) පොරොන්දුව සම්බන්ධයෙන් (ඇත්ත වශයෙන්ම ඔබගෙන්) ප්‍රශ්න කරනු ලබයි. (17:34)

ඇත්ත වශයෙන්ම මිනිස් ජීවිතය යන්න අල්ලාහ් සමග සිදුකරනු ලැබූ එක් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් පවතින බව අල් කුර්ආනය පවසයි. මිනිසා අල්ලාහ්ව පමණක් (රබ් ලෙස) නැමදීමට සුදුස්සා ලෙස පිළිගෙන ඔහුට පමණක් නැමදුම් කරන බවත්, ෂෛතාන්ගේ මාර්ගයෙ හි නොයන බවත්, එම ගිවිසුමෙහි වේ. සූරතුල් අඃරාබ් -172) වැනි වගන්තියේ අල්ලාහ් මෙය පැහැදිලි කරයි. ඒ සමගම "ආදම් පැවතෙන්නනි !, ඔබලා ෂෛතාන්ව නොනමදින්න. ඇත්ත වශයෙන්ම ඔහු ඔබලාට ප්‍රසිද්ධ සතුරෙකි. යනුවෙන් අප ඔබගෙන් ගිවිස නොගත්තෙමු ද?" (36:80) යන ප්‍රශ්නාර්ථයක් මෙය පැහැදිලි කරයි.

දේව දූතයාණන් මේ පදනමින් මූඃමින්වරුන්ගෙන් දිවුරුම් ලබාගන්නෙකු වශයෙන් සිටියහ. බෛඅතුල් අකබා මෙයට කදිම නිදසුනකි.

මුස්ලිම්වරුවන් තමන් සිදුකළ ගිවිසුම්හි කොන්දේසි එලෙසම ඉටු කරන බව තහවුරු කරන අදහසක් "මුස්ලිම්වරුන් තම කොන්දේසිවලට යටත් වේ." (බුහාරි) වන හදීසය පැහැදිලි කරයි.

නබි (සල්) තුමාණන් "පොරොන්දු ඉටු නොකර සිටීම කුහකයන්ගේ ගුණාංගය" ලෙස පැහැදිලිව පැවසූහ. "කුහකයන්ගේ ලක්ෂණ තුනකි. ඔහු පැවසුවහොත් බොරු පවසයි. පොරොන්දු දුන් විට කඩ කරයි. විශ්වාස කළහොත් පළුදු කරයි. (බුහාරි, මුසිල්) සහීහ් මුස්ලිමෙහි තිබෙන වෙනත් දැනුම් දීමක "ඔහු උපවාස රැක සලාතය ඉටු කර තමන්ව එක් මුස්ලිමෙකු ලෙස කියා ගත්තද" යනුවෙන් සඳහන් වේ.

පොරොන්දු කඩ කරන්නන්ට නියමිත දඬුවම පහත සඳහන් ආකාරයට හදීසය පැහැදිලි කරයි. "එක් මිනිසෙකු කාන්තාවක්ව, අඩුවෙන් හෝ වැඩියෙන් මහර් ලබාදෙන බව පවසා විවාහ වූවේය. ඇයගේ අයිතිය ලබාදීමේ චේතනාව ඔහුගේ හිතේ නොතිබුණි. ඔහු ඇයට වංචා කර ඇත. ඔහු ඇයගේ අයිතිය ලබා නොදී මරණයට පත් වුවහොත් පරලොව

දිනයේ දී ඔහු දුරාචාරයෙහි යෙදුනු පුද්ගලයෙකු ලෙසට නැගිටවනු ලබන්නේය. එක් මිනිසෙකු ණයක් ලබා ගත්තේය. ණය දුන් තැනැත්තාට ණය ලබාදීමේ චේතනාව මොහුට නොතිබුණි, එම මුදල ලබා දෙන තාක්කල් ඔහු වංචාකරන්නෙකු වෙයි. ණය ලබා නොදීම ඔහු මරණයට පත්වුවහොත් අල්ලාහ්ට ඔහු සොරෙක් යන තත්ත්වයෙන් හමුවේ. (තබරානි)

පොරොන්දුව, ගිවිසුම, ණය ගිවිසුම් යනාදි කරුණු සම්බන්ධයෙන් මුස්ලිම් කාෆිර් වෙනස්කම් බලන්නේ නැත. කවරෙක් සමග ගිවිසුමක් කරගෙන තිබුණද ඔහු මුස්ලිම් නොවන කෙනෙකු වුවද ඔහුගේ ගිවිසුම සම්පූර්ණයෙන් ඉටු කිරීම සිදු කළ යුතුයි. මෙවන් ගුණාංගයද අප අනුගමනය කරමු.

**විශ්වාසවන්තව කටයුතු කිරීම (භාරකාරත්වය)**

විශ්වාසය ආරක්ෂා කිරීම මුස්ලිමෙකු වෙත දකින්නට තිබිය යුතු යහපත් ගුණාංගයකි. ආරක්ෂා කර දෙන ලෙස ලබාදුන් භාණ්ඩයක් ආරක්ෂාකාරී ලෙස නැවත ලබාදීම යනුවෙන් මෙය හඳුන්වා දුන්න ද මෙහි අර්ථය ඉතාමත් ගැඹුරු එකක්.

කිසියම් පුද්ගලයෙකුට තමා වෙත පැවරී ඇත්තාවූ කාර්යයන් එනම් භාණ්ඩයක්, නිලයක්, රහසක් හෝ ශරීර අවයවයන් සම්බන්ධයෙන් වගකීමෙන් ක්‍රියා කිරීමත්, ඒ පිළිබඳ අල්ලාහ්ට උත්තර බැඳීමට නියමිත බවත් සිතේ ධාරණය කරගැනීමයි. ලබාදුන් කුමක් හෝ ධනය, නිලය, රහස, ශරීර අවයව වැනි කුමන කරුණක් වුවද වගකීමෙන් කටයුතු කිරීමත් අල්ලාහ්ට පිළිතුරු ලබා දිය යුතු යන හැඟීමෙන් කටයුතු කිරීමත් ගැඹුරු අර්ථය වේ. "ඔබලාගෙන් එකිනෙකා භාරකරුවන්ය. ඔහුගේ භාරකාරත්වය ගැන (පරලොව දිනයේ දී, ප්‍රශ්න කරනු ලබයි. පාලකයා ද භාරකරුවෙකි. ඔහුගේ භාරකාරත්වය ගැන ප්‍රශ්න කරනු ලබයි. පුරුෂයකු තම පවුල සම්බන්ධ භාරකාරයවේ. ඒ ගැන ඔහු ප්‍රශ්න කරනු ලබයි. භාර්යාව තම ස්වාමියාගේ නිවසේ භාරකාරියකි. සේවකයා ඔහුගේ ස්වාමියාගේ සම්පත්වලට භාරකරුවෙකි. ඒ ගැන ඔහුගෙන් ප්‍රශ්න කරනු ලබයි." (බුහාරි)

විශ්වාසනීයත්වය යන්න අල් කුර්ආන් ගැඹුරු අර්ථයෙන්ම භාවිතා කරයි. "විශ්වාසවන්තයිනි ඔබලා අල්ලාහ්ටත් (ඔහුගේ) දූතයාටත් හානි නොකරන්න ඒ හැර ඔබලා (ඔබලා කරන්නේ අයුක්තිය බව) දැනගෙනම ඔබලා ළඟ තිබෙන භාරකාර දේපළ සඳහාත් හානි නොකරන්න." (8:27)

අල්ලාහ්ගේ විධානයට වෙනස්කම් කිරීම අල්ලාහ්ට වංචා කිරීම වේ. අල්ලාහ්ගේ දූතයාණන්ව පිළිගෙන එතුමාව අනුගමනය නොකර එතුමාගේ සුන්නාව ව්‍යාප්ත නොකර සිටීම එතුමාට වංචා සිදු කිරීම බවත් පවසා විශ්වාසනීයත්වය විනාශ නොකළ යුතු යැයි බහු වචනයෙන් ප්‍රකාශ කර තිබීම අවධානය යොමු කළ යුතු කරුණකි. එසේම "ඇත්ත වශයෙන්ම අල්ලාහ් රැකවරණය සඳහා ලබා දුන් ද්‍රව්‍ය ඒවායේ අයිතිකරුට භාරදිය යුතු බවත් ජනයන් අතරේ ඔබ විසඳුම් ලබාදුන් විට, සාධාරණවම විසඳුම් ලබාදෙන ලෙසටත් ඔබට අණ කරයි." (4:58)

විශ්වාසියව හා යුක්ති සහගතව කටයුතු කිරීමේ වැදගත්කම නබි (සල්) තුමාණන් බොහෝ ස්ථානවල පැහැදිලි කර තිබෙන අතර, ජාහිලියා යුග ජනයන්ද එතුමාණන්ව ආදරයෙන් "අල්අමීන් " යනුවෙන් කැඳ වූ බව අප ඉතිහාසයේ දකිමු. එතුමාණන් මක්කාවේ සිට මදීනාවට හිජ්රත් යන විට මක්කා වැසියන් තමා වෙත ආරක්ෂාව සඳහා ලබා දී තිබුණු ද්‍රව්‍යයන් නැවත ලබා දීමට අදාළ සියලු කටයුතු සිදු කළහ.

“ විශ්වාසනීයත්වය නැති තැනැත්තාට ඊමානය ද නැත. පොරොන්දු ඉටු නොකරන්නාට ආගමද නැත.” (අහ්මද්) යනුවෙන් ඊමාන් සමග ද සත්‍ය දහම සමග ද සම්බන්ධ කර නබි (සල්) තුමාණන් මෙය ප්‍රකාශ කර ඇත.

එක් තනතුරක් හෝ වගකීමක් දරා සිටින අවස්ථාවේ දී තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ දෙකක් යූසුෆ් (අලෛ) ගේ මාර්ගයෙන් අල් කුර්ආන් පවසයි. (එයට) ඔහු “ජාතික භාණ්ඩාගාරයේ පාලකයා වශයෙන් මාව පත් කරන්න. ඇත්ත වශයෙන්ම මම (ඒවා) ආරක්ෂා කිරීමට හොඳින් අවබෝධ ඇත්තෙකි.” යනුවෙන් ප්‍රකාශ කළහ.
(12:55) විශ්වාසනීයත්වයත් දැනුමේ බලයත් නිලයක් දැරීමට සුදුසු තත්ත්වයන් බව කුර්ආනය පැහැදිලි කරයි.

සත්‍ය කථා කිරීම යන කොටස මගින් ගෙන හැර පෙන්වූ ස්වර්ගය තහවුරු කරන කරුණු හය තුළ පොරොන්දු ඉටු කිරීම, විශ්වාස කළහොත් සම්පූර්ණයෙන්ම ඉටු කිරීම, යන කරුණු දෙකත් (අහ්මද්) අඩංගු වේ.

විශ්වාසය පළුදු කිරීම කුහකයන්ගේ ගුණාංගයන්ගෙන් එකක් බව ඉහත සඳහන් හදීෂ තුළින් අවබෝධ කර ගනිමු.

විශ්වාසනීයත්වය තහවුරු නොකර සිටීම පරලොව දිනය සමීප වූ බව කියන පෙර නිමිත්තකි. මිනිසෙකු නබි (සල්) තුමා වෙත පැමිණ “පරලොව දිනය උදවන්නේ කවදා ද ?” යනුවෙන් විමසූ විට “විශ්වාසනීයත්වය විනාශ කළහොත් පරලොව දිනය බලාපොරොත්තු වන්න.” යනුවෙන් ප්‍රකාශ කළහ. එවිට “ඔහු එය කෙසේ විනාශ කරනු ලබන්නේ ද?” යනුවෙන් විමසූ විට “බලය නුසුදුසු අය වෙත භාර දුන් විට පරලොව දිනය බලාපොරොත්තු වන්න” යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූහ. (බුහාරි)

විශ්වාසයෙන් කටයුතු කිරීම බොහෝ ආකාරවලින් පවතියි. ඒවායින් ප්‍රධාන කරුණු වෙත අවධානය යොමු කරමු.

**1. මුදල් හා ද්‍රව්‍ය ආරක්ෂා කරදීම**

තමා වෙත රැකවරණය සඳහා ලබා දුන් මුදල් හා ද්‍රව්‍ය අයිතිකරුවන් ඉල්ලන අවස්ථාවේ දී නැවත ලබාදීම මෙම වර්ගයට අයත් වේ. නබි (සල්) තුමාණන් හිජ්රතයේදී අලි (රලි) තුමාණන්ව මක්කාමේ නවත්වා “තමා වෙත ආරක්ෂාව සඳහා ලබාදී තිබුණු භාණ්ඩ අයිතිකරුවන් වෙත ලබා නොදී මදීනාවට නොපැමිණිය යුතු ය” යනුවෙන් පවසා පිටමං වීම මෙයට කදිම උදාහරණයකි.

**2. විකිණීමේ දී හා මිලදී ගැනීමේ දී විශ්වාසනීයත්වය**

ව්‍යාපාරිකයා තම භාණ්ඩය විකුණන විට දුර්වලතා නොසඟවා, පාරිභෝගිකයා නොරවටා කටයුතු කිරීම මෙයින් අදහස් කරයි. “සත්‍ය කථා කරන යුක්ති සහගත ව්‍යාපාරිකයා පරලොව දිනයේ දී නබිවරුන් සමගත්, සත්‍ය වන්තයන් සමගත්, ෂහීද්වරුවන් (අල්ලාහ්ගේ මාර්ගයේ මරණයට පත්වූවන්) සමගත් සිටියි.” (ඉබ්නු මාජා)

එක් ව්‍යාපාරිකයෙකුට පරලොව දිනයේ දී මෙවන් ආකාරයේ සෞභාග්‍ය ලැබීමට ඔහුගේ සත්‍ය බව හා විශ්වාසනීයත්වය හේතු වේ. ව්‍යාපාරිකයා මෙන්ම වෙනත් රැකියා ක්ෂේත්‍රවල නියැලෙන අයගෙන් ද විශ්වාසනීයත්වයත්, යුක්තියත් බලාපොරොත්තු වේ.

### 3. නිලයත් වගකීමත් විධිමත්ව ඉටු කිරීම

කෙනෙක්ට ලබා දී ඇති නිලයත් එනම් තනතුරත් වගකීමත් විශ්වාසනීය දෑ වේ. ඒවා ඔහු විධිමත්ව පාලනය කළ යුතු ය. ඉස්ලාම් තනතුර ඉතාමත් සුදුසු අයට පැවරිය යුතු යනුවෙන් ප්‍රකාශ කරන්නේ ඒ නිසාය.

අබූදර් (රලි) පවසයි. "අල්ලාහ්ගේ දූතයාණන් ඔබ මාව ආණ්ඩුකාරවරයෙකු ලෙස පත් කළ යුතු නොවේ ද ? යනුවෙන් ඇසුවෙමි. එයට එතුමාණන් මාගේ කරට තම අතින් තට්ටු කර "අබූදර් ඔබ දුර්වල කෙනෙකි. එය එක්තරා විශ්වාසනීය දෙයකි. එය අවසාන විසඳුම් දෙන දිනයේ නින්දවක් ලෙසත් පාඩුවක් ලෙසත් පවතී. නමුත් එය නියමිත පරිදි ලබාගෙන නියමිත පරිදි කටයුතු කළවුන් හැර " (මුස්ලිම්) නුසුදුස්සන්ට තනතුරු ලබාදීම පරලොව දිනයේ ලක්ෂණයක් ලෙස පවසන හදීසයත් මෙයට නිදසුනකි.

### 4. රහස්‍ය බව ආරක්ෂා කිරීම

මෙම ගුණාංගය සමාජ විද්‍යාවේ දී බලාපොරොත්තු වන එක්තරා වැදගත් ගුණාංගයකි. එසේම සිවිල් පරිපාලන පොදු සේවාවලදීත් රහස් ආරක්ෂා කිරීම වැදගත් කරුණකි.

අනෙක් අයගේ රහස් අපට පවරා දී තිබෙන භාරයකි. ඒවා අන් අයට ප්‍රසිද්ධ නොකර අප ආරක්ෂා කළ යුතු ය. "එක් මිනිසෙකු පණිවිඩයක් පවසා ආපසු හැරී බැලුවහොත් එම පණිවුඩය එක් විශ්වාසනීය දෙයක් වේ." (අබූදාවුද්, තිර්මිදි, අහමද්) මිනිසෙකුගේ ගරුත්වය, සදාචාරය යනාදිය ආරක්ෂා කිරීමේ දී රහස් ආරක්ෂා කිරීම ප්‍රධාන තැනක් උසුලයි.

### 5. පවුල් ජීවිතය එක් විශ්වාසනීය දෙයකි

රහස්‍ය බව ආරක්ෂා කිරීම අඹුසැමි ජීවිතයට අත්‍යවශ්‍ය දෙයකි. "ස්වාමියා භාර්යාවට වස්ත්‍රයක් ලෙසත් භාර්යාව ස්වාමියාට වස්ත්‍රයක් ලෙසත් පැවතිය යුතු ය" යන්න කුර්ආනයේ මග පෙන්වීමකි. ලිංගික ජීවිතය, අන්‍යෝන්‍ය වශයෙන් ගරුත්වය, සදචාරය යන කරුණු සම්බන්ධ සම්බන්ධතාවය තහවුරු කිරීම පිළිබිඹු කරයි. ස්වාමියා - භාර්යාව අන්‍යෝන්‍ය වශයෙන් ආදරය, සෙනෙහස ඇත්තන් වශයෙන් මරණය දක්වා තෘප්තිමත්ව ජීවත් වීම මගින් පරලොව දිනයේ දී ස්වර්ගයේ දී ද ඒ දෙදෙනාම ස්වාමි පුරුෂයන් සහ භාර්යාවන් වශයෙන් ජීවත්වීමට අවස්ථාවක් ලැබීම තුලින් අඹුසැමි ජීවිතයේ විශ්වසනීයත්වය,යථාර්තය වශයෙන් අදහස් කරයි. ස්වාමි පුරුෂයන් හා භාර්යාවන් අතර අභ්‍යන්තර ජීවිතයේ පාරිශුද්ධත්වය ආරක්ෂා කිරීමේ අරමුණෙන් තම භාර්යාව සමග එකතු වී ඇයත් සමග ගනුදෙනු කර ලිංගික සම්බන්ධතාවයේ රහස් පිට නොකර ආරක්ෂා කිරීමත් විශ්වාසනීයත්වය වශයෙන් සලකනු ලැබේ.

“අවසාන විසඳුම් දෙන දිනයේ විශාලම දූෂිතයෙකු වශයෙන් දෙවියන් ඉදිරියේ සිටින්නා කවරෙක් ද දන්නවා ද? යනුවෙන් ඇසූ නබි (සල්) තුමාණන් පහත සඳහන් ආකාරයට පිළිතුරු ලබා දුන්හ. “කෙනෙක් තම භාර්යාවට අධික ලෙස ආදරය කරයි. එසේම ඔහු තම භාර්යාවගේ රහස් අනෙක් අයට ද පවසයි.” (මුස්ලිම්) පරලොව දිනයේ දී අල්ලාහ්ගේ ඉදිරිපිට විශාල විශ්වාසනීය වූ දෙයක් ලෙස පවතින දේවල්වලින් මිනිසෙකු තම භාර්යාවත් සමග කථා කර ඇයත් සමග කථා කරගත් දෙය සම්බන්ධව පසුව (ඔහු) ඇයගේ රහස ප්‍රචාරය කිරීමත් එකක් වේ. (මුස්ලිම්, අබූදාවූද්)

**6. ශාරීරික අවයව ද විශ්වාසනීය වූ දෙයකි**

අල්ලාහ් මිනිසාට යහපත් ක්‍රියාවන් සඳහා භාවිතා කිරීමට ලබා දී තිබෙන අවයවයන් ද එක් විශ්වාසනීය දෙයකි. ඒවා ක්‍රමවත්ව භාවිතා කරනු ලැබුවේද ? යන ප්‍රශ්නයද පරලොව දිනයේ දී තිබේ.

“නියම වශයෙන්ම කන, ඇස, හදවත යනාදී වේවා සියල්ල( එක එකෙහි ක්‍රියාවන් සම්බන්ධව පරලොව දිනයේ ද) ප්‍රශ්න කරනු ලබයි” (17:36)

**7. ඉස්ලාමය දරා සිටීමත් එක් විශ්වසනීයත්වයකි**

ඉහත සඳහන් කරනු ලැබූ විශ්වාසනීයත්වයේ කොටස්වලින් මෙය ඉතාමත් ප්‍රධාන එකකි. මුස්ලිමෙකු තමා පිළිගෙන තිබෙන ඉස්ලාමය ගැන පරලොව දිනයේ දී ප්‍රශ්න කරනු ලබයි. එය නිවැරදි ලෙස අනුගමනය කළ එක ගැන, අනෙක් අයට ඉදිරිපත් කළ එක ගැන, ආරක්ෂා කල එක ගැන විභාග කිරීමක් තිබේ. “(විශ්වාසවන්තයෙනි)! යහපත් ක්‍රියාවක් කරන ලෙස මිනිසුන්ව උනන්දු කර, පව්වලින් (ඔවුන්ව) ඉවත් කර, ඇත්ත වශයෙන්ම අල්ලාහ්ව විශ්වාස කරන ඔබලා මිනිසුන්ගෙන් බිහි වූ සමාජවලින් ඉතා උසස් අය වේ. (3:110)

**8. අනෙක් විශ්වාසනීය දේවල්**

ඉහත සඳහන් කළ දේවල් හැර පොදු වශයෙන් බොහෝ විශ්වාසනීය වූ දේවල් ඇත. ඒවා හොඳාකාරව අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව කුඩා දරුවන් දෙමව්පියන් අධ්‍යාපනය, දක්ෂතාවන්, නීරෝගී බව, විවේකය, කාලය යනාදි සියල්ල භාරකාරත්වයට අදාළ ලෙස සැලකිය යුතු ය. ඒවා අනුගමනය කරමු.

**අනෙක් අයට හිංසා නොකිරීම**

ඉස්ලාමයේ මූලධර්මවලින් සැදුම්ලත් මුස්ලිම්වරයෙකු අනෙක් අයට සෑම විටම ප්‍රයෝජනවත්ව විය යුතු ය. හිංසා කරන්නන් ලෙස නොසිටිය යුතු ය.

මෙහි මූලික දර්ශනය නබි (සල්) තුමාණන් පහත සඳහන් ආකාරයට පැවසූහ. “සෑම මුස්ලිමෙකුටම අනෙක් මුස්ලිමෙකුගේ ප්‍රාණය, වස්තුව, ගරුත්වය යනාදිය හරාම් වූ දේවල් වේ.” අනෙක් මුස්ලිමෙකු ගේ ප්‍රාණයට, වස්තුවට, ගරුත්වයට හානි කරන කිසිදු

ක්‍රියාවක් තවත් මුස්ලිමෙකු නොකළ යුතුයි. යන්නත්, එය අනෙක් අයගේ අයිතිවාසිකම් හි බලහත්කාරයෙන් අත ගැසීමක් ලෙසත් ඉහත සඳහන් හදීසය විස්තර කරයි. මෙම අදහස නබි (සල්) තුමාණන් වෙනත් හදීසයකින් පහත සඳහන් ආකාරයට විස්තර කළහ. මුඃමින්වරුන් තම ප්‍රාණයටත්, වස්තුවටත්, කවරෙකුගෙන් ආරක්ෂාව ලබා ගන්නේ ද සත්‍ය මුඃමින් ඔහුම ය. (අහ්මද්, තිර්මිදි, හාකිම්)

කවරෙකුගේ හිංසාවෙනුත්, වේදනාවෙනුත් අනෙක් අය රැකවරණය ලබා සැනසීමෙන් ජීවත් වීමට ලැබෙන්නේ ද ඇත්ත වශයෙන්ම මුස්ලිමෙකු වන්නේ ඔහුම ය, යන අදහස දේව දූතයාණන් (සල්) තුමාණන් විස්තර කළහ. “කවරෙකුගේ දිවෙන්, දෑතින් මුස්ලිම්වරුන් සැනසුම් ලබන්නේ ද (සැබෑ) මුස්ලිමෙකු වන්නේ ඔහුම ය” (බුහාරි)

නබි (සල්) තුමාණන් වාඩිවී සිටි සමහරුන් අමතා “මා ඔබලා අතරේ සිටින දුසිරිත් ඇත්තන්ගෙන් යහ සිරිත් ඇත්තන්ව දන්වන්න ද ? යනුවෙන් ඇසූහ. රැස්වී සිටින්නන් නිශ්ශබ්දව සිටියහ. නබි (සල්) තුමාණන් තුන්වරක් ඒ ලෙස ප්‍රශ්න කළහ. එවිට සමූහයේ සිටි අයගෙන් කෙනෙක් නැගිට “අල්ලාහ්ගේ දූතයාණෙනි, අවබෝධ කර දෙන්න.” ලෙස පැවසුවා, එවිට නබි (සල්) තුමාණන් “කවරෙක් යහපතක් කරන්නෙකු ලෙස බලාපොරොත්තු වී, ඔහුගේ අයහපත් වලින් ජනයා පීඩා නොවී සිටින්නේ ද? ඔබලාගෙන් යහපත් තැනැත්තා ඔහුම ය. ඔබලාගෙන් කවරෙකුගේ යහපත බලාපොරොත්තු වී, එනමුත් ඔහුගේ අයහපතෙන් ජනතාව සහනයක් ලබා නොගන්නේ ද? ඔබලාගෙන් ඉතාමත් අයහපත් පුද්ගලයා ඔහුම ය.” ලෙස ප්‍රකාශ කළහ. (අහ්මද්)

“අධික ලෙස ඉබාදත් කළ ද (නැමදුම් කර) අසල්වැසියන්ට තම දිවෙන් හිරිහැර කරන කාන්තාව නිරයට පිවිසේ.” (අහ්මද්) යහ අදහස විස්තර කරන හදීසය මෙයට කදිම නිදසුනකි.

අනෙක් අයට හිංසා කිරීම අල්ප වශයෙන් හෝ සිදු නොවිය යුතු ය යන්න “එක් මුස්ලිමෙකු ඔහුගේ සහෝදරයාට හිංසා ගෙන දෙන ආකාරයට බැල්මක් බැලීමත් සුදුසු නොවේ.” (අහ්මද්) “කෙනෙක් තම සහෝදරයාණන් වෙත, යකඩයක් පෙන්වුවහොත් ඔහු එයින් මිදෙන තාක්කල් මලඉකාවරුන් ඔහුට ශාප කරයි ඔහු එක් කුස උපන් සහෝදරයෙක් වුව ද” (මුස්ලිම්) යන හදීසයන් පැහැදිලි කරයි.

එක් මුස්ලිමෙකු තම සමාජයේ අයට යහපත පමණක් ඉටු කරයි. එය නැති විට අයහපත කිරීමෙන් තමන්ව වළක්වා ගනියි. එයම දානයක් වන බව කියන අදහස පහත සඳහන් නබි වදන මනාව පැහැදිලි කරයි.

අබූ මූසා (රලි) තුමාණන් පවසයි. “සෑම මුස්ලිමෙකුම දනශීලි වීම අනිවාර්ය වේ“යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූ විට, නබි සගයෝ මෙලෙස ප්‍රශ්න කළහ. “ඔහු වත්කම් නැත්තෙක් නම් කුමක් කළ යුතු ද? යනුවෙන් අදහස් කරන්නේ ද?” නබි (සල්) තුමාණන් පැවසුවා” ඔහුගේ දෑතින් උපයා තමාත් ප්‍රයෝජන ලබා අනෙක් අයටත් දන් දිය යුතු ය. සගයන් ඇසූ හ. “එයට හැකියාවක් නැත්නම්, අවශ්‍යතා ඇති දුර්වල අයට උදව් කල යුතු ය යනුවෙන් ප්‍රකාශ කල විට “එයත් කිරීමට නොහැකි නම්” යනුවෙන් නබි සගයන් ප්‍රශ්න කළ සමයේ “යහපත ප්‍රචාරය කරන්න” යනුවෙන් ප්‍රකාශ කළහ. “අනෙක් අයට හිංසා කිරීමෙන් තමාව වළක්වා ගන්න, එය දානයකි ” යනුවෙන් ප්‍රකාශ කළහ. (බුහාරි, මුස්ලිම්)

එබැවින් මෙම අදහස අවබෝධ කරගෙන අනෙක් අයට යහපතක් කිරීමට නොහැකි වුව ද, අවම වශයෙන් අපගේ දිවෙන්, දෑතින් හෝ අනෙක් අවයවවලින්, හිංසා නොකර සිටිමු.

**උදව් කිරීම**

මිනිසා සමාජ ජීවියෙකු නිසා ඔහුට සමාජය තුළ තනියෙන් ජීවත් විය නොහැකිය. සමාජයේ අන්‍යෝන්‍ය වශයෙන් සබඳතා ගොඩ නගා ගෙන ජීවත් වීමට ඔහුට සිදුවේ. මෙම අවස්ථාවේදී ඔහුට අදාළ සියලු කටයුතු ඔහුට තනිවම සිදු කල නොහැකි තත්ත්වයක් උදවන හෙයින් අනෙක් සහෝදරයන්ගේ උදව් ඔහුට අතවශ්‍යවේ.

"එක් මුඃමින් තවත් මුඃමින් කෙනෙකුට එක් ශරීරයක් බඳුය. එක් ගොඩනැගිල්ලක් බඳුය." යන අදහස් පවසන හදීසයේ පදනමින් එක් මුස්ලිමෙකු අනෙක් මුස්ලිමෙකු සමග තිබෙන සමීප සම්බන්ධතාව හේතුවෙන් ඔහු සැම විටම උදව් උපකාර කරන්නෙකු වශයෙන් පසුවේ. මෙය පහත සඳහන් හදීසයන් පැහැදිලි කරයි.

"එක් මුස්ලිමෙකු අනෙක් මුස්ලිමෙකුගේ සහෝදරයා වේ. ඔහු ඔවුන්ට අසාධාරණය කිරීමක් හෝ අත් හැරදැමීමක් හෝ සිදු නොකරයි. කවරෙකු සහෝදරයෙකුගේ අවශ්‍යතාව ඉටු කරන්නේ ද, අල්ලාහ් ඔහුගේ අවශ්‍යතාවය ඉටු කරයි. කවරෙක් එක් මුස්ලිමෙකුගේ එක් දුකක් නැති කරන්නේ ද, අල්ලාහ් එමගින් පරලොව දිනයේ ඔහුගේ දුකෙන් එක්ක ඉවත් කරයි. කවරෙක් මුස්ලිමෙකුගේ දුර්වලතාවයක් සඟවන්නේ ද, අල්ලාහ් පරලොව දිනයේ දී ඔහුගේ දුර්වලතාවය ද සඟවයි " (බුහාරි, මුස්ලිම්)

අනෙක් අයට උදව් කිරීම යනු ඔහුට මුදල, ද්‍රව්‍ය, භාණ්ඩ, මඟ පෙන්වීම, අධ්‍යාපනය, ශාරීරික උදව්ව, යනාදියෙන් උදව් කිරීමත් හිංසා වළක්වා ගැනීමත් බව ඉස්ලාම් අදහස් කරයි. ඔබගේ සහෝදරයා අයුක්ති සහගත වුව ද, අයුක්තියට ලක් වූවෙක් වුව ද, ඔහුට උදව් කරන්න." යනුවෙන් නබි (සල්) තුමාණන් පවසන විට, "අයුක්තියට ලක්වූවෙකුට උදව් කළ හැකිය. අයුක්තිය කරන්නාට කෙසේ උදව් කරන්නේ ද යනුවෙන් ඇසූහ. " "එයට නබි (සල්) තුමාණන් ඔහු අයුක්තිය නොකර ඔහුව වළක්වා ගැනීම ඔහුට කරන උදව්වකි. "යනුවෙන් ප්‍රකාශ කළහ. (බුහාරි)

අසාධාරණයට පත් වූ කෙනෙකුට උදව් උපකාර කිරීමත් පරලොව දිනයේ දී යහපත ලබාදිය හැකි කරුණක් බව පහත සඳහන් හදීසය පැහැදිලි කරයි. "කවරෙක් අසාධාරණයට ලක් වූ කෙනෙක් සමග ඔහුගේ උරුමය ස්ථාපිත කරන තාක්කල් ගමන් කරන්නේ ද, ඔහුගේ පාදය කියාමත් දිනයේ පාදය ලිස්සන "සිරාත්" පාලමේ දී අල්ලාහ් ස්ථාවර කරයි." (තබරානි)

කෙනෙක් දුෂ්කරතාවයට ලක්වන මොහොතේ දී එය නොවළක්වා බලාගෙන සිටීමත් පහත් ක්‍රියාවක් බව ඉස්ලාම් අනතුරු හඟවයි. "එක් මිනිසෙකු අසාධාරණ ලෙස පහර දීමට ලක්වන ස්ථානයේ ඔබලාගෙන් කෙනෙකු සිටගෙන බලා නොසිටින්න. එය වළක්වන්නේ නැත්නම් එම ස්ථානයේ රැඳී සිටි තැනැත්තාට ශාපය පහළ වේ." (තබරානි)

එබැවින් අපට හැකි අයුරෙන් අනෙක් අයට උදව් කරමින් ජීවත් වෙමු.

**පරිත්‍යාගශීලී බව/නොමසුරු බව**

මුස්ලිමෙකු නොමසුරු වේ. ඔහුගේ ජීවිතයේ සියලු කරුණුවල මෙය පැහැදිලිව දකින්නට හැකිය.

ඔහු තම පවුලේ අය වෙනුවෙන් වියදම් කරන අවස්ථාවල මසුරු වන්නේ නැත. පවුලේ අවශ්‍යතා ඉටු කිරීමේ දී කටයුතු කරයි.

සමාජයේ අවශ්‍යතාවලදීත්, ව්‍යසනවලදීත් මුස්ලිමෙකුගේ උදව් කිරීමේ දෑත් නොමසුරුව දිගුවේ. එවන් අවස්ථාවන්වලදී තමාට පුළුවන් උදව්වල ඔහු නියැලී විශේෂයෙන් අසල්වැසියන් සමගත් පරිත්‍යාගශීලීව බෙදා හදා ගෙන ජීවත් වේ.

නොමසුරු වියදම් කිරීම සම්බන්ධයෙන් “ඊද් ” (උත්සව) යන මාතෘකාව යටතේ පැහැදිලිව බැලුවෙමු. නොමසුරු බව යනු ලෝභිකමෙන් තොරවත්, නාස්තියත්, ආඩම්බර බව නැතිවත් ජීවත්වීම ය.

**යහපත පතුරුවන අතර අයහපත වැළැක්වීම**

සත්‍ය මුස්ලිම් කෙනෙකුගේ ගුණාංගවලින් මෙයද එකකි. ඔහු නිතරම අනුන්ගේ යහපත සලකන්නෙකු වශයෙන් සිටියි. ඔහු එය සනාථ කිරීමක් වශයෙන් අනෙක් අයට යහපත පතුරුවන්නෙකු වශයෙන් ද අයහපත වළක්වන්නෙකු වශයෙන් ද සිටී.

මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ උම්මත්වරුන්ගේ (සමාජයට අයත් අයගේ) විශේෂත්වය මෙය බව කුර්ආන් පවසයි. “(විශ්වාසවන්තයිනි!) ඔබලාගෙන් එක් කණ්ඩායමක් බිහිවී, ඔවුන් (මිනිසුන්ව) යහපත කරා කැඳවා යහපත පතුරුවා අයහපත් දේවල්වලින් (ඔවුන්ව) මුදවා ගනිමිනුත් සිටින්න. ජය ලද්දෝ මොවුන් ය.” (3:104)

මුස්ලිම් සමාජයේ යහපත පතුරුවා අයහපත වළක්වන කණ්ඩායමක් සිටිය යුතුම ය. ඒ බව අල්කුර්ආන් පැහැදිලි කරයි. අනෙක් අයගේ යහපත පැතීමත් යහපත් ප්‍රචාරය කර අයහපත වැළැකීමත්, අසාධාරණ සිදු කරන්නන් ඉදිරියේ සත්‍යය පැහැදිලිව ප්‍රකාශ කිරීමේ ශක්තියත් මුස්ලිම්වරුන්ට ලබාදේ. “යහමගට අදාළ සටනේ ඉතා උසස් දේ කුමක් ද?” යන්න නබි ගෙන් විමසූ සමයේ “අසාධාරණ, අයුක්ති සහගත රජු ඉදිරියේ සත්‍යය පැවසීමය” යනුවෙන් පිළිතුරු දුන්හ. (බස්සාර්) “අයුක්ති සහගත පුද්ගලයා ළඟ ඔබ අයුක්ති සහගත පුද්ගලයෙකු බව කීමට බිය වන්නෙකු වශයෙන් මාගේ උම්මත්වරුන්ව දුටුවහොත් ඔබ ඔවුන්ගෙන් ඈත් වන්න” (අහ්මද්)

උසස් මිනිසෙකුට අදාළ ලක්ෂණවලින් යහපත ප්‍රචාරය කර අයහපත වැළැක්වීමත් එකකි. නබි (සල්) තුමාණන් මිම්බරයේ (වේදිකාවේ) සිටින විට මිනිසෙකු පැමිණ “අල්ලාහ්ගේ දූතයාණනි, මිනිසුන්ගෙන් උසස්තමයා කවරෙක් ද ? විමසීය. නබි (සල්) තුමාණන් මිනිසුන්ගෙන් උසස්තමයා ඔවුන්ගෙන් අල්කුර්ආනය පාරායනා කරන්නා, ඉතාමත් දේව භක්තිය ඇත්තා, ඔවුන්ගෙන් අධික ලෙස යහපත පතුරුවා අයහපත වළක්වන්නා, ඔවුන්ගෙන් අධික ලෙස ඥාතීන් සමග සමීපව සිටින්නා ” යනුවෙන් ප්‍රකාශ කළහ. (අහ්මද්)

එක් මුස්ලිමෙකු සමාජය අතර, විනාශයත්, අසාධාරණයත්, අයුක්තියත්, ව්‍යාප්ත වීම බලා සිටින්නේ නැත. එලෙස අයහපත නොවැළැක්වුවහොත් අල්ලාහ්ගේ ශාපය බලා සිටින්නන්ටද අත්වෙන බව ඔහු හොඳින් අවබෝධ කර ගනී.

අබූබක්ර් සිද්දීක් (රලි) තුමාණන් කලීෆා ලෙස වගකීම, භාරගත් අවස්ථාවේ දී මිම්බරය මත නැගී, අල්ලාහ්ට ප්‍රශංසා කර පසුව මෙලෙස පැවසූහ. "විශ්වාසවන්තයිනි, ඔබලා (වැරදි මාර්ගයේ නොගොස්) ආරක්ෂා වෙන්න. ඔබලා ඍජු මාර්ගයේ ගියහොත් කවරෙකුගේ හානියත් ඔබට බාධාවක් නොවේ. ඔබලා සියල්ල අල්ලාහ් වෙත ගමන් කළ යුතුව තිබේ. ඔබලා (මෙහි) කරන දේවල් පිළිබඳව (එවිට) ඔහු ඔබට දන්වනු ලබයි." (5:105) යන කුර්ආන් වාක්‍යය පාරායනා කරයි. ඔබලා එම වාක්‍යයට අදාළ අර්ථය නිවැරදි ක්‍රමයට අවබෝධ කරගන්නේ නැත. ඇත්ත වශයෙන්ම මම නබි (සල්) තුමාණන් පවසනාව අසා ඇත්තෙමි. මිනිසුන් අයහපත දකින විට එම නොවළක්වා සිටියහොත් ඉතා ක්ෂණිකව අල්ලාහ්ගේ හානි ඔවුන් සියල්ලන්වම වසා ගනියි. (අබූදාවූද්)

යහපත පතුරුවා අයහපත වැළැක්වීමට අදාළ මාර්ගයත් ක්‍රමවේදයත් නබි (සල්) තුමාණන් උගන්වයි. "ඔබලාගෙන් කෙනෙක් පිළිකුල් සහගත දේ දුටුවහොත්, එය තම දෑතෙන් වැළැක්විය යුතුය. එයට ශක්තියක් නැතහොත් තම දිවෙන් වැළැක්විය යුතුය. එයටත් ශක්තියක් නැතහොත් තම මනසින් පිළිකුල් කළ යුතුය. මෙය ඊමානයේ දුර්වලම තත්ත්වයයි." (මුස්ලිම්)

එබැවින් සමාජයේ ජනතාවට යහපත් කරුණු පතුරුවා අයහපතත් කරුණු වළක්වා යහපත් ලෙස ජීවත් වෙමු.

## 06. අධ්‍යාත්මික වර්ධනයට අදාළ මානසික ගුණාංග

### අධ්‍යාත්මික වර්ධනයෙහි වැදගත්කම සහ ප්‍රයෝජන

අධ්‍යාත්මික හා ලෞකික තත්ත්වයන් අතර මධ්‍යම පිළිවෙත අනුගමනය කිරීම ඉස්ලාමයේ විශේෂත්වය වේ. අධ්‍යාත්මිකත්වයට අඩිතාලම වශයෙන් සිත පවතී. ඉස්ලාමීය පරිභාෂාවෙන් සිත යන්නට කල්බු, නෆ්ස්, රූහ් යනාදි අරාබි වචන භාවිත කරනු ලබයි. මෙය "තස්කියතුන් නෆ්ස්" යනුවෙන් ඉස්ලාමීය විද්වතුන් නම් කර තිබේ. කෙටියෙන් "තස්කියා" වශයෙන් හඳුන්වයි. එය කාලක්‍රමයේ දී "තසව්වුෆ්" යන අධ්‍යාත්මික කලාව වශයෙන් බිහිවූ බව ඉමාම් ගස්සාලි (රහ්), අබූදාවුද් අල්-මක්කි (රහ්) ආදි විද්වතුන් තහවුරු කරයි.

මුස්ලිමෙකු තම ආත්මය සකස්කර ගැනීමට, අල්කුර්ආන්, අස්සුන්නා, යනාදිය කුමන මගපෙන්වීම් ලබා දෙන්නේ ද එම මාර්ගෝපදේශ අනුවම කටයුතු කිරීම මුස්ලිමෙකුගේ යුතුකම වේ. මෙලොව පරලොව ලෙස හෝ, ශරීරය ආත්මය ලෙස හෝ වෙන් නොකර ඒවා ඒකාබද්ධ කර ගමන් කිරීමට ඉස්ලාම් හඳුන්වා දී තිබෙන මාර්ගය සෑම මුස්ලිමෙකුම අනුගමනය කළ යුතුය. එසේ නැතහොත් අධ්‍යාත්මික ආරක්ෂාව යන කරුණෙහි ගැටළු සහගත තත්වයක් ඇති විය හැකිය. මෙය "අම්රාලුල් කල්බ්" (සිතේ රෝගාබාධ) යනුවෙන් අධ්‍යාත්මික විද්වතුන් හඳුන්වයි.

මෙම පරිච්ඡේදයේ අප ප්‍රථමයෙන් අධ්‍යාත්මික අභිවෘද්ධියට ශක්තියක් වශයෙන් පවතින තක්වා, සුහ්ද්, වරඋ, කුෂූඋ, කුලූඋ, මුහාසබා, මුරාකබා ආදිය සරලව අධ්‍යයනය කරමු.

### "තස්කියතුන් නෆ්ස්" පිළිබඳ අල් කුර්ආන් මෙසේ පවසයි.

අධ්‍යාපන ඥානය නැති (අරාබි) ජනතාවගෙන් කෙනෙක්ව ඔහු (තම) දූතයා වශයෙන් යවනු ලැබීය. ඔවුන් මෙයට පෙර ප්‍රසිද්ධියේ නොමග සිටියද, එම දූතයාණන් ඔවුන්ට අල්ලාහ්ගේ වාක්‍ය කියවා පෙන්වා ඔවුන්ව පාරිශුද්ධ කර ඔවුන්ට ධර්මයත්, ඥානයත් උගන්වයි. (62:2)

### තස්කියතුන් නෆ්ස් පිළිබඳ අල් හදීසය මෙසේ පවසයි.

"ඇත්ත වශයෙන්ම, දැනගන්න. ශරීරයේ එක් මස් පිඩක් ඇත. එය යහපත් වුවහොත් මුළු ශරීරයම යහපත් වේ. එය අයහපත් වුවහොත් මුළු ශරීරයම අයහපත් වේ. එය මිනිසාගේ සිතය. (බුහාරි, මුස්ලිම්)

### තක්වා

තක්වා යන වචනය දේව බිය, අල්ලාහ්ට බිය වීම, බිය බැතිකම, දේව හැඟීම යනාදී අර්ථයන්ගෙන් ඉස්ලාමීය ව්‍යවහාරයේ දී භාවිත කෙරේ.

**මෙය පිළිබඳව අල්අර්කුආනය,**

“විශ්වාසවන්තයිනි ! ඔබලා අල්ලාහ්ට බිය වුවහොත් ඔබලාට (ඔහු) සෘජු මාර්ගය පෙන්වයි. ඔබලාගෙන් ඔබලාගේ අකුසල විනාශ කරයි. ඔබලාට ක්ෂමාව ලබාදේ. අල්ලාහ් මහත්වූ කරුණාවන්තයෙකු වේ.” (8:29) යනුවෙන් පවසයි.

**මේ පිළිබඳව හදීසය පහත සඳහන් ආකාරයට පවසයි.**

අබූ සයීද් අල් - කුද්රි (රලි) පවසයි. “ඇත්ත වශයෙන්ම ලෝකය මිහිරි ලෙසත්, සාරවත් ලෙසත් පවතියි. ඇත්ත වශයෙන්ම අල්ලාහ් ඔබව නියෝජිතයෙකු ලෙස පත් කර ඇත. ඔබලා කුමක් කරන්නේ ද යන්න බලයි. එබැවින් ලෝකයට බිය වන්න. තවද ස්ත්‍රීන් සම්බන්ධවද බිය වන්න. බනී ඉස්රාඊල්වරුන් සම්බන්ධව ඇතිවූ ගැටුමේ ආරම්භය ස්ත්‍රීන් සම්බන්ධව ඇතිවුණි. ”යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූහ. (මුස්ලිම්)

තක්වාව ලබාදෙන ලෙස පවසා දේවදූතයාණන් (සල්) පහත සඳහන් ආකාරයට නිතරම ප්‍රාර්ථනා කළහ.

“දෙවියනි ! ඔබගෙන් සෘජු මාර්ගයත්, දේව භක්තියත්, පතිවතත් තවද (සෑහේ යන) ධනයත් පතන්නෙමි.” (මුස්ලිම්)

**තක්වාහි ප්‍රතිඵල**

ඉබ්නු අබ්බාස් (රලි) මේ පිළිබඳ පවසන විට,

1. අල්ලාහ්ගේ අණ ජීවිතයේ හැකි පමණින් අනුගමනය කිරීම.
2. ඔහු තහනම් කළ දෙයින් මුළුමනින්ම මිදී ජීවත් වීම.
3. පරලොවේ ජයග්‍රහණය සඳහා මෙලොව යොදා ගැනීම.
4. ලද දෙයින් සෑහේ යන හැඟීම ඇති කර ගැනීමේ ගුණාංගය (මූලාශ්‍රය (තෆ්සීර් ඉබ්නු කසීර්)

**තක්වාහි ලක්ෂණ ගැන අල් කුර්ආන් මෙසේ පවසයි.**

1. අල්ලාහ්ට ඔබලා ඇත්ත වශයෙන්ම බිය වී කටයුතු කරන්න. (එවිට) අල්ලාහ් ඔබට උගන්වයි. (2:282)

2. කවරෙක් අල්ලාහ්ට (සත්‍ය වශයෙන්ම) බියවන්නේ ද ? ඔහුට අල්ලාහ් නොසිතූ නොවිරූ ආකාරයට ජීවත්වීමට පහසුකම් සලසා දෙයි. (65:3-3)

3. විශ්වාසවන්තයිනි ! ඔබලා අල්ලාහ්ට බිය විය යුතු ආකාරයට බිය වන්න. තවද මුස්ලිම් ලෙස මිස ඔබ මරණයට පත් නොවන්න. (3:102)

**තක්වාහි ලක්ෂණ ගැන අල් හදීස් මෙසේ පවසයි.**

1. ඔබලා කොතැන සිටියද අල්ලාහ්ට බිය වන්න. එක අකුසලයකට පසු කුසලයක් කරගන්න. කුසල එම අකුසල විනාශ කරයි. (තිර්මිදි)

2. දේව භක්තිය තිබෙන්නේ මෙහිය. යනුවෙන් පවසා රසූල් (සල්) තුමාණන් තමාගේ පපුව පෙන්වා පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

3. කවරෙක් ළඟ පහත සඳහන් යහගුණාංග තුන තිබෙන්නේ ද ඔහු ඊමානයේ රසය අත් වින්දේය.

(i) අනෙක් සියල්ලන්ට වඩා අල්ලාහ්, අල්ලාහ්ගේ දූතයාණනුත් ඔහුගේ සෙනෙහෙවන්තයන් වීම.
(ii) යම් මිනිසෙකුට ආදරය කරන්නේ නම් අල්ලාහ් වෙනුවෙන්ම ඔහුට ආදරය කිරීම.
(iii)කුෆ්රයෙන් මිදුනායින් පසු නැවත ඒ දෙසට හැරීම තමා නිරයේ විසි කරනු ලැබුවාක් මෙන් පිළිකුල් කිරීම.

**තක්වාව තහවුරු කිරීමටත් ආරක්ෂා කිරීමටත් පහත සඳහන් කරුණු උපකාරී වේ.**

1. අල්කුර්ආනය කියවීම, අල්ලාහ්ට දික්ර් කිරීම (සිහිගැන්වීම)
2. අල්ලාහ්ගේ දහම කරා ජනයා කැඳවීම
3. සලාතය නියම වේලාවට ඉටු කිරීම.
4. පර්ළු වූ, සුන්නත් වූ උපවාස රැකීම.
5. සකාත්, සදකා, දාන පරිත්‍යාගයන් කිරීම.
6. අල්ලාහ්ගේ නිර්මාණ ගැන සිතීම.
7. අල්ලාහ්ව සිහිගන්වන සභාවලට සහභාගිවීම.
8. කණ්ඩායම් වශයෙන් ඉටු කළ යුතු වගකීම් කණ්ඩායම් ලෙසම ඉටු කිරීම.
9. ආලිම්වරුන්, දෙමව්පියන්, ගුරුභවතුන්ගේ ඔවදන් පිළිපැද ඔවුන්ට ගරු කිරීම.
10. යහපත් මිතුරන් ඇසුරු කිරීම.
11. හොඳ පොත්පත් ආදිය, සඟරා ආදිය කියවීම.
12. වෙනත් සමාජ අතරේ ජීවත් වන විට ඔවුන් සමග යහ සම්බන්ධතාවයක් පවත්වා ගන්නා අතරතුර ඊමානයේ ස්ථාවරව සිටීම.
13. පොදු දේපළ වංචා නොකර, ඒවා වගකීම් සහිතව පරිශීලනය කිරීම.
14. ගනු දෙනු වෙළෙඳාම් කටයුතු වලදී, වංචා සහගත ලෙස අල්ලස්, දූෂණ යනාදි අයුක්තිසහගත දෑ සිදු නොවන ආකාරයට ජනතාව සමග කටයුතු කිරීම.
15. ජන සන්නිවේදන උපකරණ භාවිතා කරන විට සිතැඟි පරිදි ඒවා භාවිතා නොකර ඉස්ලාමීය කොන්දේසිවලට යටත්ව එය භාවිත කිරීම.
16. මරණයෙන් පසු ජීවිතය පිළිබඳ මෙනෙහි කිරීම.

## සුහ්ද් - බැඳීම්වලින් තොරවූ ජීවිතය

ඉස්ලාම් එක්තරා මධ්‍යස්ථ දහමකි. එය තපස් ජීවිතය ප්‍රිය කරන්නේ නැත. ඒ වෙනුවට ලෞකික ජීවිතය හා අධ්‍යාත්මය යන දෙකම සම්බන්ධ කර ලෞකික ආශාවන් වල නොගිලී සිටීමට "සුහ්ද්" යනුවෙන් හඳුන්වන බැඳීම්වලින් තොරවූ ජීවිතය ඉස්ලාම් දිරිගන්වයි.

ඉස්ලාම් දේව විශ්වාසවන්තයෙකුට ලෞකික කටයුතුවලදීත්, එහි ක්‍රියා පිළිවෙත් වලදීත්, අධ්‍යාත්මික තත්ත්වය ලබාදීමට අමතක කළේ නැත. උදහරණයක් වශයෙන් විවාහ වීම ලෞකික කටයුත්තක් ලෙස සැලකුවද, එයට ඉස්ලාමීය සීමා වශයෙන් ඊජාබ්- කබූල් සාක්ෂි දෙක, වලී, මහර් යන අංගයන් බිහි කර තිබීම ඉස්ලාමීය පසුබිමක් ඇතිවිය යුතු යන්න තහවුරු කිරීමටය.

## සුහ්ද් සම්බන්ධයෙන් අල් කුර්ආන් මෙසේ පවසයි.

1. "මිනිසුනි, ඇත්ත වශයෙන්ම අල්ලාහ්ගේ පොරොන්දුව සත්‍ය වූවකි. මෙලොව ජීවිතය ඔබව නොරවටත්වා. රවට්ටන්නාද (ෂෛතාන්) අල්ලාහ් සම්බන්ධ කරුණුහිදී, ඔබලාව නොරැවටත්වා" (35:5)

2. (එබැවින්) ධනයත්, ජනතාවත්, මෙලෝ ජීවිතයට අදළ අලංකාරයන් (මිස සදකාලික නොවේ.) සදකල් ස්ථිරවූ යහපත් ක්‍රියාවන් ඔබලාගේ දෙවියන් ඉදිරියේ යහ ප්‍රතිඵල ලැබීමට ඉතා උසස් හා ප්‍රිය දක්වීමට යහපත් දේද වේ." (18:46)

## සුහ්ද් සම්බන්ධ හදීස්

1. මරණයට පත්වූ විට කරුණු තුනක් පසුපස එයි. ඒවා නම් -
   * ඔහුගේ පවුල
   * ඔහුගේ ධනය
   * ඔහුගේ ක්‍රියා

   භූමදනය කළ පසු ඔහුගේ පවුලත්, ඔහුගේ ධනයත් ආපසු හැරෙන්නේය. ඔහුගේ ක්‍රියාව රැඳෙන්නේය, යනුවෙන් රසූල් (සල් ) පැවසූහ. (බුහාරි, මුස්ලිම්.)

2. පරලොව විෂයයෙහි මෙලොව යනු ඉතාමත් අල්ප වූ දෙයක් බව නබි (සල්) තුමාණන් පැවසූහ. (මුස්ලිම්)

3. "ඔබලාට පහළින් (පහසුකම් අඩුව) සිටින්නන්ව බලන්න. ඔබලාට ඉහළින් සිටින්නවුන් දෙස නොබලන්න. ඔබලාට අල්ලාහ් ලබාදුන් දයාදයන් අවතක්සේරු නොකර සිටීමට මෙය ඉතාමත් සුදුසුය," යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

4. නබි (සල්) තුමාණන් වෙත මිනිසෙකු පැමිණ "අල්ලාහ්ගේ දූතයාණෙනි, අල්ලාහ් ද මාව ප්‍රියකර, මිනිසුන්ද මාව ප්‍රිය කිරීමට අදාළ ක්‍රියාවත් මාහට පෙන්වා දෙන්න," යනුවෙන් පැවසූ විට, එයට නබි (සල්) තුමාණන්, "ලෝකයට ඇලුම් නොකරන්නෙකු ලෙස සිටින්න. අල්ලාහ් ඔබට ප්‍රිය කරයි." මිනිසුන් සතුව තිබෙන දේවල්හි අවශ්‍යතා නැත්තෙකු වශයෙන් සිටින්න." යනුවෙන් පිළිතුරු දුන්හ.

   නබි (සල්) තමන්ගේ ජීවිතයේ දී මිනිසුන්ට කළ උපදෙස් වලින් ඉතා අගනා කරුණු දෙකක් මෙම හදීස්හි අඩංගු වී ඇත.

1. මෙලොවේදී මිනිසෙකු බැඳීම් වලින් තොරව තම ජීවිතය සකසා ගතයුතුය. මෙය ඔහුට ඔහුගේ දෙවියන්ගේ ආදරය ලබාදේ.

2. අනෙක් මිනිසුන් සතුව තිබෙන දෙයට ආශා කිරීමෙන් වැළකී සිටීම, මෙය ඔවුන්ගේ ආදරයත් සෙනෙහසත් කෙසේ ලබාගෙන සමාජය අතරෙහි සම්බන්ධතාව කෙසේ විය යුතුද යන්න විස්තර කරයි.

## සුහ්දිහි යථාර්ථය

"මෙලොවෙහි බැඳීම් වලින් තොරව ජීවත් විය යුතුය. "යනුවෙන් ප්‍රකාශ කරන අවස්ථාවේ "ලෝකයෙන් සම්පූර්ණයෙන් මිදී එහි තිබෙන දේවල් සියල්ලෙන්ම සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුයි." යන්න අදහස් නොකළ යුතුය. එමෙන්ම මෙලොව ජීවිතය ද දුෂ්කරතාවයෙන් යුතු, දැඩි කටුක ජීවිතයක් ගත කළ යුතු යන අදහසට ද, එළඹිය යුතු නැත. එලෙස කිරීම "සුහ්ද් " යන තේරුම ඇති බැඳීම්වලින් තොරවූ ජීවිතය යන තත්වයෙන් මිදී "රහ්බානියත්" යන තපස් ජීවිතය කරා පියමං කිරීමක් සිදුවේ. පළමු තත්ත්වය ඉස්ලාම් පිළිගන්නා අතර, දෙවන තත්ත්වය ඉස්ලාම් තහනම් කරයි. "ඊමාන්දරියණි අල්ලාහ් ඔබට අනුමත කර තිබෙන යහපත් දේවල් ඔබලා අවලංගු නොකරගන්න. එනමුත් අයහපත් ලෙස සීමාව ඉක්මවාද නොයන්න. ඇත්ත වශයෙන්ම අල්ලාහ් සීමාව ඉක්මවා යන්නන් ප්‍රිය කරන්නේ නැත. (5:87)

"ඉස්ලාමයේ තපස් ජීවිතයක් නැත" යන නබි වදන අහ්මද් නම් ග්‍රන්ථයේ සටහන් වී ඇත. මෙයද සුහුද් හි යථාර්ථය අවබෝධ කර දෙන එක් සාධකයෙකි.

එබැවින්, බැඳීම්වලින් තොරවූ ජීවිතය, යන කරුණ මුල් කරගෙන කිළිටු වූ ඇඳුම් ඇඳගෙන කිසිම ආකාරයක ඉපැයුම් මාර්ගයක නොයෙදී, ඉස්ලාමයටත්, ඉස්ලාමීය සමාජයටත් උසස් තත්ත්වයක් ලබාදෙන කුමන ආකාරයට හෝ ක්‍රියාවක නොයෙදී ජනතාවගේ දන පරිත්‍යාග වලින් පමණක් ජීවත් වී, වත්පිළවෙත් වල යෙදීමෙන් පමණක් කාලය ගත කරන ජීවන ක්‍රියාවලිය ඉස්ලාම් කිසිසේත් අනුමත කරන්නේ නැත. සහභාවරුන්ගේ ජීවන ක්‍රමය අධ්‍යයනය කළ තත්කාලීන ඉස්ලාමීය විද්වතෙක් පහත සඳහන් ආකාරයට පවසන්නේ මේ නිසාය.

“සහභාවරු රාත්‍රී කාලවල දී නැමදුම් කටයුතු වල යෙදෙමින් තාපසයින් මෙන් කල්ගෙවති. එමෙන්ම, දහවල් කාලයේ දී ඔවුන් ජිහාදයේ යෙදෙන අශ්වාරෝහකයින් ලෙස කටයුතු කරති. ” ඒ අනුව බැඳීම්වලින් තොර ජීවිතය ඉස්ලාම් උගන්වන්නේ මෙම පසුබිමෙහිය.

**සුහ්ද් සම්බන්ධයෙන් ඉස්ලාමීය විද්වතුන්**

1. යූනුස් ඉබ්නු මුයස්සරා (රහ්) .- ලෝකයේ බැඳීම් වලින් තොරව ජීවත්වීම යනු හලාල්වූ දේ - හරාම් කිරීම හෝ ධනය නාස්ති කිරීම හෝ නොවේ. ඒ වෙනුවට හැඟීම්වලින් තොර ජීවිතය යනු ඔබගේ අතේ තිබෙන දේවල්වලට වඩා අල්ලාහ් වෙත තිබෙන දේ සම්බන්ධ වැඩිපුර විශ්වාස කිරීමත්; දුෂ්කරතාවට ඔබ අසුවීමත්, අසු නොවී සිටීමත් සමාන බවට සිතුවිලි ඇතිවීමත්; සත්‍ය කරුණු සම්බන්ධයෙන් ඔබව ප්‍රශංසා කරන්නාත්, පිළිකුල් කරන්නාත් සමානයන් ලෙස ඔබට අවබෝධ වීමත්ය.

2. සුෆ්යාන් ඉබ්නු උයෙයිනා (රහ්) ගෙන් “ලෝකයේ බැඳීම්වලින් තොරවූ තැනැත්තා කවරෙක් ද? යනුවෙන් ප්‍රශ්න කරනු ලැබීය. එයට ඔහු “කවරෙක් කෙරෙහි ආශිර්වාද කරනු ලැබුවහොත් ඔහු ස්තුති කරන්නේ ද,” කවරෙක් පරීක්ෂණයට ලක් වූ විට ඉවසීම අනුගමනය කරන්නේ ද ඔහුමය.” යනුවෙන් පැවසුවා.

3. සුෆ්යානුෂ් සෞරි (රහ්) - බැඳීම් වලින් තොරවූ ජීවිතය යනු ආශාවන් සීමාකර ගැනීම වේ. ඒ වෙනුවට දැඩි දේවල් අනුභවය කිරීම නොවේ.

**වරඋඃ හික්මීම**

“ඔබට සැක ඇති කරන දේ අත්හැර සැක ඇති නොවන දේ අනුගමනය කරන්න.” යනුවෙන් රසූල් (සල්) තුමාණන් පැවසූ දේ තමා සිතේ රඳවා ගත් බව අල් හසන් ඉබ්නු අලි (රලි) තුමාණන් පවසයි.

ඉස්ලාම් තහවුරු කරන උසස් ගුණාංග වන පරිස්සම්වීම වන “අල් වරඋ” සම්බන්ධ අදහස තහවුරු කිරීමට මෙම හදීසය ගැනේ.

**වරඋ - පරිස්සම්වීමට මගපෙන්වන කුර්ආනයේ සාධක**

1. “ඔබලා සත්‍යය දැන දැනම එය සඟවා අසත්‍යය සත්‍යය ලෙස නොපෙරලන්න.”

2. “(නබිතුමණි), ඔබලා නොදත් කුමන හෝ කරුණක් ඔබලා අනුගමනය නොකරන්න. මන්ද යත්, ඇත්ත වශයෙන්ම කන, ඇස, සිත මේ සියල්ලෙන්ම (එහි ක්‍රියාව ගැනම පරලොව දිනයේ දී) ප්‍රශ්න කරනු ලබයි.” (17:36)

### වරදට මග පෙන්වන හදීසයන්

1. ඇත්ත වශයෙන්ම හලාල් පැහැදිලිය. හරාම් පැහැදිලිය.  මේ දෙක අතරමැද සැක සහිත දේවල් ද පවතී. ඒවා අධික ලෙස ජනයා නොදන්නේ ය. (බුහාරි මුස්ලිම්)

2. වැරැදි සහගත දේ සිදුවේද ? යන භයෙන් වැරැදි නොවන දේ අත්හරින තත්වය (පරිස්සම් වීම) ඇතිවන තාක්කල් ගැත්තෙකු මුත්තකීන්වරුන්ගෙන් කෙනෙකු වන්නේ නැත. (තිර්මිදි)

### පරස්සම්වීමේ මට්ටම් තුන

1. අල්ලාහ්, මලාඉකාවරුන්, මිනිසුන්, අනෙක් මැවීම් ආදියෙහි කැලලක් ඇති නොවන පරිදි සිත ආරක්ෂා කිරීමේ තත්වය ලබා ගැනීම.

2. කුසලයන් කිරීමේ තත්වය ලබාගැනීම එනම් අකුසල් කරන කාලයද, කුසලයන් කිරීමට යොදා ගැනීම, අකුසල් වලින් අප සිදුකළ කුසලයන් අඩු නොවන ආකාරයට  පරිස්සම්වීම.

3. ඊමානය ආරක්ෂා කරන අවස්ථා ලබා ගැනීම. මන්දයත්, ඊමානය, කුසලයන් කරන විට වැඩිවන අතර, අකුසල් කරන විට අඩුවෙයි.

ඇත්ත වශයෙන්ම හික්මීම යන ගුණාංගය කෙනෙක් වෙත පිහිටන විට, ඔහුගේ සියලු කටයුතු ද ක්‍රමවත් වෙන බවට සැකයක් නැත. එක් අවස්ථාවක නබි (සල්) තුමාණන් අබූහුරෙරා (රලි) ට පහත සඳහන් ආකාරයට ප්‍රකාශ කළහ. අබූහුරෙරා පරිස්සම් වන්නෙකුව සිටින්න. එවිට මිනිසුන් අතරේ විශාල නැමදුම්කරුවෙකු වන්නේ ඔබය. මෙම ගුණාංගයේ වැදගත්කම අවබෝධ කරගත් නබි සහයන්, මෙය කෙතරම් දුරට අනුගමනය කළා ද යත්? ඔවුන්ගෙන් සමහරුන් හරාමයක් සිදුවේ දෝ යන බියෙන් අනුමත කළ දේවල් වලින් වැළකී සිටින්නන් ලෙස පසුවූහ.

### පොදු දේපළ පරිහරණය කිරීමේ දී කුලෆාඋර් රාෂිදීන්වරුන්ගේ පරිස්සම් සහගත බව

එක් අවස්ථාවක අබූබක්ර් සිද්දීක් (රලි) තුමාණන් ආහාර ගැනීමට ආරම්භ කර විගස තම සේවකයාගෙන් “මේ ආහාරය ලැබුනේ කොහෙන්ද”යි කියා විමසූහ. එයට සේවකයා ඔබ කෙරෙහි සෙනෙහස දැක්වූ එක් වහලෙකු මෙම ආහාරය ඔබට ලබාදී තිබුණි, යනුවෙන් පැවසූ විට සැක සහිත තත්වයක් කලීෆාට ඇති වූ හේතුවෙන් එම ආහාරය අනුභවය කිරීම නවතා, වමනය කිරීමට පටන් ගත්තහ.

මෙය බලා සිටි කෙනෙක් “අල්ලාහ් ඔබට ආශිර්වාද කරත්වා. එක් ආහාර පිඩක් සඳහා මෙතරම් දුෂ්කරතාවය ඉවස ගන්නවාද? යනුවෙන් ඇසුවිට, ඒ ආහාර පිඬ පිටවන්නේ මාගේ ප්‍රාණයත් සමග බව හැඟුණ ද, එය එළියට ගන්නේමය. මන්ද යම් හරාම් වූ දෙයකින් වර්ධනය වන ශරීරය නිරයේ ගින්නට ඉතාමත් සුදුසු වෙයි. ”යනුවෙන් නබි

(සල්) පැවසීම මා ශ්‍රවණය කර ඇත්තෙමි.” යනුවෙන් ප්‍රකාශ කර පරිස්සම් වීමේ, ඉහළ තත්ත්වය අබූබක්ර් සිද්දීක් තුමාණන් (රලි) ප්‍රදර්ශනය කළහ. (හයාතුස් සහාහා)

අමීරුල් මුඃමිනින් කලීෆා උමර් (රලි) තුමාණන්ව මුණ ගැසීමට එක් පුද්ගලයෙකු එතුමා වෙත ආ විට ඔහුව වාඩිකරවා කලීෆා තුමාණන් එතෙක් වෙලා දැල්වෙමින් තිබුණු පහන නිවාදැමීය. ආ තැනැත්තා පුදුමයට පත්වී පහන නිවා දැම්මේ ඇයි? යනුවෙන් විමසූ විට, “ඔබ මෙහි පැමිණෙන තාක්කල් මම රාජකාරියේ නියෙලමින් සිටියෙමි. ඒ වෙනුවෙන් රජයේ වියදමින් පහන දැල්වෙමින් තිබුණි. ඔබ පැමිණි විට පුද්ගලික කරුණු කථා කිරීමට තිබෙන නිසා රජයේ පහන උපයෝගී නොකර මාගේ පුද්ගලික පහන දැල්වීමට ඒ ලෙස මම කළෙමි.” යනුවෙන් පැවසූහ. (හයාතුස් සහාහා)

## කුෂුඋ, කුළුඋ (දේවබිය හා යටහත් පහත් බව)

ඉස්ලාමීය ඉබාදතයන් අනුගමනය කරන විට ශ්‍රාවකයින් දේව බියෙන් ද යටහත් පහත් ව ද ඒවා සිදු කළ යුතු බව ඉස්ලාම් උපදෙස් වෙයි. මුණිච්චාව, ප්‍රශංසාව උඩඟුකම යනාදී පහත් ගුණාංගයන් ඇති නොවී තිබීමට මෙම කුෂුඋ-කුළුඋ තත්ත්වය ප්‍රතිරෝධයක් වන බව ඉස්ලාමීය විද්වතුන් පවසයි.

උදා : ඉස්ලාමීය වගකීම්වල කුළුණක් ලෙස ද, පිටකොන්ද ලෙස ද පවතින සලාතය ඉටුකරන මුඃමින්වරුන් ජයග්‍රහණය ලබයි. යනුවෙන් ශුද්ධ ග්‍රන්ථය අල්කුර්ආන් පහත සඳහන් ආකාරයට පැහැදිලි කරයි.

“මුඃමින්වරුන් ජයග්‍රහණය ලැබුවා. ඔවුන් කෙබඳු අයද යත් තම සලාතය දේව භියෙන් ඉටු කරයි.” (23:01)

තව ද, සලාතයේ දී අනවශ්‍ය ඝෝෂා හෝ සීමාව ඉක්මවූ නිහඬ බවක් අවශ්‍ය නොවේ. ඒ වෙනුවට මධ්‍යස්ථ බව පිළිගැනීමට ලක්වන බව පහත සඳහන් කුර්ආන් වාක්‍යය තහවුරු කරයි.

“නබිතුමණි ! ඔබගේ සලාතයේ (සීමාව ඉක්මවා) ශබ්ද නොකරන්න. (සීමාව ඉක්මවා) නිහඬතාව අනුගමන නොකරන්න. මධ්‍යස්ථ බැවින් කටයුතු කරන්න.” (17.110)

(විද්වතෙක් වූ ලුක්මානුල් හකීම් තම පුතාට කළ උපදේශයෙහි, ඔබ ඇවිදින විට මධ්‍යස්ථ බව පිළිපදින්න. ඔබගේ හඬ පාත් කරගන්න. හඬ වලින් ඉතාමත් පිළිකුල් සහගත වන්නේ බූරුවාගේ හඬය. (31:19)

## කුෂූඋ, කුලූඋ වලට මග පෙන්වන හදීසයේ සාධකයන්

1. ඇත්ත වශයෙන්ම අල්ලාහ් ඔබගේ රූපය හෝ ධනය හෝ බලන්නේ නැත. නමුත් ඔබගේ සිතත්, ක්‍රියාවත් බලයි (මුස්ලිම්)
2. නබි (සල්) නින්දට සූදනම් වන විට, පහත සඳහන් දුආව පාරායනා කරමින් නිදා ගනියි.

“දෙවියනි! මාව ඔබට බාර කරමි. මාගේ මුහුණ ඔබ දෙස හැරැව්වෙමි. මාගේ ක්‍රියාව ඔබට පැවරුවෙමි. මාගේ කොන්ද ඔබගේ පැත්තටම ඇල කරමි. ඔබට භියවීමෙනුත් , ඔබට ආදරය කිරීමෙනුත් මෙලෙස කළෙමි.” (බුහාරි, මුස්ලිම්)

**නිරීක්ෂණය හා සවයං විමර්ශනය (අල් මුරාකබා වල් මුහාසබා)**

**අල්කුර්ආනය මෙසේ පවසයි.**

1. නබිතුමණි, ඇත්ත වශයෙන්ම ඔබගේ හිමි නිරීක්ෂණය කරමින් සිටී. (89:14)
2. ඇසෙහි වංචාවන්, සිතෙහි සඟවා තිබෙන දෙයත් ඔහු හොඳින් දන්නේ ය.
3. “නිශ්චිත වශයෙන්ම අල්ලාහ්ට පොළෝතලයේ හෝ අහස්තලයේ තිබෙන කිසිවක් සැඟවුණු තත්වයේ නැත.”

හදීස් හි මෙසේ දක්වා ඇත.

1. බුද්ධිමතා යන්න, තමාව පරීක්ෂාකර, මරණයට පසුව තිබෙන ජීවිතය උදෙසා ක්‍රියා කරන්නේ ය. (තිර්මිදි)
2. මිනිසෙකුගේ යහපත් ගුණාංගය ඔහු තමාට වුවමනා නැති දේ අත් හැර දැමීම වේ. (තිර්මිදි)
3. ඔබ කොහේ සිටිය ද, අල්ලාහ්ට බිය වන්න. අකුසල් කළහොත් පිළිතුරු වශයෙන් අඛණ්ඩව කුසලයක් කරන්න. එය අකුසල විනාශ කරයි. යහපත් ගතිගුණ වලින් ජනතාව ආශ්‍රය කරන්න. (තිර්මිදි)

අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීමට ක්‍රියා කරන මුස්ලිම්, තමාගේ ක්‍රියාව ගැන ස්ව විභාගයක් කර ගැනීම අවශ්‍ය වේ. මෙය “මුහාසබා” යනුවෙන් හඳුන්වයි. කවරෙක් සෑම දිනකම, නින්දට යෑමට හෝ එදින තමා සිදුකළ ක්‍රියාවන් නැවත හැර බලා එය අල්ලාහ්ගෙන් පිළිගත් එකක් ද, එසේ නම් ඉඃලාසයෙන් (දේව බියෙන්) ඉටු කර තිබෙන්නේ ද? එසේ නැතහොත් තහනම් කළ දේද ? යනාදිය ගැන ස්වයං විමර්ශනය කර බැලිය යුතු ය. අල්ලාහ්ගෙන් පිළිගැනීමට ලක් නොවූ ක්‍රියාවක් සිදුවී තිබුණහොත් ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් ක්ෂමාව අයදීමත් ප්‍රතිඵලදයකය. එදා සිට අද දක්වා මෙම ක්‍රියාවලිය යහ ගුණ ඇත්තාවුන් සිදු කරමින් සිටියි.

## 07. අධ්‍යාත්මික වර්ධනයට අදාළ ක්‍රියාකාරකම්

මිනිසා ශරීරය, ඥානය, සහ ආත්මය යන ත්‍රිවිද කරුණුවලින් යුක්තව නිර්මාණය වී තිබේ. එම කරුණු තුනම ක්‍රමවත්ව පැවැතිය යුතු යන්න ඉස්ලාමයේ සංකල්පයකි. ඒ අතරින් ප්‍රධාන වශයෙන් අල්ලාහ් මිනිසාගේ ජයග්‍රහණය අධ්‍යාත්මික පාරිශුද්ධතාව මත තබා ඇත. "ආත්මය මතත් එය (මිනිසෙකු ලෙස) නිර්මාණය කළ තැනැත්තා මතත්, එහි යහපත, අයහපත එයට දැනුම් දුන්නා මතත් දිව්රා (පවසමි), කවරෙක් පව්වලින් තමාව පාරිශුද්ධ කර ගත්තේ ද? ඔහු ඇත්ත වශයෙන්ම ජයග්‍රහණය ලැබුවෙහිය. කවරෙක් එය (පවෙන්) ගිල්වූයේ ද ඇත්ත වශයෙන්ම පරාජය වූයේය. (91:7-10)

නබිවරුන් සියල්ලන්ම සිත පාරිශුද්ධ කර ගන්නා ලෙස ආරාධනා කරන ලදී. තෂ්කියතුන් නෆ්ස් යනුවෙන් හඳුන්වන සිත පාරිශුද්ධ කිරීම ඔවුන්ගේ ප්‍රධාන කටයුතු වලින් එකක් ලෙස පැවතුනි. තෂ්කියතුන් නප්ස් යනු ප්‍රයෝජනවත් ඥානය, යහක්‍රියා, යහපත පතුරුවා අයහපත වැළැක්වීම යනාදිය මගින් සිත පිරිසිදු කර එය පාරිශුද්ධ කිරීම වේ. මෙලෙස සිත පාරිශුද්ධ කර, එයට අදාළ ක්‍රියාවන් සිදුකරන විට ආත්මය පාරිශුද්ධ වන අතර, එය වර්ධනය ද වේ. ඒ අනුව අධ්‍යාත්මික වර්ධනයට අදාළ ක්‍රියා පිළිවෙත් බොහෝ ඇත. ඒවායෙන් ප්‍රධාන ඒවා අධ්‍යයනය කරමු.

### දිව (මුඛය) ආරක්ෂා කිරීම

අල්ලාහ් මිනිසාව ඉතාමත් අලංකාර ලෙස නිර්මාණය කර, ඔහුට ඇස්, කන්, නාසය, දිව, අත්, පාදය යනාදී ප්‍රයෝජනවත් අවයව ද ලබා දී ඇත. ඒවා අතරින් ඔහුට කථා කිරීමේ හැකියාව ලබා දෙන දිව ප්‍රධාන තැනක් උසුලයි. එය අල්ලාහ්ගෙන් ඔහුට ලබාදී තිබෙන ඉමහත් වූ දයාදයකි. දිව කතා කිරීම මගින් මිනිසාගේ සිතේ තිබෙන චේතනාව එළි දක්වීමටත්, අනෙක් අයට පණිවිඩයක් ලබා දීමටත් උදව් උපකාර වේ.

අල්ලාහ් මිනිසාට තම කටයුතු සියල්ල ප්‍රවේශමෙන් සකස් කර ගැනීමට අණ කර තිබේ. එසේම තමාගේ වචන ද ප්‍රවේශමෙන් පිට කරන ලෙස අණ කරයි. ඔහුගේ වචනයන් සත්‍ය ලෙසත් , අලංකාර ලෙසත්, ක්‍රමවත් ලෙසත්, බුද්ධිමත් ලෙසත්, ප්‍රමාණවත් ලෙසත්, යහපත අරමුණු කොටගෙනත්, දේව නැමදුමේ යෙදීමෙනුත්, අනෙක් අයට හානි නොකරන අයුරිනුත් පැවතිය යුතු ය.

### අල් කුර්ආන් - අල් හදීස් ඉගැන්වීම්

### දිව ආරක්ෂා කිරීම

* කවරෙක් අල්ලාහ්ගේ ආශිර්වාදය පතා, යහපත් කරුණු කළේ ද අප ඔවුන්ට මහත් වූ යහ ප්‍රතිඵල ලබා දෙන්නෙමු. (4:114)

* අබූ හුරෛරා (රලි) පවසයි. අල්ලාහ් සහ අවසාන දිනය විශ්වාස කළ කෙනෙක් යහපතම කථා කළ යුතු ය. නැතහොත් නිශ්ශබ්දව සිටිය යුතු ය, යනුවෙන් නබි (සල්) පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

* “ගැත්තෙකු (හොඳද ? නරකද? ලෙස) නොසිතා කථා කළහොත් ඒ හේතුවෙන් ඔහු නැගෙනහිර සිට බස්නාහිර තෙක් තිබෙන දුර ප්‍රමාණයට නිරයට වැටේ.” යනුවෙන් නබි (සල්) පැවසූ බවට අබූහුරෛරා (රලි) පවසයි. (බුහාරි මුස්ලිම්)

* අබූහුරෛරා (රලි) පවසයි. “ගැත්තෙකු අල්ලාහ්ගේ තෘප්තිය ලබා දෙන වචනයන් එහි වැදගත්කම නොදන පවසයි. එනමුත් ඒ වෙනුවෙන් අල්ලාහ් ඔහුගේ තත්ත්වය උසස් කරයි. ගැත්තෙකු අල්ලාහ්ගේ කෝපය ලබා දෙන වචනයක් එහි වැදගත්කම ගැන නොදනම කථා කරයි. ඒ වෙනුවෙන් ඔහු නිරයේ වැටේ.” යනුවෙන් නබි (සල්) පැවසූහ. (බුහාරි)

* එක් අවස්ථාවක නබි (සල්) සොහොන් දෙකක් පසුකරගෙන ගියහ. එවිට සොහොන් ගැබ්වල සිටින දෙදෙනා වේදනාව විඳිනු ලැබූහ. නමුත් “විශාල පාප ක්‍රියාවට මොවුන් වේදනා විඳින්නේ නැත. මොහු මුත්‍ර කරන අවස්ථාවල තම ශරීරය හෝ වස්ත්‍රය හෝ අපිරිසිදු වෙන තත්ත්වයෙන් වළක්වා නොගත් තැනැත්තාය. මොහු ජනයන්, අතර කේලාම් කියා, අවලාද දෙඩා ඇවිදිමින් සිටි තැනැත්තාය.” (බුහාරි) යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසුවාය.

* “කේලාම් කියන්නා ස්වර්ගයට පිවිසෙන්නේ නැත.” (බුහාරි) යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූ බව හුදෛබා (රලි) පවසයි.

* අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි) පවසයි. “අල්ලාහ් සිහිගන්වන භාවනාව (දික්ර්) හැර (වෙනත් කථාවන්) අධික ලෙස කථා නොකරන්න. අල්ලාහ්ව සිහි ගන්වන කථා හැර අනෙක් කථාවන් වැඩියෙන් කිරීම සිත දැඩි කරයි. ජනතාව අතර අල්ලාහ්ගෙන් ඉතාමත් ඈත්වී සිටින්නා, දැඩි සිත ඇත්තාය.” (තිර්මිදි) යනුවෙන් නබි (සල්) පැවසූවා.

* “තම දිවත්, ලිංගේන්ද්‍රයන් ආරක්ෂා කර ගන්නා බව කෙනෙක් භාර ගත්තේ නම්, ඔහුට ස්වර්ගය ලැබීමට මම ඇපවන්නෙමි.” (බුහාරි) යනුවෙන් නබි (සල් ) පැවසුවා.

**ඇස, කන හා ලිංගේන්ද්‍රිය ආදී අවයව රැක ගැනීම**

අල්ලාහ් මිනිසාට බොහෝ අවයව ලබා දී ඇත. ඒවා ඔහුට ලබා දී තිබෙන උසස් දයාද වේ. ඒවා ලබාදුන් අල්ලාහ්, ඒවා මිනිසා නිසි ලෙස භාවිතා කළ යුතු ය යන්න බලාපොරොත්තු වේ.

අල්ලාහ් මුස්ලිමෙකුට අනිවාර්ය කර තිබෙන වගකීම ඔහුගේ ශරීර අවයවයන්ගේ දයකත්වයෙන් ඉටු කරනු ලැබීම නිරීක්ෂණය කළ හැකිය. සලාතයේ දී දිව, අවයව, සිත, මොළය යනාදි සියල්ලම ක්‍රියා කරයි. උපවාසයේ දී මුළු ශරීරයම සැප පහසුව තහනම් කර ගනියි. හජ්, හිජ්රත්, ශුද්ධ යුද්ධය, අධ්‍යාපනය යනාදියට ශරීර අවයව බොහෝ දුෂ්කරතාවයන් දරා ගන්නා අතර කැපවී කටයුතු කරයි. මත්පැන්, අනාචාරය, ඌරුමස් යනාදිය මිනිසාගේ ගතත්, බුද්ධියත් ව්‍යාකූල කරන තත්ත්වයක් දකින්නට ලැබේ.

* මිනිසා කුමක් පැවසුව ද, එය ලිවීමට බලාපොරොත්තුවෙන් සිටින කෙනෙකු ඔහු වෙත නැත්තේ නොවේ. (ඔහුගේ) දිවෙන් පිටවන සෑම වචනයක්ම ක්ෂණිකව සටහන් කරනු ලබයි. (50:18)

* විශ්වාසවන්තයින් ඇත්ත වශයෙන්ම ජය ලැබූහ. ඔවුන් කෙබඳු අයද යත් ඉතාමත් දේව බියෙන් සලාත් කරයි. ඔවුන් නිශ්ඵල කාර්යන්ගෙන් වැළකී සිටියි. ඔවුන් සකාත් ද ලබා දෙයි. ඔවුන් තම ලිංගේන්ද්‍රිය ද (අනාචාරයෙන්) ආරක්ෂා කර ගනියි. (23:1-5)

* ආයිෂා (රලි) පවසයි. නබි (සල්) තුමාණන් පිරිසිදු කිරීම, (වුළු කිරීම, ස්නානය) හිස පීරීම පාවහන් පැලඳීම යනාදි සියලු ක්‍රියාවන් දකුණු පැත්තෙන් ආරම්භ කිරීමට පුරුද්දක් කොටගෙන සිටියහ. (බුහාරි, මුස්ලිම්)

* හෆ්සා (රලි) තුමාණන් පවසයි. "නබි (සල්) ආහාර ගැනීමේදීත්, පානය කිරීමේදීත් තමාගේ දකුණු අතම භාවිතා කළහ. මේ නොවන ක්‍රියාවන්ට තම වමත භාවිතා කරයි." (අබූදාවූද්)

* නබි (සල්) තුමෝ පැවසූහ. ඔබගේ දෑසට ඔබ පිළිබඳ අයිතියක් ඇත. එබැවින් මෙම දේව වරප්‍රසාදයට ගෞරව කිරීම සෑම විශ්වාසයෙකුගේම වගකීම වේ. මෙම දයාදය සර්ව බලධාරී අල්ලාහ්ගේ අධිෂ්ඨානය පරිදිම භාවිත කළ යුතු ය. (තිර්මිදි)

* නබි (සල්) තුමාණන් "ඔබට උදව් කරන්නාට උදව් කරන්න. කරදර කරන්නාට උදව් කරන්න." යනුවෙන් පැවසූහ. කරදර කරන්නාට උදව් කරන්නේ කෙසේ ද? යනුවෙන් සහාභාවරුන් විමසූහ. "ඔහු ඒ පව නොකර වළක්වා ගැනීම ඔහුට කරන උදව්ව වේ." යනුවෙන් පැවසූ හ.

## කාලය පිළිබඳ සැලකිලිමත්වීම

කාලය යනු මිනිසාගේ ජීවිතයේ කොටසකි. ඇත්ත වශයෙන්ම කාලය යනු ජීවිතය වේ. කාලය ගත කිරීම යනු ජීවිතයේ එක් කොටසක් ගෙවීයාමයි. කාලය අසිපතක් බඳුය. "එය ඔබ නොකපාදැමුවහොත්, එය ඔබව කපා දමයි. " යන රුවන් වැකිය යථාර්ථය පැහැදිලිව විස්තර කරයි. කාලය හැර නැතිවූ ඕනෑම එකක් නැවත ලබා ගැනීමේ හැකියාවක් පවතී. කාලය නැති කරගතහොත් එය නැවත කවදාවත් නොලැබේ. එනම් එය මිනිසා ලබාගෙන තිබෙන විශාල වූ වටිනාකමින් යුත් දෙයකි. එක් මුෘමින් සෑම විටම කාලය යහපත් දේවල් සඳහා යෙදවීමට උත්සාහ දරයි. පහත් වූ, විනාශකාරි වූ, අනවශ්‍ය දේවල් කිරීම මගින් කාලය ගත නොවිය යුතුය යන හැඟීමෙන් කටයුතු කරයි.

කාලය පිළිබඳ සැලකිලිමත් වීම ඉස්ලාම් අවධාරණයෙන් කියන එක් මූලික ගුණාංගයකි. සලාතය, සකාතය, උපවාසය, හජ් යනාදී සත් ක්‍රියා (ඉබාදත්) සියල්ල කාලය මුල් කරගෙන එය ආරක්ෂා කිරීමේ පදනමින් නිර්මාණය කර තිබෙන්නේ ඒ නිසාය.

* “රාත්‍රිය දහවල වෙනස්වීම මතත්, අහස් හි පොළෝ තලයේ අල්ලාහ් නිර්මාණය කර තිබෙන දේවල්වලිනුත් දේව විශ්වාසය ඇති ජනතාවට (උපදේශනය දෙන) බොහෝ සාක්ෂි ඇත්ත වශයෙන්ම ඇත.” (10:6)

* “එබැවින් (විශ්වාසවන්තයිනී), ඔබලා ඔබලාගේ උදය කාලයේත්, හවස් කාලයේත් අල්ලාහ්ට ප්‍රශංසා කරමින් සිටින්න.” (30:17)

* “(එලෙස නොව) ඔබලා විඩාව නිවා ගැනීමට රාත්‍රියත් (බොහෝ ස්ථානවලට ගොස් ජීවන අවශ්‍යතා වන) ඔහුගේ දායාද ඔබ සොයාගැනීම සඳහා දහවලත් ඔබලාට ඔහු නිර්මාණය කර තිබෙනවාට ඔහුගේ කරුණාවම හේතුව වේ. මෙයට ඔබලා ස්තුතිවන්ත වන්න” (28:73)

* “ඔවුන් සියල්ලන්වම අල්ලාහ් (ප්‍රාණය ලබාදී) නැගිටවනු ලබන දිනයේ ඔවුන් කළ දේවල් පිළිබඳව ඔවුන්ව දැනුවත් කරයි. එය ඔවුන් අමතක කළ ද ඒවා අල්ලාහ් රැස්කර තබයි. (ඔවුන් කරන) සියල්ල අල්ලාහ් දැන සිටියි.”

* නබි (සල්) තුමාණන් පැවසූහ. “පරලොව දිනයේ සෑම ගැත්තෙකුම, ප්‍රශ්න හතරකට පිළිතුරු දෙන තෙක් එම ස්ථානයෙන් පියවරක් හෝ ඉවත් විය නොහැක.”

  (i) ඔබගේ ජීවිතය කෙසේ ගත කළේ ද?
  (ii) ඔබගේ තාරුණ්‍යය කෙසේ ගත කළේ ද?
  (iii) ඔබගේ ධනය කෙසේ රැස්කර, කෙසේ වියදම් කළේද ?
  (iv) ඔබ ලබාගත් දැනුම මගින් කෙතරම් කටයුතු කළේ ද? එම ප්‍රශ්න හතරයි (බුහාරි, මුස්ලිම්)

* නබි (සල්) තුමාණන් පැවසූහ. - “බුද්ධිමත් කෙනෙකු කාලය කොටස් හතරකට වෙන් කර ගනියි. එහි එක් කොටසක් තම ස්වාමියාට ඉබාදත් කරමින් (නමදිමින්) සිටියි. අනෙක් කොටසින් ඔහු තමාව ස්වයං විමර්ශනය කරමින් සිටියි. තුන්වන කොටසින් අල්ලාහ්ගේ නිර්මාණයන් ගැන ඔහු සිතයි. හතර වන කොටසින් තම ජීවිතයට අදාළ අවශ්‍යතාව ඉටුකරගනියි කරයි.” (ඉබ්නු හිබ්බාන්)

* “අල්ලාහ්!මාගේ උම්මත්වරුන්ගෙන්, හිමිදිරියේ අවදිවෙන්නාට ඔබ ආශිර්වාද කරන්න.” යනුවෙන් නබි (සල්) ප්‍රාර්ථනා කළාය. (මුස්ලිම්)

* “ඉර බැස යාමට ආසන්න වේලාවේදී අසර් සලාතය ඉටු කරන්නාගේ සලාතය මුනාෆික්වරයෙකුගේ සලාතය වේ”. යනුවෙන් නබි (සල්) පැවසුවා. (මුස්ලිම්)

* උමර් (රලි) තුමාණන් පැවසූහ. “දහවල් කාලයේ දී ඉටු කළ යුතු සමහර වගකීම් තිබේ. ඒවා අල්ලාහ් රාත්‍රියේ දී අනුමත කරන්නේ නැත. එලෙසම

රාත්‍රී කාලයේ දී අල්ලාහ්ට ඉටු කළ යුතු සමහර වගකීම් තිබේ. ඒවා අල්ලාහ් දහවල් කාලයේ දී අනුමත කරන්නේ නැත." (බුහාරි)

* නබි (සල්) තුමාණන් පැවසූහ. "නිර්ර්ථකාරී අනවශ්‍ය කාර්යයන් අත්හැර දැමීම මිනිස් ර්මානයේ සුවිශේෂ අංගවලින් එකකි." (තිර්මිදි)

## තාරුණ්‍යයේ වැදගත්කම හා එය යහපත් මාර්ගයේ යොදා ගැනීම

අල්ලාහ් මිනිස් ජීවිතය බොහෝ අදියරවලින් යුක්තව සැලසුම් කර තිබේ. ළමා අවධිය, තරුණ අවධිය තවද මහළු අවධිය යනාදිය ඒවායෙන් වැදගත් අංගයන් වේ. එයින්ද විශේෂයෙන් තරුණ අවධිය ඉතාමත් වැදගත් අංගයකි. මහා අරගලවලදීත් විප්ලවවලදීත් තරුණයන් සෘජුව දයක වේ.

නබි (සල්) තුමාණන්ගේ ඉතිහාසයේ ද තරුණයන්ගේ සහභාගිත්වය ඉතාමත් අධිකය. ඔවුන්ගේ තෑවා කටයුත්තේ ද, සටන්වලදීද එතුමා සමඟ කරට කර සිටගෙන ක්‍රියාකළ අය තරුණයන් වශයෙන් සිටි සහභාවරුය. ඉස්ලාමීය ඉතිහාසයේ ත් මුහම්මද් බින් කාසිම්, තාරික් බින් සියාද් යන අය මෙන් විශාල පරිත්‍යාගයන් කළ අය තරුණයන්වේ.

තරුණ අවධිය යහපත් ලෙස යොදාගත් අයට පරලොව දිනයේ දී අධික වරප්‍රසාදයන් ලැබෙන බව හදීසයන් පවසයි. අල්ලාහ්ගේ සෙවන හැර වෙනත් සෙවන නැති පරලොව දිනයේ දී ඔහු හත් දෙනෙකුට සෙවන ලබා දෙන කෙනෙක්. අල්ලාහ්ගේ ඉබාදතය සමගින් වැඩුණු තරුණයන්. (බුහාරි)

දේව දූතයාණන් (සල් තුමාණන්) එක් මිනිසෙකුට පහත සඳහන් ආකාරයට උපදෙස් ලබා දුන්නා. ඔබ කරුණු පහක් සිදුවීමට ප්‍රථමයෙන් කරුණු පහක් ප්‍රයෝජනයට ගන්න. ඔබගේ මහළු වියට ප්‍රථමයෙන් තරුණ කාලයද, රෝග ඇතිවීමට ප්‍රථමයෙන් සෞඛ්‍යය ද, දරිද්‍රතාවයට ප්‍රථමයෙන් ධනය ද, අවිවේකයට පෙර විවේක කාලයද, මරණයට ප්‍රථමයෙන් ජීවිතය ද ප්‍රයෝජනයට ගන්න. (නසයි, හාකිම්)

* තරුණයන් පිරිසක් එක් ගුහාවක් තුළට (ආරක්ෂාව පතා) පිවිසි විට ඔවුන් "අපගේ දෙවියනි! ඔබගේ ආශිර්වාදය අප වෙත ලබා දෙන්න. අපගේ කටයුත්තෙහි සෘජු මාර්ගය අපට පහසු කරන්න." යනුවෙන් (ප්‍රාර්ථනා කර ) පැවසූහ. (අල්කුර්ආන් 18:10)

* යූසුෆ් (අලෛ) තුමාණන් තම තරුණ අවධියේ දී බන්ධනාගාරය තුළ වුවද ප්‍රචාරක මෙහෙය අත් නොහරින්නෙකු වශයෙන් සිටියහ. එතුමා බන්ධනාගාර සගයන්ට මෙලෙස පැවසූහ. බන්ධනාගාරයේ සිටින මාගේ මිතුරණි ! (කිසිදු ශක්තියක් නැති) වෙනත් දෙවිවරුන් හොඳද ? නැතහොත් (සියල්ලම පාලනය කරන ) එකම දෙවියා වූ (එකම) අල්ලාහ් උසස් ද? (12:39)

* ඔහු හැර ඔබලා නමදින සියල්ල ඔබලාත් ඔබගේ මුතුන් මිත්තන් තබා තිබුණු හුදෙක් (මනඃකල්පිත) නම් මිස (ඇත්ත වශයෙන්ම ඒවා කිසිවක්) නොවේ. අල්ලාහ් මෙයට කිසිදු මූලාශ්‍රයක් පහළ කළේ නැත. සියලු බලතල අල්ලාහ්ට පමණක් හැර (වෙන කිසිවකුට) නැත. ඔහු හැර (වෙන කිසිවක්) ඔබලා නැමදිය යුතු නැති බවට ඔහුම අණ කර තිබේ. නිවැරදි මාර්ගය මෙයම වේ. නමුත් මිනිසුන්ගෙන් බහුතරයන් (මෙය) අවබෝධ කරගන්නේ නැත. (යනුවෙන් යූසුෆ් තුමාණන්ට යහ උපදේශයක් කර (12:40)

## 08. අධ්‍යාත්මික වර්ධනය සඳහා සමාජ සම්බන්ධතා

මිනිසාට තනියෙන් ජීවත් වීමට නොහැකිය. ඔහුට තමාගේ සමාජය සමග එකතු වී ජීවත් විය යුතුව තිබේ. එලෙස එකතු වී ජීවත් වන විට ඔහු ළඟ සමාජ සම්බන්ධතාව පිළිබිඹු කිරීමේ සාරධර්ම ඉස්මතු විය යුතුය. ඒ මගින් ක්‍රමවත්ව ජීවත් වීමට හැකි වනවා මෙන්ම එම සමාජය තුළ අධ්‍යාත්මික බැඳීම් වර්ධනයට ද හේතුවක් වේ. ඉස්ලාම් මෙවන් ආකාරයේ වූ ගුණාංගවලට මුල් තැන ලබා දී ඇත.

### අන්‍යෝන්‍ය සම්බන්ධතාව

මිනිස් ජීවිතයේ සැපත් දුකත් ඇති වීම ස්වභාවිකය. එම අවස්ථාවන්වලදී සම්බන්ධ වීම, ඉතා උසස් ගුණාංගයක් වේ. එක් මුඃමින් අනෙක් සහෝදරයාගේ සතුටුදායක සිද්ධීන්වලට පමණක් නොවන ශෝක ජනක අවස්ථාවන්වලදී ද සම්බන්ධ වී ඒවා බෙදා හදා ගනී.

* ඇත්ත වශයෙන්ම දේව විශ්වාසවන්තයින් (සියල්ලන්ම) ඇත්ත වශයෙන්ම සහෝදරයන්ය. (49:10)

* කවරක් (මෙයට පසුවත්) විශ්වාසවන්තයන් අතරේ (මෙලෙස) ලැජ්ජාසහගත කරුණු ව්‍යාප්ත කිරීමට උත්සාහ දරන්නේ ද, ඔවුන්ට ඇත්ත වශයෙන්ම මෙලොවත් පරලොවත් ඉතාමත් කටුක වේදනා පවතී. (24:19)

* සඃද් බින් අබි වක්කාස් (රලි) තුමාණන් පැවසූහ. "නබි (සල්) තුමාණන් මම රෝගීව සිටියදී මාව සැපදුක් විමසීමට පැමිණ, දෙවියනි සඃද්ට රෝගයෙන් නිවාරණයක් ලබා දෙන්න. " යනුවෙන් ප්‍රාර්ථනා කළහ. (බුහාරි)

* "දේව විශ්වාසිකයන් එකිනෙකාට සහයෝගය දැක්වීමේ කාර්යයෙහිදී ගොඩනැගිල්ලක් බඳුය. ගොඩනැගිල්ල එක් කොටසක් එක් කොටසකට ශක්තිය ලබාදේ." යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූහ. අනතුරුව තම අත්වල ඇඟිලි අමුණා පෙන්වූහ." යනුවෙන් මූසා අල් අෂ්අරී (රලි) තුමා දන්වයි. (බුහාරි)

* "මුඃමින් වරයෙකුට ඔහුගේ කරදර ඉවත් කිරීම මගින් හෝ ඔහුගේ ණය තුරුස් ගෙවා දැමීම මගින් ඔබ ඇති කරන සතුට අල්ලාහ් බෙහෙවින් ප්‍රිය කරන දෙයකි. " යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූහ.

* බරාඃඉබ්නු ආසිෆ් (රලි) මෙසේ දන්වා ඇත. "රෝගීන්ගේ සුවදුක් විමසීම, ජනාසාවට සහභාගිවීම, කිවිසුම් පිටකළ කෙනාට පිළිතුරුදීම, යුක්තිය ඉටු කිරීම, අයුක්තියට ලක්වූවන්ට උදව් කිරීම, සංග්‍රහවලට ආරාධනා ලැබුණ අවස්ථාවල ඒවාට යාම, සලාමය ව්‍යාප්ත කිරීම ආදිය නබි (සල්) තුමාණන් අණ කළහ." (බුහාරි මුස්ලිම්)

**ණය, උකස්, අතමාරු ලබාදීම (අද්දෙන්, අල්රහන්, අල් ආරියා)**

මේවා සමාජ ජීවිතයේ දී ගනු දෙනු කිරීමේදී ජනතාව සමග සම්බන්ධ කරුණුය. කෙනෙකු අනෙක් අයට ආපසු ලබා ගැනීමේ පදනමින් ලබා දෙන මුදල හෝ ද්‍රව්‍ය ණය වශයෙන් හඳුන්වමු.

“මුස්ලිම් කෙනෙකු තවත් මුස්ලිමෙකුට දෙවතාවක් ණය ලබා දීම එක් වතාවක් දන්දීමට සමානය.” (අල් හාකිම්) එමෙන්ම ණය ලබා ගැනීමෙන් හැකි පමණින් පාලනය කරගන්නා ලෙස ඉස්ලාම් උපදෙස් ලබා දෙයි. “ණය අත්හරින්න. නිදහසේ ජීවත් විය හැකිය.” (අල් හාකිම්)

ණය යනු ඉතාමත් වගකීමක් හා විමර්ශනයට ලක්විය යුතු දෙයක් බව අප අවබෝධ කර ගැනීමට, ජනාසා ඉටු කරන කරුණෙහි නබි (සල්) තුමාණන් “මෙම මියියතය කවරෙකුට හෝ ණය දීමට තිබෙන්නේ ද?” ලෙස අසලා එම ණය ගෙවා දැමීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවන්නා තාක්කල් සලාතය ඉටු නොකර සිටීම නබි තුමන්ගේ ආදර්ශයක් වී තිබුණු බව මෙහිදී සැලකිය යුතු කරුණකි.

ණය සම්බන්ධයෙන් අල් කුර්ආනයේ පහත සඳහන් මග පෙන්වීම අපගේ අවධානයට යොමු විය යුතු එකකි. ණය ලබාගන්නා කෙනෙකු මා ලබාගත් ණයට විකල්පයක් වශයෙන් ණය ආපසු ලබා දෙන තෙක් මුදලේ වටිනාකමට සරිලන භාණ්ඩයක් කොන්දේ සි මත ලබාදීම “උකස්” යනුවෙන් හැඳින්වේ. “ඔබලා චාරිකාවේ යෙදී සිටින විට (ගනු දෙනු කිරීමේ අවශ්‍යතාව මතුවී එය ලියා ගැනීමට ) ලියා ගන්නෙකු නොලැබුනහොත් (එක් භාණ්ඩයක්) ආදේශකයක් වශයෙන් ලබාගන්න.” (2:283)

## බදුදීම (අල් ඉජාරා) (Rent)

ගොඩනැගිල්ලක් නැතහොත් භාණ්ඩයක් නියමිත කාලයක් දක්වා නියම කරන ලද මුදලක් පදනම් කරගෙන තවත් කෙනෙකු භාවිත කිරීමට අවස්ථාවක් ලබාදීම “බදු දීම” වශයෙන් සලකනු ලැබේ. තවත් ආකාරයකින් පවසන්නේ නම් යම් භාණ්ඩයකින් ලබා ගත හැකි ප්‍රයෝජන වෙනුවට ලබා දිය යුතුදේ, කුලිය වේ. මිනිස් ශ්‍රමය සඳහා ලබා දෙන දේ කුලිය (wage) වශයෙන් ද හඳුන්වමු.

ඉජාරා වශයෙන් හඳුන්වන බදු දීමේ ක්‍රමය සඳහා පහත සඳහන් කොන්දේසි අනුගමනය කළ යුතු බව ඉස්ලාමීය නීතිය විස්තර කරයි :-

1. දෙපාර්ශ්වයම සිහි බුද්ධියෙන් සිටිය යුතුයි.
2. පරිණත වයසට පැමිණ තිබිය යුතුයි.
3. ගිවිසුම සම්බන්ධයෙන් එකඟතාවට පැමිණ තිබිය යුතුයි.
4. බදු දෙන දෙය සම්බන්ධයෙන් මනා අවබෝධයක් තිබිය යුතුයි.

5. බදු දෙන භාණ්ඩය එය භාවිතයට ගතහැකි තත්වයෙන් ලබා දෙන හැකියාව තිබිය යුතුය.
6. බදු දීමට අදාළ භාණ්ඩය ෂරිආහ් අනුමත දෙයක් විය යුතුය.
7. බදු ප්‍රමාණය මුදල් වටිනාකමක් සහිත විය යුතුය, එම ප්‍රමාණය පිළිබඳ දැනුවත්ව සිටීම.

### ඇපවීම (අල් ළමාන්)

“විශ්වාසවන්තයිනි, ඔබලා යහපත් කරුණ සඳහාත් දේව විශ්වාසය වර්ධනය කරන කරුණු සම්බන්ධවත් එකිනෙකාට උදව් කර ගන්න. යන අල් කුර්ආනයේ මග පෙන්වීමට අනුව දුෂ්කරතාවයට පත්වූ එක් සහෝදරයෙකුට තවත් සහෝදරයෙක් ඉදිරිපත් වී උදව් කිරීම, අධිකරණ වරෙන්තුවකට හසුවී සිටින පුද්ගලයෙකුට මිත්‍රත්ව පදනමින් හෝ ඥාතිත්ව පදනමින් හෝ කෙනෙක් ඉදිරිපත් වී ඇපවීම යන යහ ක්‍රියාවට සම්බන්ධ වූවකිය. මෙහි විශේෂත්වය ගැන නබි (සල්) තුමාණන් “එක් ගැත්තෙකුට තවත් ගැත්තෙකු උදව් කරන සියලු අවස්ථාවේදී උදව් කරන ගැත්තාට අල්ලාහ් තම උදව්ව ලබා දෙමින් සිටියි.” යනුවෙන් පවසා ඇත. නබි වදනට අනුව ඇපවීම ඉස්ලාමීය සමාජ ව්‍යුහය තුළ සහෝදරත්ව හැඟීම හා සම්බන්ධ කරුණක් යන්නට මෙම නබි (සල්) වදන කදිම නිදසුනකි.

### සාක්ෂි දීම (අෂ් ෂහද)

අබූබක්ර් (රලි) පවසයි. “විශාල පව් ගැන ඔබට මම පවසන්නද ?” යනුවෙන් නබි (සල්) තුමාණන් ඇසූහ. “දේවදූතයාණනි පවසන්න” යනුවෙන් අපි පැවසුවෙමු. “එය අල්ලාහ්ට ආදේශ තැබීම, දෙමව්පියන්ට වේදනා දීම” යනුවෙන් ප්‍රකාශ කළ නබි (සල්) තුමාණන් හාන්සිව වාඩිවී ඇලවී දැනගන්න, බොරු සාක්ෂිකීමත් මෙහි වේ.” යනුවෙන් පුන පුනා පැවසූහ. එතුමාණන් නිශ්ශබ්ද නොවේදෝ ? යනුවෙන් අපි කියා ගන්නා තරමටම එයම නැවත නැවත පවසමින් සිටියහ. (බුහාරි, මුස්ලිම්)

අනස් (රලි) පවසයි. “අල්ලාහ්ගේ දූතයාණන් විශාල පව් සම්බන්ධයෙන් සඳහන් කළ එසේ නැතහොත් එතුමාණන්ගෙන් අසනු ලැබුණි. එවිට නබි (සල්) අල්ලාහ්ට ආදේශ තැබීම, ඝාතනය කිරීම, දෙමව්පියන්ට වේදනා කිරීම යනාදිය වේ.” යනුවෙන් පවසා මහා පව දන්වන්නදැ? යි, අසා බොරු කීම නැතහොත් බොරු සාක්ෂිය” (මහා පවක්වේ) යනුවෙන් පැවසූහ. (බුහාරි)

### පොදු දේපළ ආරක්ෂා කිරීම

පොදු දේපළ යනු ජනතාවගේ භාවිතයට යොදනු ලැබූ “වක්ෆු” කරනු ලැබූ ස්ථාන, ආයතන, ද්‍රව්‍යය ද වේ. මස්ජිද්, මද්රසා, අනාථ නිවාස, වැඩිහිටි නිවාස, පුස්තකාල, රෝහල්, උද්‍යාන යන සමාජ ආයතනයන් සියල්ල ඉස්ලාමීය දෘෂ්ඨියෙන් පොදු දේපළ වශයෙන් හඳුන්වනු ලැබේ. මේවා පුද්ගලික වශයෙන් කිසිවෙකුට අයිතිවාසිකම් කීමට හෝ විශේෂ කටයුතු සඳහා භාවිත කිරීමට හෝ අවසරයක් නැත. මේවායේ භාවිතය ගැන පරලොව දිනයේ ප්‍රශ්න කරනු ලබන බව පහත සඳහන් කුර්ආන් වැකිය තහවුරු කරයි.

* පසුව ඒ දිනයේ දී (ලෝකයේ භුක්ති වින්ද සියලු) වරප්‍රසාදයන් ගැනත් ඇත්ත වශයෙන්ම ඔබලා ප්‍රශ්න කරනු ලබයි. (102:08)

* කාන්තාවන්, පිරිමි දරුවන්, රන් රිදී වලින් රැස්කෙරුණු ලැබූ විශාල ධන සම්භාර, සළකුණු යෙදූ අශ්වයන් (එළුවන්, හරකුන්, ඔටුවන් ආදිය) සතුන්, ගොවිතැන යනාදී (මනස) ආකර්ශනය කරනු ලැබූ දේවල් ප්‍රිය කිරීම, මිනිසාට අලංකාර කර ඇත. මේවා (සියල්ල අස්ථිර වූ) මෙලෝ ජීවිතයේ (අල්ප වූ) සැප වේ. අල්ලාහ් ඔහු වෙත (ස්ථිර වූ) අලංකෘත ආපසු යන ස්ථානයක් ඇත. (3:14)

## ළමුන්, වැඩිහිටියන්, විද්වතුන් (උලමාවරුන්), ගුරු භවතුන් කෙරෙහි ආදරය පෙන්වීමත්, ගෞරවය දැක්වීමත්

යම් සමාජයක් බොහෝ කොටස්වලින් යුක්තය. කුඩා දරුවන්, වැඩිහිටියන්, විද්වතුන් (උලමාවරුන්) ගුරුභවතුන් යනාදී නොයෙක් කණ්ඩායම් සමාජයක ක්‍රියාකාරී වැදගත් අය වෙති. මොවුන් සියල්ලන්ම තම කොටස නිසි ලෙසත්, කාර්යක්ෂමවත් ඉටු කර සමාජගත විය යුතු බව අධ්‍යාපනඥයන්ගේ බලාපොරොත්තු වේ.

කුඩා දරුවන් කෙරෙහි ආදරය දැක්වීම, වැඩිහිටියන්ට ගෞරව කිරීම, උලමාවරුන්ට ගෞරව කිරීම යනාදිය මුස්ලිම් සමාජ ජීවිතයට අත්‍යවශ්‍ය සාරධර්ම වශයෙන් පවතී. ආදරය දැක්විය යුතු අයගෙන් දෙමව්පියන් ප්‍රථම ස්ථානයක් ගනියි. මෙය පැහැදිලි කරන අල්කුර්ආන් වාක්‍ය පහත සඳහන් පරිදි වේ :

* "අල්ලාහ්ට පමණක් නමදින්න. ඔහුට කිසිවක් ආදේශ නොකරන්න. දෙමව්පියන්ට ස්තුතිවන්ත වන්න." (4:36)

* "තම මව්පියන්ට (ස්තුතිවන්ත වන ලෙස) මිනිසාට අප යහපත් උපදෙස් ලබා දුන්නෙමු. ඔහුගේ මව දුක පිට දුක විඳිමින් (ගර්භයේ) ඔහුව දරා ගත්තාය." (31:14)

* නබිතුමණි, ඔබ අසන්න, අධ්‍යාපන ඥානය ඇත්තාත්, අධ්‍යාපන ඥානය නැත්තාත් සමාන වේද? (මෙම කුර්ආනය මගින් ) යහ උපදේශය ලබන්නන් සියල්ල (අධ්‍යාපන)ඥානය ඇත්තන්ය. (39:9)

හාරූන් අල් රෂීද් තුමාණන්ගේ රාජ්‍ය පාලන කාලයේ දී එතුමාගේ පුතා මඃමූන්, අබූ මුහම්මද් යන ගුරු භවතාගෙන් ශිල්ප ලැබුවේය. එක් අවස්ථාවකදී ගුරුවරයා ඉගැන්වීමට පැමිණ, මඃමූන්ව කැඳෙව්වේය. එනමුත් ඔහු එතැනට පැමිණියේ නැත. ප්‍රමාද වී ආවේය. මේ නිසා ඔහු කෝපයට පත්වී වේවැලෙන් පහර දුන්නේය. කුඩා මඃමූන් ඇඬීමට පටන් ගත්තේය. මේ අවස්ථාවේ දී මඃමූන්ව බැලීම සඳහා ඇමැතිතුමා පැමිණියේය. මඃමූන් තමා ගැන ඇමතිට පැමිණිලි කරයි දෝ ගුරුභවතා බිය වුනේය.

මඃමූන් ඇමැතිව, දකපු විගහ හැඬීම නවතා ඔහු ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේය. ගුරු භවතා ගැන කිසිවක් පැවසුවේ නැත. ඇමති නැවත හැරී ගියේය.

පසුව ගුරු භවතා, මෑමූන්ව බලා, ඔබ මා ගැන ඇමතිතුමාට පැමිණිලිකරාවි යැයි මා සිතුවා, ඔබ කිසිවක් කිව්වේ නෑ නේ දැයි යනුවෙන් පුදුමයෙන් ඇසුවේය. එයට මෑමූන් මම ඔබ ගැන කිසිවෙකුටත් පැමිණිලි කරන්නේ නැහැ. විනය කියා දීමටයි ඔබ මට ගැහුවේ. මෙහි වැරැදි කිසිවක් නැත. මින් පසු මා විනීතව කටයුතු කරනවා, යනුවෙන් ප්‍රකාශ කළේය.

### ශ්‍රමදාන කටයුතුවල යෙදීම

සමාජ සේවය “ඉබාදතයකි ” යන අර්ථයෙන් පොදු ආයතනවල, කාර්යාලවල අවට පරිසරයත්, අභ්‍යන්තරයත් පිරිසිදු ලෙසත්, පිළිවෙලටත් තබා ගැනීම ඉස්ලාමීය ඉගැන්වීම්වල පැහැදිලි කරයි. එයට අදළ සුදුසු ක්‍රියාමාර්ගයක් වශයෙන් ශ්‍රමදානය සැලකේ. එය කිරීමට සැලසුම් කිරීම, සාකච්ඡා කිරීම, සම්පත්, පිරිස් බලය යනාදිය අවශ්‍ය වේ. මේ අනුව ඉස්ලාම් තහවුරු කරන එකමුතුකම, සහෝදරත්වය යනා දී යහගුණාංග ශ්‍රමදාන ක්‍රියාව දිරිගන්වන අංග වශයෙන් සැලකේ.

ශ්‍රමදාන ක්‍රියාවලිය මගින්, සංවිධානවල, ආයතනවල, අන්තර් සම්බන්ධතාව තහවුරු වේ. මෙමගින් ඉස්ලාම් බලාපොරොත්තු වන සමාජගත කිරීම, ආයතනගත කිරීම යනාදී උසස් ඉලක්කයන් මුස්ලිම් කෙනෙකු ලබා ගනියි.

### අසල්වැසියන්, ඥාතීන් සමග යහ සම්බන්ධතා

මිනිසා අනෙක් අය සමග එකතු වී ජීවත් වන්නෙක් වශයෙන් බොහෝ අය සමග සම්බන්ධතා ඇති කර ගනියි. ඔවුන්ගෙන් අසල්වැසියන්ද ඥාතීන්ද ප්‍රධාන අය වේ. සමාජයීය ආගමක් වන ඉස්ලාම් එවන් අය සමග කෙලෙස කටයුතු කළ යුතු ද යන මග පෙන්වීම් ලබා දෙයි.

අසල්වැසියන් සමග යහපත් අයුරින් කටයුතු කිරීමේ වැදගත්කමත් ඔවුනට හිංසා කිරීමේ බරපතලකමත් පහත සඳහන් නබි (සල්) වාක්‍ය විස්තර කරයි.

“ජිබ්රීල් (අලෛ) අසල්වැසියන් සම්බන්ධයෙන්, ඔවුනට බූදල් උරුමයන් ලබා දෙන ලෙස පවසයි දෝයි සිතන තරමට අඛණ්ඩව උපදෙස් ලබා දෙමින් සිටියේය.” (බුහාරි, මුස්ලිම්)

“කවරෙක් අල්ලාහ් ද, පරලොව දිනය ද, විශ්වාසත් කර සිටින්නේ ද ඔහු අසල්වැසියන්ට ගරු කරත්වා !.” (බුහාරි, මුස්ලිම්)

නබි (සල්) තුමාණන් දිනක් “අල්ලාහ් මත දිව්රා, ඔහු ඊමාන් දැරුවෙකු නොවේ. (තුන්වරක්) යනුවෙන් ප්‍රකාශ කළහ. “ඔහු කවරෙක්ද දේව දූතයාණනි ” යනුවෙන් ඇසූ විට කවරෙකුගේ හිංසාවෙන් ඔහුගේ අසල්වැසියන් ආරක්ෂා නොලබුවේද ඔහුමය.” යනුවෙන් ප්‍රකාශ කළහ. (බුහාරි, මුස්ලිම්)

ඥාතීන් සමග සමීපව කටයුතු කිරීම සම්බන්ධයෙන් ද, ඉස්ලාම් බොහෝ ඉගැන්වීම් ඉදිරිපත් කර ඇත.

දුගියන්ට සදකා කිරීම යනු දානයක්ය. ඥාතීන්ට සදකා කිරීම දානයක් හා ඥාතීන් සමග එකතු වී ජීවත් වීමක් වේ. " (නසාඊ, ඉබ්නු මාජා)

මවගේ සහෝදරියව නබි (සල්) තුමාණන් මවගේ ස්ථානයේ සිටින්නියක් ලෙස ප්‍රකාශ කළහ. (බුහාරි මුස්ලිම්)

* එබැවින් (ඒ) අල්ලාහ්ට ඔබලා බිය වී කටයුතු කරන්න. ඔහුගෙන්ම (ඔබලා අතරේ) එකිනෙකාට (අවශ්‍ය දේ) ලබා ගන්න. තවද අල්ලාහ්ට බිය වී ලේ ඥාතීන් සමග ආදරයෙන් කටයුතු කරන්න. ඇත්ත වශයෙන්ම ඔහු ඔබලාව නිරීක්ෂණය කරමින්ම සිටියි. (අල්කුර්ආන් 4:1)

**ආපදා කළමනාකරණය**

ඉහත සඳහන් සංකල්පය වර්තමාන ජීවන රටාවට එක්වූ බුද්ධිමය අංගයකි. සුනාමි, භූමිකම්පාව, සුළිසුළං, ගංවතුර යනාදි ස්වභාවික ව්‍යසනවලින් ජනතාව අනතුරට පත්වන විට ඔවුන්ව ඉන් මුදවා යථා තත්වයට ගෙන එන ක්‍රියා පිළිවෙත" ආපදා කළමනාකරණය" නම් වේ.

ජනතාව මුදවා ගැනීම ක්‍රියාවලි දෙකක් මගින් සිදු වේ.

(i) උපදේශන සේවා මගින් මුදවා ගැනීම,
(ii) ජීවනෝපා නිවාරණ සේවා මගින් මුදවා ගැනීම.

මනෝ විද්‍යාත්මක උපදේශන වනාහි "සෑම විනාශයකට පසුව සංවර්ධනයක් ඇතිවේ" යන අල්ලාහ්ගේ නිර්ණායකය අතීත කාලයේ සිට අද දක්වා කුර්ආන්, හදීස්, සලෆුස්සාලිහීන් මූලාශ්‍රවලින් ගෙන හැර දක්වා ඇත. ආපදාවට ලක් වූ සිත්සතන්වලට යම් අධ්‍යාත්මික ඔසුවක් වශයෙන් (තර්බිය්යා) උපදේශන මගින් සහනයක් ලබාදීම එක්තරා ධර්මානුකූල වගකීමකි.

දුකෙන් නිදහස් වීමට, ශෝකය නැතිවීමට, භීතියෙන් නිදහස්වීමට, අතුරුවලින් ආරක්ෂාව ලැබීමට, සිත් තැවුල අඩුවීමට, ජීවිතය කෙරෙහි විශ්වාසය ඇති වීමට, සිතේ සැනසිල්ල ලැබීමට, චිත්ත ධෛර්යයන්, ස්ථාවරත්වයත් ලබාගැනීමට, උදේ සවස රසූල් (සල්) තුමාණන් පාරායනා කල තික්ර් හා අව්රාදයන් දරුවන්ට හඳුන්වා දී අධ්‍යාත්මික ආපදාවලින්, ආරක්ෂාව පතා ප්‍රාර්ථනා කිරීමට ළමුන්ට මග පෙන්විය යුතු ය.

1. සූරතුල් බකරාවේ පළමු වාක්‍ය හතර පාරායනා කිරීම (එක වතාවක්),
2. ආයතුල් කුර්සි පාරායනය (එක් වතාවක්),
3. "කුල්" ලෙස ආරම්භවන සූරාවන් පාරායනය (තුන් වතාවක්),
4. නබි (සල්) තුමාණන් කෙරෙහි සලවාත් පාරායනා කිරීම (තුන් වතාවක්).

**ආගන්තුක සත්කාරය**

ආගන්තුක සත්කාරය නබිවරුන්ගේ ගුණාංගයක් වේ. නබි ඉබ්රාහිම් (අලෛ) මෙම ක්ෂේත්‍රයේ ඉතාමත් ආදර්ශමත්ව කටයුතු කළහ. ජාහිලියියා කාල ජනතාව අතරේද ආගන්තුක සත්කාරය යන ගුණාංගය පැවතුණි. නබි (සල්) තුමාණන් මෙය ඊමානිය ගුණාංගයක් වශයෙන් පහත සඳහන් නබි වදන්වලින් දිරිගන්වා ඇත.

"කවරෙක් අල්ලාහ්වත්, පරලොව දිනයත් විශ්වාස කරන්නේ ද ඔහු තම ආගන්තුකයන්ට ගෞරව කළ යුතු ය." (බුහාරි මුස්ලිම්)

"කවරෙක් හෝ සංග්‍රාහයකට කැඳවීම් ලැබූ විට, එයට පිළිතුරු දෙන්න". (මුස්ලිම්)

**ආගන්තුකයන්ට ගෞරව කරන ක්‍රමයන්**

1. සාදරයෙන් පිළිගැනීම.
2. ආදරයෙන් කටයුතු කිරීම.
3. සතුටෙන් කථා බහ කිරීම.
4. නියමිත වේලාවට කෑම් බීම් වලින් සංග්‍රහ කිරීම.
5. ඔවුන් සමගම වාඩි වී ආහාර ගැනීම.
6. ඔවුන් අනුභව කර අවසන් කිරීමට ප්‍රථමයෙන් තමා අවසන් නොකිරීම.
7. ඔවුන් හේතුවෙන් ඇතිවන දුෂ්කරතා ඉවසීම.
8. ගේ දොරකඩ දක්වා ගොස් සමුදීම.

**සංග්‍රහ භුක්ති විඳීමෙන් පසු කරන ප්‍රාර්ථනාව**

අරාබි

"යා අල්ලාහ් ! අපට ආහාර ලබාදුන් තැනැත්තාට ඔබ ද ආහාර ලබාදෙන්න. අපට ජලය පානයට දුන් අයට ඔබ ද ජලය පොවන්න."

අරාබි

යා අල්ලාහ් ! ඔබ මොවුන්ට ලබාදුන් ඒවායෙහි වර්ධනයක් ඇති කරන්න. තව ද මොවුන්ට ක්ෂමාව ලබා දෙන්න. තව ද මොවුනට ආශිර්වාද කරන්න."

**සංග්‍රහයක් වශයෙන් වලීමා**

"වලීමා" යනු විවාහ වූ සතුට වෙනුවෙන් තමාගේත්, තම භාර්යාවගේත් ඥාතීන්ටත්, මිතුරන්ටත් ලබාදෙන සංග්‍රහය වේ. ස්වාමි පුරුෂයාගේ හැකියාව අනුව මෙය ලබා දිය හැකිය. නබි (සල්) තුමාණන් වෙත තමා විවාහ වූ බව පැවසූ සහභාවරයෙකු, දෙස බලා එතුමා "එළුවෙකුගෙන් හෝ වලිමාව සූදානම් කරන්න." යනුවෙන් පැවසූහ.

විවාහය ප්‍රසිද්ධ කිරීමේ එක් මාර්ගයක් ලෙස වලීමා සංග්‍රහය සැලකිය හැකිය. මෙහි සුඛෝපභෝගී බව නාස්තිය, විවිධ ප්‍රසංග යනාදිය නැතිකර පවුලේ සිටින ඥාතීන්, හිත මිතුරන්, අසල්වැසියන්, දුගියන් යනාදි වශයෙන් වෙනස්කමින් තොරව කැඳවීමට ලක් කිරීම පහත සඳහන් නබි වදන තහවුරු කරයි.

“දිළින්දන් ප්‍රතික්ෂේප කිරීමට ලක්කර, ධනවතුන් පමණක් ආරාධනා ලබන වලීමා සංග්‍රහය, සංග්‍රහයන්ගෙන් ඉතාමත් පහත් වූ එකකි. (බුහාරි)

## ආගන්තුක සත්කාරයෙහි “ඉෆ්තාර්” සංග්‍රහය

“ඉෆ්තාර්” යනු උපවාසයෙන් මිදීම සඳහා ආහාරපාන ලබාදෙන සංග්‍රහයයි. මේ පිළිබඳව නබි (සල්) තුමාණන් “කවරෙක් උපවාසකරුවෙකුව උපවාසයෙන් මිදීමට සලස්වන්නේ ද (ඉෆ්තාර් ලබා දෙන්නේ ද) එම උපවාසකරුවාගේ කුසල මෙන් කුසලක් ඔහුට ද තිබේ. එනමුත් ඒ උපවාසකරුවාගේ කුසලයෙහි කිසිදු අඩුවීමක් සිදු නොවේ.” යනුවෙන් සඳහන් කළහ.

කවරෙකුගේ නිවසට ගොස් උපවාසයෙන් මිදෙන්නේ ද ඔවුන් වෙනුවෙන් පහත සඳහන් ප්‍රාර්ථනාව කිරීම නබි (සල්) තුමාගේ පිළිවෙත වේ.
(අරාබි)

“උපවාසකරුවන් ඔබලා වෙත උපවාස මිදෙයි. යහපත් මිනිසුන් ඔබලාගේ ආහාරය අනුභවය කරයි. තව මලාඉකාවරුන් ඔබලා වෙනුවෙන් දුආ කරයි.”

## පොදු ස්ථානවලදී ද ප්‍රවාහනයේ දී සංවර භාවයෙන් හැසිරීම.

ශ්‍රී ලංකාව වැනි බහු වාර්ගික සමාජයක් ජීවත් වන රටවල්වල ඉස්ලාමීය දඃවා ප්‍රචාරයට අදාළ මාර්ගයන්ගෙන් පොදු ස්ථානවල යහගුණාංග පිළිබිඹු කිරීම, සුවිශේෂිව අනෙක් සමාජවල අය ආකර්ශනය කළ හැකි අංගයක් වශයෙන් පවතී. ඒ අනුව පොදු ප්‍රවාහන පහසුකම් යොදා ගනිමින් මුස්ලිම්වරුන් ගමන් බිමන් යාමේ දී මානව දයාවෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මේ ගැන නබි (සල්) තුමාණන් පොදු වූ එක් මග පෙන්වීමක් ලබාදී ඇත. කුසල යනු යහපත් ගුණාංග වේ. අකුසල යනු ඔබගේ සිතට වදදෙන සංවේදී ක්‍රියාවකි. තව ද එම අකුසල ජනතාව දැකීම ඔබ පිළිකුල් කරයි. (බුහාරි මුස්ලිම්)

මේ අනුව පොදු ප්‍රවාහන පහසුකම් වන බස් රථ, දුම්රිය යනාදියේ අප ගමන් කරන විට පහත සඳහන් පිළිවෙත් කෙරෙහි අවධානය යොමුකර කටයුතු කිරීම යහපත් වේ.

1. අනුන් තල්ලු කරගෙන වාහනවල නොනැගීම, පෝලිම් ක්‍රමය අනුගමනය කිරීම.
2. අදාළ ප්‍රවේශ පත්‍රය ලබාගෙන ගමන් කිරීම නිවැරදි පිළිවෙත වේ. නැතහොත් අල්ලාහ් ඉදිරියේ වැරදිකරුවෙකු වන අතරම දඩ මුදලක් ගෙවීමේ තත්ත්වය ද උදාවිය හැක.

3. අසුනක් නොලැබී සිටගෙන ගමන් කරන වයෝවෘද්‍ධයන්, ගැබිණි මව්වරුන්, ආගමික පූජකවරුන්, කුඩා දරුවන් යන අය සඳහා තම අසුන ලබා දී උදව් කිරීම.

4. දෙදෙනෙක් කථාබහ කරමින් ගමන් කරන විටත්, ජංගම දුරකථනයෙන් කථාකරන විටත්, අසල සිටින්නන්ට අපහසුතාවක් නොවන ආකාරයට ක්‍රියා කිරීම.

5. ස්ත්‍රීන් ද, පුරුෂයන් ද මිශ්‍රවී ගමන් කිරීමේ තත්ත්වයක් දකින්නට ලැබෙන හෙයින්, මහ්රම්, අජ්නබි නීතිරීති අවධානයට යොමු කර බැල්ම පහත් කරගැනීම, ස්ත්‍රී පුරුෂයන් වෙන් වෙන් ආසනවල අසුන් ගෙන විනය ගරුක වීම.

   දුම්බීම, කිසිම තැකීමකින් තොරව නිදාගැනීම, උගුර පෑදීම හා කෙළ ගැසීම (බාධාවන ලෙස) යනාදිය ශිෂ්ට නොවන කටයුතුවල යෙදීම හැකි පමණින් වළක්වා ගැනීම.

* “ඔබලා සෑම කෙනෙක්ම වගකීම් දරන්නන් ය. ඔබගේ වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් විභාග කරනු ලබයි.” යනුවෙන් නබි (සල්) පැවසූහ.

* නබි (සල්) පැවසුවා, “ඔබලාට ශාපය අත්වන ස්ථාන කරුණු තුනකට බිය වන්න.

   (i) ජලාශ
   (ii) මාර්ගවල දෙපස
   (iii)සෙවන ගෙන දෙන ගස්”යනුවෙන් ප්‍රකාශ කළහ.

* නබි (සල්) තුමාණන් පැවසූහ. “කවරෙක් බිඃරු රූමා” යන ළිඳ හාරා පිරිසිදු කරන්නේ ද ඔහු ස්වර්ගයට පිවිසෙයි.” යනුවෙන්

* නබි (සල්) තුමාණන් පැවසුවා “මිනිසුන් අතරෙ උසස් පුද්ගලයා මිනිසුන්ට ප්‍රයෝජනවත් තැනැත්තා ය.”

* නබි (සල්) තුමාණන් පැවසූහ. “යහපත් ක්‍රියා සියල්ල දනමය ක්‍රියා වේ.” (බුහාරි)

**මහ්රම් - අජ්නබි සම්බන්ධතාව රැකීම**

ස්ත්‍රීන් සහ පුරුෂයන් නිර්මාණය කළ අල්ලාහු තආලා ඒ දෙදෙනාම කුමන කොන්දේසි මත එකතු විය හැකි ද? කුමන අවස්ථාවන්වලදී සම්බන්ධතා පැවැත්විය නොහැකි ද? යනාදි විනය රීතිමාලාවක් සකස් කර දී ඇත. බැල්ම පහත හෙලීම, අන්‍ය ස්ත්‍රීන් සමග තනිව සල්ලාපයේ නොයෙදීම, පතිවත ආරක්ෂා කිරීම යනාදි ක්‍රමවේදයන් මගින් මහ්රම්,

අජ්නබි - සම්බන්ධතාව ඉස්ලාමීය නීතිය හඳුන්වා දෙයි. “මහ්රම්” යන වචනය විවාහ වීමට තහනම් කරනු ලැබූ ස්ත්‍රීන් ද අජ්නබි යන පදය විවාහ කිරීමට අනුමත කළ ස්ත්‍රීන් ද අර්ථවත් කරන වචනයන් ය.

“නබිතුමණි ! විශ්වාසවන්තයින් වූ පුරුෂයන්ට ඔබ පවසන්න. ඔවුන් තම බැල්ම පහත් කර ගත යුතු ය. ඔවුන් තම පතිවත ද ආරක්ෂා කළ යුතු ය. මෙය ඔවුන් පාරිශුද්ධ කරයි. ඇත්ත වශයෙන්ම අල්ලාහ් ඔවුන් කරන දේවල් හොඳින් දැන ගනියි. (අල්කුර්ආන් 24:30)

ඉහත සඳහන් කුර්ආන් වාක්‍යය සමාජ ජීවිතයේ දී ස්ත්‍රීන් ද, පුරුෂයන් ද පාලනයකින් යුතුව සම්බන්ධතාව ගොඩනගා ගැනීමක් කළ යුතු බව අවධාරණය කරයි. “මහ්රම්” “අජ්නබි” යන නීති පිළිවෙත විවාහයේ දී පමණක්ම නොව, දෛනික ජීවිතයේ දී අනුගමනය කළ යුතු ය.

# ඇමුණුම

## අරාබි පාරිභාෂික වදන්

| | | |
|---|---|---|
| 1. | අල්හුලුක් | සංස්කෘතිය |
| 2. | අල් අඃලක් | සංස්කෘති |
| 3. | හුලුක් හසන් | අලංකාර සංස්කෘතිය |
| 4. | අල් අල්හාකුල් හසනාත් | අලංකාර වූ සංස්කෘති |
| 5. | මකාරිමුල් අඛ්ලාක් | යහපත් සංස්කෘතිය |
| 6. | අල් අදබු | විනය |
| 7. | අල් අදාබ් | විනයන් |
| 8. | අල් අකීදා | විශ්වාස පිළිබඳ මූලධර්මය |
| 9. | අල් අකාඉද් | විශ්වාස පිළිබඳ මූලධර්මයන් |
| 10. | අල් ඉබාදත් | නැමදුම් පිළිවෙත් |
| 11. | අල් මුආමලාත් | ගනුදෙනු |
| 12. | අල් මුනාකහාත් | විවාහය හා දික්කසාදය සම්බන්ධ නීතිරීති |
| 13. | අල් ජිනායාත් | අපරාධ පිළිබඳ නීතිරීති |
| 14. | අල් ඉඃලාස් | චිත්ත පාරිශුද්ධිය |
| 15. | අර්රියාඋ | මූණිච්චාව |